වාර්ෂික වාර්තාව

2016

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

(ශ්‍රී.ල.වි.ස.නි.කොා.ස)

වාර්ෂික වාර්තාව

2016

අතිගරු ජනාධිපතිතුමාගේ පණිවුඩය

ලොව පුරා විදුලි සංදේශ ක්ෂේත්‍රය මෑත කාලීනව අසමසම වේගයකින් වෙනස් වී ඇති අතර එය ලෝකය විශ්ව ගම්මානයක් බවට පරිවර්තනය වීමට ඉවහල් වේ. ගෝලීය ප්‍රවණතා පිළිබඳව අවධානය යොමු කිරීමේදී , පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තයේ ඇතිවූ ඉමහත් වර්ධනය සහ පරිවර්තනය මීට සාක්ෂියකි. අපගේ සංස්කෘතියට , සමාජයට මෙන්ම අපගේ ජීවන රටාවට සහ කාර්යයන් වලට මෙමගින් ඇතිවන බලපෑම සුවිශාලය. ශ්‍රී ලංකාවේ හිතකර සහ ශක්තිමත් විදුලි සංදේශ කර්මාන්තයක් ඇතිකිරීමටත් එමගින් සියළුම පරිහරණය කරන්නන් සඳහා විදුලි සංදේශ විප්ලවයේ ප්‍රතිලාභ අත්විඳීමට සැලැසීමෙහිලාත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) ඉතා උදෝගී කාර්ය භාරයක් ඉටු කරමින් සිටින බව සඳහන් කරන්නේ ඉමහත් සතුටිනි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාවට අනුව , කොමිෂන් සභාව නව තාක්ෂණයේ ඇතිවූ ප්‍රවර්ධනයන්වල ප්‍රතිඵලයක් වශයෙන් සිය සේවා ප්‍රවර්ධනය කිරීමෙහිලා ප්‍රගතිශීලී පියවර රැසක් ගෙන තිබෙන බව පැහැදිලිය. පසුගිය වසර කිහිපය පුරා විදුලි සංදේශ කර්මාන්තයේ ස්ථාවර වර්ධනයක් දක්නට ලැබෙන අතර මෙම ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ ඉහළ සහභාගීත්වය මගින් පෙනී යන්නේ විදුලි සංදේශ ක්ෂේත්‍රය කෙරෙහි ආයෝජකයින් සැලකිය යුතු උනන්දුවක් දක්වන බවයි. මෙම සමාලෝචන වර්ෂය තුළ කොමිෂන් සභාව, දුරකථන භාවිතය සහ ඒ ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ විෂමාචාර තුරන් කිරීම සඳහා මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් දියත් කර ඇත. මෙය වර්තමානයේදී වැඩි අවධානයට ලක්වන කරුණක් වන අතර කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් දක්වන සැලකිල්ල කාලෝචිත හා මනා ප්‍රශංසනීය වේ.

මෙහෙයුම් සහ ව්‍යාපාරික අරමුණු සඳහා උපකරණ ආනයනය කිරීම පිණිස විවිධ බලපත්‍ර වර්ග නිකුත් කිරීමේදී ගුණාත්මකභාවය, නව තාක්ෂණය, නවෝත්පාදන, යෝග්‍යතාවය, අදාලත්වය සහ මිල නිසැක කිරීම පිණිස කොමිෂන් සභාව පියවර ගෙන ඇති බව මා සඳහන් කරමි. පාරිභෝගිකයාට ගුණාත්මක සේවාවක් නිසැක කිරීමට සහ ව්‍යාපාරික මෙහෙයුම් ඉහළ ප්‍රමිතියකින් යුතුව පවත්වාගෙන යාමට මෙය ඉවහල් වේ. තොරතුරු තාක්ෂණ දැනුම අවශ්‍ය වන විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්ට, පාසල් ශිෂ්‍යයින්ට, කාන්තාවන්ට, ගැහැණු ළමයින්ට සිය ජීවිතයේදී සහ එදිනෙදා වැඩවලදී අවශ්‍ය තොරතුරු තාක්ෂණ දැනුම සැපයීම සහ එම දැනුම ලබාදීමට උපකාර කිරීම සිය සමාජයීය වගකීමේ කොටසක්

වශයෙන් සලකා කොමිෂන් සභාව විසින් ප්‍රයෝජනවත් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබේ. අදාල ජාත්‍යන්තර සංවිධාන සහ සංවර්ධිත රටවල් සමඟ තොරතුරු තාක්ෂණය ආශ්‍රිත විවිධ වැඩසටහන් වලට ක්‍රියාකාරීව සහභාගී වීම සහ මෙරටට විදුලි සංදේශ ප්‍රවර්ධනයන් හඳුන්වා දීම කොමිෂන් සභාව විසින් සිදුකරන බව අවධාරණය කිරීමට කැමැත්තෙමි. කොමිෂන් සභාව විසින් මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් දැනටමත් ඉටු කර ඇති කාර්යභාරය විශිෂ්ටය.

කොමිෂන් සභාව විදුලි සංදේශ නියාමනය ආශ්‍රිත කරුණු සම්පාදනය කරන අතරම වාර්ෂිකව රජයේ ඒකාබද්ධ අරමුදලට සැලකිය යුතු මුදල් ප්‍රමාණයකින් දායක වෙමින් මෙරටේ ආර්ථිකයට සහාය වී ඇත. 2016 වර්ෂයේදී පමණක් , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර ඇති මුදල රුපියල් මිලියන 48,816 කි.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ කර්මාන්තය ව්‍යාප්ත කිරීමෙහිලා දායකවීම පමණක් නොව , මෙම ක්ෂේත්‍රයෙහි අපගේ තරුණයින් විශාල සංඛ්‍යාවකට රැකියා ලබා ගැනීමට නව අවස්ථා උදා කර දී ඇත. මෙම ක්ෂේත්‍රයෙහි පෞද්ගලික සහ රාජ්‍ය අංශය විසින් ඉටු කරන ක්‍රියාකාරී සහ උද්‍යෝගී කාර්ය භාරයේ කොටසක් වශයෙන් මෙය සිදු කිරීමට හැකිවී ඇත. නව තාක්ෂණයේ ප්‍රතිලාභ යොදා ගනිමින් පෞද්ගලික අංශයේ සහභාගීත්වය ඇතිව ඉදිරියේදී විදුලි සංදේශ ක්ෂේත්‍රය වැඩිදියුණු කිරීමෙහිලා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව දක්වන පරිශ්‍රමයට සහාය වනු පිණිස අපගේ රජය පූර්ණ ලෙස කැපවෙන බව සඳහන් කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි.

අවසාන වශයෙන් , 2016 වර්ෂයේදී කොමිෂන් සභාව විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳව මාගේ ප්‍රශංසාව පළ කරමි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කැපවීමෙන් ක්‍රියා කරන කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව මහජනතාවට ඉහල ගුණාත්මක විදුලි සංදේශ සේවාවක් සැපයීම සහ විදුලි සංදේශ කර්මාන්තයේ සියළුම පැතිකඩවල විශිෂ්ටතාවය සාක්ෂාත් කිරීමේ අදහසින් පසුගිය වසර කිහිපය තුළ උත්පාදනය කරන ලද සංවර්ධන ගමාතාවය පවත්වාගෙන යාමට අඛණ්ඩව කටයුතු කරනු ඇති බව මාගේ අපේක්ෂාවයි.

මෛත්‍රීපාල සිරිසේන
ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති

සභාපතිගේ පණිවුඩය

අද, තාක්ෂණික ලොව තුළ විදුලි සංදේශ ක්ෂේත්‍රය අනෙකුත් සියළුම තාක්ෂණයන්ට වඩා සංවර්ධනයේ අද්විතීය මට්ටමකට ළඟා වී තිබේ. එය ඕනෑම කර්මාන්තයක, ආර්ථිකයක සහ ප්‍රජාවක අත්‍යාවශ්‍යය අංගයකි. අද ලෝකය විදුලි සංදේශනයෙන් තොරව ගමන් නොකරයි. නවීන තාක්ෂණය සහ නව නිපැයුම් වෙනත් ක්ෂේත්‍රයන්ට වඩා ඉක්මණින් සිදුවෙමින් පවතින නිසා ලෝකය මෙතරම් වේගයෙන් වෙනස් වේ. රටක ආර්ථිකයට මෙන්ම එහි සියළුම අංශවල සංවර්ධනයට විදුලි සංදේශනය ඉතා වැදගත් වන බැවින් ලොව ඕනෑම රටක් වර්තමානයේ දී ඒ කෙරෙහි ප්‍රමුඛතාවය ලබා දෙයි. මෙම කාරණයේ වැදගත්කම මුළුමනින් ම වටහාගත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) අවශ්‍ය විධිවිධාන සහිතව ශක්තිමත් කර ඇති අතර එහි සියළුම අංශවල කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසා ඇත. 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාවට ශ්‍රී ලංකාවේ සියළුම නියාමන කරුණු පිළිබඳ නීති රෙගුලාසිවල නීතිමය බලධාරියා ලෙස කටයුතු කිරීමට බලය ලබා දී ඇත.

අධ්‍යක්ෂ ජනරාල් තුමා විසින් සිය සමාලෝචනයේ සහ එහි දක්වා ඇති වගු සහ ප්‍රස්ථාර වලින් විස්තර කර ඇති පරිදි 2016 වර්ෂයේ දී කොමිෂන් සභාව සිය කාර්යයන්වල සියළුම විෂයය පැතිකඩ සම්බන්ධයෙන් සාර්ථක වී ඇති ඇත. අදාල කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විශිෂ්ඨ වූ ත් සැලකිය යුතු වූ ත් ක්‍රියාකාරකම් කීපයක් සිදු කර ඇති බව සඳහන් කිරීම වැදගත්ය. විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම අදාල පාර්ශවයන්ගේ පැමිණිලි වලට මුළුමනින් ම ප්‍රතිචාර දැක්වීමක් විය. ගුවන් විදුලි සංඛ්‍යාත නිකුත් කිරීම අවභිරතාවයන්ට සහ නීතිමය ක්‍රියාමාර්ග වලට ප්‍රතිචාරීව සිදු කරන ලදී. නීති අංශය විසින් නීති රාමුව යාවත් කාලීන කිරීම පිණිස නව ප්‍රවර්ධනයන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී. ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාධනීය ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කර ඇති අතර රාජ්‍ය නිලධාරීන් මෙන් ම විශේෂ අවශ්‍යතා සහිත ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. එමෙන්ම, වැඩසටහන් කිහිපයක් විදේශීය ප්‍රවීනයන් සහ ස්වේච්ඡාදායකයින්ගේ සහයෝගීත්වයෙන් පවත්වන ලදී. මෙරටේ කෘෂිකර්මාන්තය සඳහා ‘‘e කෘෂිකාර්මික ක්‍රමෝපාය’’ සකස් කිරීම අත්‍යාවශ්‍ය වූ නිර්නායකයකි.

2016 වර්ෂය තුළ දී , දුරකථන ක්‍රියාකාර සමාගම් අතර පැවති දැඩි තරඟකාරිත්වය කලාපයේ සෙසු රටවල් වලට වඩා මිල මට්ටම අඩු කිරීමට හේතු විය. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ සිදු වූ වෙනස්කම් නිසා කිසියම් බාධාවන්ගෙන් තොරව සේවා පවත්වාගෙන යාම පිණිස අය බදු , බදු , සෙස් බදු වෙනස් කළ යුතුව තිබිණි. පසුගිය වර්ෂය හා සන්සන්දනය කිරීමේ දී 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම සියයට 16 කින් වර්ධනය වූ අතර බදු වලින් පසුව ලාභය සියයට 15 කින් වැඩි විය.

තොරතුරු තාක්ෂණයෙන් සංවර්ධිත ලොව සමඟ සම කිරීම පිණිස 2016 වර්ෂයේදී කොමිෂන් සභාව පෞද්ගලික අංශයේ ක්‍රියාකාරී සහභාගීත්වය ඇතිව වඩා ඵලදායී ක්‍රියාකාරකම් රැසක් ඉටු කිරීමෙහි ලා නිරත වී ඇත. මෙම ප්‍රයත්නයේදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා , කළමණාකාරිත්වය සහ සහායක කාර්ය මණ්ඩලය විසින් ලබාදුන් සේවය ප්‍රශංසනීය ය.

සභාපති
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

පටුන

01 පරිච්ඡේදය 1

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කොා.ස) ආරම්භය, දර්ශනය, මෙහෙවර, අරමුණු සහ වගකීම්

02 පරිච්ඡේදය 7

2016 වසරේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ සංයුතිය

03 පරිච්ඡේදය 9

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව - TRCSL) අධ්‍යක්ෂ ජනරාල් විසින් 2016 වර්ෂයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

04 පරිච්ඡේදය 18

2016 වර්ෂය සඳහා අංශ අනුව කාර්යසාධන වාර්තාව

05 පරිච්ඡේදය 56

අභ්‍යන්තර විගණන කාර්යසාධනය සහ විගණන කමිටු වාර්තා

06 පරිච්ඡේදය 64

විගණනය කළ මුල්‍ය ප්‍රකාශනය

07 පරිච්ඡේදය 91

විගණකාධිපතිගේ වාර්තාව

කෙටි යෙදුම් ලැයිස්තුව

APT	Asia Pacific Telecommunity ආසියා ශාන්තිකර විදුලි සංදේශ ප්‍රජාව
ARPU	Average Revenue per User පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය
ASMS	Antenna Structure Management System ඇන්ටනා ව්‍යුහ කළමණාකරන පද්ධතිය
BOI	Board of Investment ආයෝජන මණ්ඩලය
CERT	Computer Emergency Readiness Team පරිගණක ආපදා සූදානම් කිරීමේ කණ්ඩායම
CID	Criminal Investigation Department අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව
CSR	Corporate Social Responsibility ආයතනික සමාජ වගකීම්
CTO	Commonwealth Telecommunication Organization පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය
CWG	Council Working Group සංගම් කාර්ය කණ්ඩායම
DOA	Department of Agriculture කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
DTH	Direct To Home සෘජු ගෘහස්ථ
FAO	Food and Agriculture Organization ආහාර හා කෘෂිකර්ම සංවිධානය
GCI	Global Cyber Security Index ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය
GMDSS	Global maritime Distress Safety System ගෝලීය සමුද්‍ර ආපදා ආරක්ෂණ පද්ධතිය
HFDF	High Frequency Direction Finding අධි සංඛ්‍යාත දිශා නිශ්චය කිරීම
ICT	Information and Telecommunications Technology තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය
ICTA	Information and Communication Technology Agency තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය
IT	Information Technology තොරතුරු තාක්ෂණය
ITU	International Telecommunication Union ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය
JICA	Japanese International Cooperation Agency ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව නියෝජිතායතනය
LT	Lotus Tower නෙළුම් කුලුන

MFR	Master Frequency Register ප්‍රධාන සංඛ්‍යාත රෙජිස්ට්‍රරය
MOA	Ministry of Agriculture කෘෂිකර්ම අමාත්‍යාංශය
NIA	National Information Agency ජාතික තොරතුරු නියෝජිතායතනය
OLAC	Outgoing Local Access Charges පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු
OTT	Over The Top විදුලි සංදේශ සේවා සැපයුම්කාර සමාගම් විසින් අන්තර්ජාල සම්මුති ජාලයක් ඔස්සේ සේවා සැපයීම
PILD	Policy International Relation and License Division ප්‍රතිපත්ති ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර අංශය
PPP	Private Public Partnership පෞද්ගලික රාජ්‍ය හවුල්කාරිත්වය
PSTN	Public Switching Telephone Network පොදු ස්විචීකරණ දුරකථන ජාල
RTE	Radio Terminal Equipment ගුවන් විදුලි පර්යන්ත උපකරණ
SAARC	South Asian Association for Regional Co-opration ප්‍රාදේශීය සහයෝගීත්වය පිළිබඳ දකුණු ආසියානු සංගමය
SAFIR	South Asian Forum for Infrastructure Regulation යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව
TL	Telecommunication Levy විදුලි සංදේශ බදු
TDC	Telecommunication Development Charges විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව
TRCSL	Telecommunications Regulatory Commission of SrI Lanka ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
TSO	Telecommunications System Operators විදුලි සංදේශ පද්ධති ක්‍රියාකරුවන්
VTC	Vocational Training Centers වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන
WTISD	World Telecommunication and Information Society Day ලෝක විදුලි සංදේශ සහ තොරතුරු සමාජ දිනය

වගු

03.01 ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පරිහරණය කරන්නන්ගේ වර්ධනය 2015-2016 10
03.02 නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව 2015-2016 11
03.03 මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රගතිය – 2016 12
03.04 ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2015-2016..... 15
03.05 ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු ආයෝජන 2015-2016 15
03.06 2015 -2016 කාලපරිච්ඡේද සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයින්ගේ සංඛ්‍යාව 15
03.07 2015-2016 කාලපරිච්ඡේද සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණ්‍ය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (ARPU) 16
03.08 බදු වලින් පසුව ශුද්ධ ලාභය / (පාඩුව) 2015-2016 - (රුපියල් මිලියන වලින්) 16
04. 01 2015-2016 සඳහා ජාල අංශය ආශ්‍රිත සංඛ්‍යා ලේඛන 20
04.02 2016 වර්ෂයේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක 20
04.03 වෙන් කරන ලද සංඛ්‍යාත සංඛ්‍යාව, 2015-2016 22
04.04 සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 2015-2016 23
04.05 2016 වර්ෂයේදී ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන සංඛ්‍යාව 23
04.06 සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කරන බවට හඳුනාගත් භාවිතා කරන්නන් සංඛ්‍යාව සහ ගනු ලැබූ නිවාරණ ක්‍රියාමාර්ග, 2015 -2016 23
04.05 2015 දී නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව 24
04.08 අනුකූලතා අංශයේ ප්‍රගතිය - 2016 27
04.09 2016 වර්ෂය සඳහා වාර්ෂික සාමාජිකත්ව දායක මුදල් ගෙවීම 35
04.10 කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීමේ ප්‍රගතිය 37
04.11 ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2011-2016..... 40
04.12 2011-2016 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයින්ගේ සංඛ්‍යාව 41
04.13 2011-2016 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍ය (ARPU)..... 41
04.14 බදු වලින් පසුව ශුද්ධ ලාභය / (පාඩුව) (2011-2016) 42
04.15 ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරුවන්ගේ ආයෝජන 2011-2016 42
04.16 විදුලි සංදේශ බදු 2012-2016 43
04.17 සෙස් බදු 2012-2016 43
04.18 රැස් කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) – 2014-2016 43
04.19 රැස් කරන ලද පිටතට යන දේශීය ප්‍රවේශ ඇමතුම් ගාස්තු බදු (2014- 2016) 44
04.20 පාදස්ථ මිල සංශෝධනය කිරීම 45
04.21 විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන් - 2016 46
04.22 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම 2014 – 2016 52
04.23 ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ 54

ප්‍රස්ථාර

04.01 මුළු කර්මාන්ත ආදායම 40
04.02 ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2011-2016 41
04.03 බදු වලින් පසුව ශුද්ධ ලාභය / පාඩුව 2011-2016 42
04.04 රැස් කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තු 44
04.05 රැස් කරන ලද පිටතට යන දේශීය ප්‍රවේශ ඇමතුම් ගාස්තු බදු 44
04.06 විදුලි සංදේශ බදු රුපියල් මිලියන වලින්, 2014-2016 52
04.07 ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු 53
04.08 ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම (2014 - 2016) 54

01 පරිච්ඡේදය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කොා.ස) ආරම්භය, දර්ශනය, මෙහෙවර, අරමුණු සහ වගකීම්

ආරම්භය

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත මගින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ බලතල ප්‍රකාරව නීත්‍යානුකූල බලධාරියා වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) මෙරටේ සියළුම විදුලි සංදේශ කරුණු සම්බන්ධයෙන් වගකිවයුතු රාජ්‍ය ආයතනය වේ. ඒ අනුව පාරිභෝගිකයින්ගේ සහ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල යහපත නිසැක කරමින් මෙරටේ විදුලි සංදේශ සේවා වැඩිදියුණු කිරීමට පනත මගින් බලය පවරා ඇත.

කොමිෂන් සභාව සහ කොමිෂන් සභා රැස්වීම්

කොමිෂන් සභාව වර්තමානයේදී කොමිෂන් සභා සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත වේ. ජනාධිපති ලේකම්වරයා නිල බලයෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා වේ. එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා, ප්‍රධාන විධායක නිලධාරියා වන අතර කොමිෂන් සභා සාමාජිකයෙකුද වේ. සෙසු සාමාජිකයින් තිදෙනා පිළිවෙලින් නීති, කළමණාකරන, මූල්‍ය ක්ෂේත්‍රවල විශිෂ්ඨතාවක් ලබා ඇත්තාවූ තැනැත්තන් වේ.

2016 වර්ෂයේදී කොමිෂන් සභාව කොමිෂන් සභාවේ අයවැය සම්බන්ධ පරිපාලනමය කරුණු සහ කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාව වෙනුවෙන් සත්කාරකත්වය දක්වන ජාත්‍යන්තර නියාමන සම්මන්ත්‍රණ වෙනුවෙන් සත්කාරකත්වය දැක්වීම ඇතුළු නියාමන කරුණු ආශ්‍රිත තීරණ සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් ගණනාවක් පවත්වා ඇත. අනුරූපී වර්ෂය තුළ කොමිෂන් සභාව පෞද්ගලික අංශයේ සහාය ඇතිව විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සම්බන්ධයෙන් වැදගත් තීරණ රැසක් ගෙන ඇත. මෙම අවස්ථාවලදී කොමිෂන් සභාවට අවශ්‍ය තීරණ ගැනීමට සහ ඉල්ලීම්වල යෝග්‍යතාවය පදනම් කරගෙන අවශ්‍ය අනුමැතිය ලබාදීමට හැකි විය.

දර්ශනය

විද්‍යාත්මක හා නියාමන විශිෂ්ටතාව මගින් දියුණුවෙමින් ඉදිරියට යන විදුලි සංදේශ කර්මාන්තයේ විශ්වීය නියාමකයකු වශයෙන් පිළිගැනීමට ලක්වීම.

මෙහෙවර

කුසලතාවයෙන් පිරිපුන් සදාචාර සම්පන්න ශ්‍රම බලකායක් මගින් තරඟකාරී වෙළඳපලෙහි සාධාරණත්වය හා යුක්තිය ප්‍රවර්ධනය කිරීමෙන් පිළිගත හැකි ගුණාත්මක බවකින් හා දැරිය හැකි මිලකින් යුක්ත සේවාවක් දීප ව්‍යාප්තව කලට වේලාවට ලබාදීමට වග බලා ගැනීම.

මෙහෙවර ප්‍රකාශනය අර්ථ නිරූපනය කිරීම

ශ්‍රී ලංකාවේ දිගු කාලීන සන්නිවේදන අවශ්‍යතාවයන් සපුරාලීම සහතික කරනු වස් සාධාරණත්වය , තරහකාරිත්වය සහ ආයෝජන දිරිගන්වන නියාමන පරිසරයන් නිර්මාණය කිරීම උදෙසා සියළුම පාර්ශවකරුවන් සමඟ ස්වාධීන, විවෘත සහ පාරදෘශ්‍ය ආකාරයෙන් ක්‍රියා කිරීම තුලින් සියළුම පරිහරණය කරන්නන්ට සාධාරණ, යුක්තිසහගත සහ දැරිය හැකි මිල ගනන් යටතේ වැඩිදියුණු සහ ගුණාත්මක බවෙන් ඉහළ සන්නිවේදන තාක්ෂණ සේවා සැපයිය හැකි බව සහතික කිරීම.

අරමුණු

විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් සාක්ෂාත් කළ යුතු අරමුණු පහත දැක්වේ.

1. ජාතික අභිවෘද්ධියට හේතු වන හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, දුරකථන නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා සහ ග්‍රාමීය සේවා වැනි සේවාවන්වල අවශ්‍යතාවය සපුරාලමින් ශ්‍රී ලංකාව තුළ දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සාධාරණව හා කාර්යක්ෂමව සැපයීමට වගබලා ගැනීම.
2. සෑම ක්‍රියාකරුවෙකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමණාකරන සම්පත් ඇති බවට සහ ඔවුන් විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.
3. අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් මෙන්ම විදුලි සංදේශ උපකරණවල තත්ත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයින්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චිකරන්නන්ගේ සම්බන්ධතාවන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.
4. විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරහකාරිත්වයක් පවත්වාගෙනයාම සහ ප්‍රවර්ධනය කිරීම මෙන්ම ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාව සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.
5. අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳව සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.
6. අනවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන් හෝ අවහිරතාවයන්ගෙන් තොරව විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමේ තම වගකීම ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.
7. විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම වැඩි දියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.
8. ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චිකරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටුවීම පිණිස දිරි ගැන්වීම.
9. ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම්

රජයේ ප්‍රධාන ආයතනයක් වන ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ ජාතික නියාමන නියෝජිතායතනය වේ. කොමිෂන් සභාවේ ප්‍රධාන අරමුණ වන්නේ නියාමන ක්‍රියාවලිය ස්ථායී ලෙස ශක්තිමත් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම මගින් විදුලි සංදේශ කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, මහජන යහපත ආරක්ෂා කිරීම සහ වර්ධනය වන තරහකාරී වෙළඳපලේ උද්ගත වන අභියෝග වලට මුහුණ දීමයි. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ සේවා නොසපයන නමුත් කාර්යක්ෂමව හා ක්‍රමවත්ව විදුලි සංදේශ සේවා සැපයීමෙහිලා විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් දිරිගන්වයි. එමෙන්ම ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල පහසුකම් විශ්වීය මට්ටමට වැඩිදියුණු කිරීම පිණිස සියළුම විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට සහාය වේ. කොමිෂන් සභාවේ ප්‍රධාන වගකීම් පහත දැක්වේ.

1. පනතේ විධිවිධාන බලාත්මක කිරීම සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රයේ කොන්දේසි තරයේ පිළිපැදීම.
2. බලපත්‍රලාභී ක්‍රියාකරුවන් අතර නිදහස් සහ සාධාරණ තරහකාරිත්වයක් පවත්වා ගැනීමට දිරි ගැන්වීම.
    - දුරකථන ක්‍රියාකාර සමාගම් මහජන යහපත සලසන්නේද යන්න නිශ්චය කිරීම සහ අපක්ෂපාතී ලෙස හිතකර ක්‍රියාවන්හී නිරතවීම සඳහා තරහකාරිත්වය පිරික්සීම.
    - ජාල හා සේවා අතර අන්තර් සම්බන්ධතාවය ඇති කිරීමට වග බලා ගැනීම.
    - විවෘත ප්‍රවේශය, අවහිරතා නැති කිරීම සහ විනිවිද පෙනෙන බලපත්‍ර ක්‍රියාවලියක් ඇති කිරීමට හැකි වන පරිදි පොදු නීති රාමුවක් සකස් කිරීම.
3. මිල

   පොදු මහජනතාවට දුරකථන ක්‍රියාකාර සමාගම්වල මිල දරාගත හැකිද යන්න බව සැලකිල්ලට ගෙන සාධාරණ මිල සහතික කිරීම.
4. පාරිභෝගික ආරක්ෂාව

   මහජනතාව සහ පාරිභෝගිකයන් විසින් ඉදිරිපත් කරන පැමිණිළි පිළිබඳව විමර්ශන පැවැත්වීමේදී සවන් දීමට ඇති කැමැත්ත, සන්නිවේදනය සහ මහජන සහභාගීත්වය දිරිගැන්වීම සහ මහජන සුරක්ෂිතතාවය ඇති කිරීම.
5. සමාජ නියාමනය
    i. විශ්වීය ප්‍රවේශය / සේවා
    ii. ග්‍රාමීය ප්‍රජාව, වැඩිහිටි ජනතාව සහ විවිධ අවශ්‍යතා සහිත පුද්ගලයන්ට විශ්වීය ප්‍රවේශ / සේවා සැපයීමට වග බලා ගැනීම.
    iii. හදිසි අවස්ථාවකදී ක්‍රියා කිරීම සඳහා පූර්ව සූදානමින් සිටීම.
    iv. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයින්ට විදුලි සංදේශ සේවා සැපයීම.

6. අඩු පහසුකම් සහ සීමිත සම්පත් නියාමනය කිරීම
    i. වර්ණාවලි කළමණාකරනය (Spectrum Management)
    ii. අංකනය (Numbering)
    iii. නීත්‍යානුකූල අවසරය ලබාදීම(Right of Way)
    iv. අවකාශ පරාස(Space Segment)
    v. අන්තර් සම්බන්ධතාවය(Interconnection)
    vi. ජාත්‍යන්තර සම්බන්ධතා මධ්‍යස්ථාන වලට ප්‍රවේශවීම(Access to International Landing Stations)
    vii. ප්‍රධාන ජාතික ජාල වලට ප්‍රවේශවීම (Access to Backbone)
7. ගුණාත්මක විදුලි සංදේශ සේවා

   පාරිභෝගිකයා සෑහීමකට පත්වන ආකාරයෙන් අවශ්‍යතාවයන් සපුරාලන ලෙස සාධාරණ හා දරාගත හැකි පරිදි ඉහළ ගුණාත්මක භාවයකින් යුතුව විදුලි සංදේශ සේවා සැපයීමට වගබලා ගැනීම.
8. යහපාලනය ප්‍රවර්ධනය කිරීම

   ස්වාභාවික යුක්තියේ මූලධර්ම පිලිපදිමින් කාලෝචිත තීරණ ලබාදීම, මහජන සහභාගිත්වය දිරිගැන්වීම හා විනිවිද පෙනෙන තීරණ ක්‍රියාවලියක් ඇති කිරීමට වග බලා ගැනීම.
9. සාධාරණ සහ ඒකපාර්ශවීය නොවූ තීරණ ලබාදීමට වග බලා ගැනීම.
10. සිවිල් සමාජය නවීන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයෙන් හෙබි දැනුවත් සමාජයක් බවට ගොඩනැංවීමට සහායවීම.
11. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ අදාල ජාත්‍යන්තර සංවිධාන විසින් විදුලි සංදේශ උපකරණ සහ තාක්ෂණික ප්‍රමිතීන් සම්බන්ධයෙන් පනවන නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට සියළුම විදුලි සංදේශ ක්‍රියාකරුවන් හා එක්ව කටයුතු කිරීමට වග බලා ගැනීම.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන්

ඉහත අරමුණු සාක්ෂාත් කිරීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව පහත සඳහන් නියාමන කාර්යයන් ඉටු කිරීමෙහිලා නිරත වේ.

1. **බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ පටිපාටිය සහ බලපත්‍ර ප්‍රදානය කිරීම.**

1.1. පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රය . පනතේ 17 වන වගන්තියට අනුකූලව කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් දෙන ලද බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියාත්මක නොකළ යුතුය. කෙසේවුවද පනතේ 20 වන වගන්තියේ බලපත්‍ර ආදියෙන් නිදහස් කිරීම සඳහන් කර ඇත.

1.2. පනතේ 22 වන වගන්තිය යටතේ ගුවන් විදුලි සංඛ්‍යාත හා ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය

විදුලි සංදේශ පනතේ 22 (1) වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තකු විසින් තත් කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ හැර යම් ගුවන් විදුලි සංඛ්‍යාතයක් හෝ යම් ගුවන් විදුලි සංඛ්‍යාත විමෝචන උපකරණයක් ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරයේ යම් කොටසක හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද යම් නැවක හෝ ගුවන් යානයක පාවිච්චි නොකළ යුතුය.

1.3. පනතේ 21 වන වගන්තිය යටතේ වෙළඳ බලපත්‍ර

පනතේ 21 (1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් නිකුත්කළ බලපත්‍රයක් යටතේ හැර කිසිම තැනැත්තකු විසින් යම් විදුලි සංදේශ උපකරණයක් වෙළඳාමක් වශයෙන් නිශ්පාදනය කිරීම, ආනයනය කිරීම, විකිණීම, විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, පැවරීම, කුලියට දීම, බදුදීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය.

2. **අයක්‍රම නියාමනය කිරීම.**

2.1. පනතේ 5 (ඔ) වගන්තියේ නියමයන් ප්‍රකාරව කොමිෂන් සභාවට ඇති බලතල අනුව අමාත්‍යවරයා විමසා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ක්‍රියාකරුවන් විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සම්බන්ධයෙන් ක්‍රියාකරුවන්ගේ අවශ්‍යතා සැළකිල්ලට ගනිමින් අයක්‍රම හෝ අයක්‍රම තීරණය කිරීමේ ක්‍රම නිශ්චය කිරීම.

2.2. පනතේ 5(ඕ) ප්‍රකාරව අන්තර්ජාල ගාස්තු අනුමත කිරීම/නිශ්චය කිරීම.

3. **විදුලි සංදේශ පනත (ඒ යටතේ වූ නීති සහ රීති ඇතුලත්ව) සහ බලපත්‍රලාභී ක්‍රියාකරුවන්ගේ බලපත්‍රවල අනුකූලතාවය පිරික්සීම සහ සහතික කිරීම.**

4. **ශ්‍රී ලංකාවේ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි ලෙස පාවිච්චි කිරීමට වගබලා ගැනීම මෙන්ම පිරික්සීම සහ ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය කළමණාකරනය කිරීම.**

5. **පාරිභෝගික පැමිණිලි සහ විමර්ශන/පරීක්ෂණ පැවැත්වීමට ප්‍රතිචාර දැක්වීම.**

පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව ක්‍රියාකරුවකු විසින් සපයනු ලබන විදුලි සංදේශ සේවා පිළිබඳව විදුලි සංදේශ සේවා දායකයකු හෝ මහජනයා අතුරින් කෙනෙකු හෝ විසින් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කරනු ලැබූ විට අවශ්‍යයයි කොමිෂන් සභාව සලකන විමර්ශනයක් කොමිෂන් සභාවට පැවැත්විය හැකි අතර කාරණයට අදාල අවස්ථානුගත කරුණු අනුව ගත යුතු ප්‍රතිකර්ම යෙදීමටද සැලැස්විය යුතුය.

පනතේ 9(2) වගන්තිය අනුව යම් විමර්ශනයක් පැවැත්වීමේදී, පනතේ 9(1) ප්‍රකාරව කොමිෂන් සභාව විසින් ඒ පැමිණිල්ලට හේතු වූ නිමිත්ත හෝ කාරණය නිරවද්‍ය කිරීම සඳහා අවශ්‍යයයි පෙනී යන පරිදි එවැනි ක්‍රියාමාර්ග ගන්නා ලෙස එකී දුරකථන ක්‍රියාකාර සමාගම් වලට නියම කළ හැකි අතර අවශ්‍යයැයි හැඟෙන පරිදි මූල්‍යය වන්දි ගෙවන ලෙසද නියම කළ හැකිය.

6. **විදුලි සංදේශ සේවාවල ගුණාත්මකභාවය සහ විවිධත්වය සම්බන්ධයෙන් මහජනතාවට තොරතුරු සැපයීම සහ මහජන ක්‍රියාවලීන් සහ ප්‍රසිද්ධ විභාග පැවැත්වීමේදී ඔවුන්ගේ සහභාගීත්වය දිරි ගැන්වීම.**
7. **විදුලි සංදේශ ක්ෂේත්‍රයට සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ / ජාත්‍යන්තර හා විදේශීය ආයතනවල කටයුතු වලදී ශ්‍රී ලංකා රජය නියෝජනය කිරීම.**
8. **කොමිෂන් සභාව විසින් නියෝග, උපදෙස් හා තීරණ නිකුත් කිරීම.**

   ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව නියෝග, උපදෙස් සහ තීරණ නිකුත් කිරීම සම්බන්ධයෙන් විනිවිද පෙනෙන ප්‍රතිපත්තියක් අනුගමනය කර ඇත. ප්‍රසිද්ධ විභාග සහ සෙසු සමුළු වලට සහභාගීවන සහ ඒවා නියෝජනය කරන විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ක්‍රියාකරුවන්ට , පාරිභෝගිකයින්ට සහ වෙනත් ඒ සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන්ට වැඩි අවස්ථාවක් ලබා දෙනු ලැබේ.
9. **විදුලි සංදේශ උපකරණ සහ මාදිලි අනුමැතිය සඳහා තාක්ෂණික ප්‍රමිතීන් සඳහන් කිරීම.**

අන්තර් අංශ සහයෝගීත්වය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ කාර්යයන් අංශ රැසක් විසින් ඉටු කරන ලදී. 2016 වසරේ කොමිෂන් සභාවේ අදාල අංශවල ප්‍රධාන කාර්යයන් සහ කාර්ය සාධනය මතු පරිච්ඡේදවල දැක්වේ. ඇතැම් ක්‍රියාකාරකම් කිසියම් අංශයක් යටතේ සඳහන් කර ඇතත් එම ක්‍රියාකාරකම් අදාල අංශය මගින් ඉටු කරනු ලැබ ඇත්තේ අනෙකුත් අංශවල සහාය ඇතිව බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

02 පරිච්ඡේදය

2016 වසරේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයේ සංයුතිය

කොමිෂන් සභාව

පී.බී.අබේකෝන් මහතා	-	සභාපති
සුනිල් එස් සිරිසේන මහතා	-	අධ්‍යක්ෂ ජනරාල් ,සාමාජික 2016 ඔක්තෝම්බර් දක්වා
කිංස්ලි ප්‍රනාන්දු මහතා	-	අධ්‍යක්ෂ ජනරාල් ,සාමාජික 2016 ඔක්තෝම්බර් සිට
ලලිත් සේනානායක මහතා	-	සාමාජික
බණ්ඩාර දිසානායක මහතා	-	සාමාජික
එම්.එම්. සුහයිර් මහතා	-	සාමාජික
හේමන්ත වර්ණකුලසූරිය මහතා	-	සාමාජික 2016 අගෝස්තු දක්වා

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්ය මණ්ඩලය

සුනිල් එස් සිරිසේන මහතා	-	අධ්‍යක්ෂ ජනරාල් , 2016 ඔක්තෝම්බර් දක්වා
කිංස්ලි ප්‍රනාන්දු මහතා	-	අධ්‍යක්ෂ ජනරාල් , 2016 ඔක්තෝම්බර් සිට

කොමිෂන් සභා කාර්යාලය

ආර්.එස්.ගුණරත්න මහත්මිය	-	වැඩබලන කොමිෂන් සභා ලේකම්

පාලන , ආයතනික කටයුතු , මූල්‍ය සහ ආර්ථික , නීති කටයුතු

සුජාන් නානායක්කාර මහතා	-	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පාලන සහ ආයතනික කටයුතු

පාලන සහ ආයතනික කටයුතු අංශය

ඩබ්ලිව්.එම්.පී.පී.වීරසිංහ මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ
වී.ඒ.එන්. ප්‍රේමරත්න මහතා	-	සහකාර අධ්‍යක්ෂ

මූල්‍ය අංශය

එම්.කේ.ජයන්ත මහතා	-	අධ්‍යක්ෂ
ඒ.එස්.හපුආරච්චි මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ

අනුකූලතා අංශය

ආර්.එම්.ටී.කේ.පී.ලිවේරා මහත්මිය	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ
එච්.පී.එච්.එම්.පතිරණ මහත්මිය	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ

තරඟකාරිත්ව අංශය

එච්.ඩබ්.කේ.ඉන්ද්‍රජීත් මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ
නිශාන්ත පළිහවඩන මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ

ශ්‍රියානි මාවැල්ලගේ මහත්මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ

නීති අංශය

ජී.සී.පී.මොරගොඩ මහත්මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ආර්.එස්.ගුණරත්න මහත්මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
එල්.එස්.පී.රුදිගු මෙනවිය - සහකාර අධ්‍යක්ෂ
අයි.එන්.මැතිව් මහතා - සහකාර අධ්‍යක්ෂ

වර්ණාවලි කළමණාකරන අංශය

ඊ.එන්.පී.කේ.රත්නපාල මහතා - වැඩබලන අධ්‍යක්ෂ
එල්.ගනේෂ්මූර්ති මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
එම්.සී.එම්. ෆාරුක් මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ජේ.ඒ.එස්.ගුණානන්දන මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
එස්.ඒ.ආර්.කමලනයනා මහත්මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
එම්.පී.ගුණසිංහ මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ

ජාල අංශය

ආර්.ජී.එච්.කේ.රණතුංග මහතා - අධ්‍යක්ෂ
කේ.එස්.එම්. විශාකා මෙනවිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ
එස්.ඊ.වාකිෂ්ට මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ
අයි.එම්.ජවුසි මහතා - සහකාර අධ්‍යක්ෂ

ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා අංශය

එම්.කේ.ජයසේකර මහතා - අධ්‍යක්ෂ
ආර්.එම්.ජේ.කේ.බී.රත්නායක මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ

බලපත්‍ර පරිපාලන අංශය

එච්.පී.කරුණාරත්න මහතා - අධ්‍යක්ෂ (2016 අගෝස්තු 16 දින සිට)

ව්‍යාපෘති සහ පර්යේෂණ අංශය

ඩබ්ලිව්.ඩී.ද අල්විස් මහතා - අධ්‍යක්ෂ

අභ්‍යන්තර විගණන අංශය

යූ.ඒ.සමරතුංග මහත්මිය - ප්‍රධාන අභ්‍යන්තර විගණක

03 පරිච්ඡේදය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව - TRCSL) අධ්‍යක්ෂ ජනරාල් විසින් 2016 වර්ෂයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව) යනු 1996 අංක 27 දරන විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ සේවා ආශ්‍රිත නියාමන කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම උදෙසා ස්ථාපනය කරන ලද නීත්‍යානුකූල රාජ්‍ය ආයතනයකි. කොමිෂන් සභාව රාජ්‍ය සහ පෞද්ගලික යන අංශ දෙකේම සහාය ඇතිව රටේ විදුලි සංදේශ යටිතල පහසුකම් සපයමින් මෙරටට නවෝත්පාදන සහිත නවීන විදුලි සංදේශ තාක්ෂණය රැගෙන ඒමට සිය ප්‍රමුඛතාවය ලබා දේ. ඒ අතරම තරහකාරී වෙළඳපලක් පවත්වා ගැනීමට ඉඩ සපසමින් මෙරටේ ග්‍රාහකයින් සහ පාරිභෝගිකයන් සඳහා දරාගත හැකි මිල මට්ටම් ඇති කිරීමට සිය අවධානය යොමු කරයි.

සමාලෝචන වර්ෂය තුළදී, කොමිෂන් සභාව ජාතියට වැඩි ප්‍රතිලාභ සැලසීමට පෙරමුණ ගෙන විවිධ ඵලදායී ක්‍රියාකාරකම්වල නිරත වී ඇත. ජාල අංශය විසින් ඉහල ඉල්ලුමත් පවතින කෙටි සංකේත අංක භාවිතා කිරීමට අවස්ථාව සලසමින් 13XX පරාසය හඳුන්වා දී ඇති අතර රාජ්‍ය ආයතන පහකට සහ පෞද්ගලික ආයතන පහකට සිය සේවා වඩා කාර්යක්ෂමව සහ අඛණ්ඩව සැපයීම පිණිස නව කෙටි සංකේත අංක ලබා දී ඇත. එමෙන්ම ජංගම දුරකථන භාවිතය ඉහලයාම නිසා ඒ අනුව පාරිභෝගිකයින්ට වඩා ප්‍රශස්ත සේවාවක් ලබාදීම පිණිස විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම වැඩි කර ඇත. කුලුනු ඉදිකිරීමට එරෙහිව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි පිළිබඳව අවධානය යොමු කරමින් කොමිෂන් සභාව කුලුනු ඉදිකිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. 2016 වසර අවසානයේ ඉදි කරන ලද මුළු කුලුනු සංඛ්‍යාව 6727 කි. එමෙන්ම නීති විරෝධී ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන කේබල් රූපවාහිනී සේවා පොලීසියේ සහාය ඇතිව වැලැක්වීමට ක්‍රියා කර ඇති අතර 2016 වසර මුළුල්ලේ කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් සිය අවධානය යොමු කර ඇත. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ භාවිතා කරන විදුලි සංදේශ උපකරණවල කාර්යක්ෂමතාවය සහ අවහිරතාවයෙන් තොර සේවාවක් පවත්වාගෙනයාම නිසැක කිරීම පිණිස මාදිලි අනුමැතිය ලබා ලැනීම අවශ්‍ය වන අතර එබැවින් මෙම උපකරණ ආනයනකරුවන් විසින් අනුමත කළ යුතු පටිපාටිය මෙම කොමිෂන් සභාව විසින් හඳුන්වා දී ඇත. මෙම අංශය විසින් සාමාන්‍ය කරුණු වලට අමතරව , නව මාදිලි අනුමැතීන් 20 ක් ලබා දෙන ලදී. විදුලි සංදේශ ක්ෂේත්‍රය ලාභදායී ව්‍යාපාරික ක්ෂේත්‍රයක් වන බැවින් වෙළඳ බලපත්‍ර ලබා ගැනීම පිණිස අයදුම්පත්‍ර රැසක් ලැබේ. මේ සම්බන්ධයෙන් මෙම අංශය විසින් වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමේ පටිපාටියක් හඳුන්වා දී ඇති අතර ඒ අනුව මෙම වර්ෂය තුළ එවැනි වෙළඳ බලපත්‍ර 833 ක් නිකුත් කරන ලදී. වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම වර්ධනය කිරීමට අමතරව, කුලුනු ආශ්‍රිත විමර්ශන

පැවැත්වීම, ආනයන නිෂ්කාශන ලිපි, පෞද්ගලික නිෂ්කාශන ලිපි නිකුත් කිරීම වර්ධනය වී ඇත. ඒ අතර කුලුනු ආශ්‍රිත පැමිණිලි ලැබීම පහත වැටුණි.

එමෙන්ම ගුවන් විදුලි සංඛ්‍යාත වෙන් කිරීම කොමිෂන් සභාවේ වැදගත් කාර්යයක් වන අතර වර්ණාවලි කළමණාකරන අංශය විසින් මෙම කරුණු ඉටු කරයි. මෙම අංශය විසින් මේ සම්බන්ධයෙන් භාවිතා කරන උපකරණවල අවභිරතාවයන් වලක්වා ගුණාත්මකභාවයට අවශ්‍ය ප්‍රමිතිය සහ අනුකූලතාවය සහතික කරයි. වැඩිදුරටත් කොළඹ, කදිරාන සහ නුවර ස්ථාපනය කර ඇති ස්ථිර පිරික්සුම් මධ්‍යස්ථාන වලට අමකරව විශේෂයෙන් සැලසුම් කරන ලද වාහනයක විශේෂ පිරික්සුම් උපකරණයක් ස්ථාපනය කරන ලදී. මෙම පද්ධතිය ස්ථාපනය කරන ලද නමුත් අවභිරතාවයන් ආශ්‍රිත එවැනි පැමිණිලි 24 ක් ලැබුණු අතර කොමිෂන් සභාව ඒවා විමර්ශනය කර නිසි ක්‍රියාමාර්ග ගන්නා ලදී. සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය සිය ගමන් මගේදී , වර්තමාන තත්ත්වය වැඩිදියුණු කිරීම පිණිස අංශයේ සියළුම පැතිකඩ සැලකිල්ලට ගනිමින් ක්‍රමවේදයක් සකස් කර ඇත. 2016 වර්ෂයේදී විකාශන සේවා (රූපවාහිනී සහ ගුවන් විදුලි) සඳහා සංඛ්‍යාත 52ක් වෙන් කරන ලද අතර පෞද්ගලික ජංගම සේවා සඳහා සංඛ්‍යාත 42 ක් වෙන් කරන ලදී. පසුගිය වර්ෂය හා සන්සන්දනය කිරීමේදී මෙය වර්ධනයකි. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි පරිහරණය කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ වර්ධනයක් පෙන්නුම් කරන ලද අවස්ථාවක් විය. මෙම සමාලෝචන වර්ෂයේදී නිෂ්කාශන වාර්තා නිකුත් කිරීමේ ඉහළ ප්‍රමුඛතාවයක් දක්නට ලැබෙන අතර ඒ සම්බන්ධ විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව - 03.01

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පරිහරණය කරන්නන්ගේ වර්ධනය 2015-2016

සේවාවේ වර්ගය	බලපත්‍ර සංඛ්‍යාව	
	2015	**2016**
ස්ථාවර සේවා	121	122
විකාශන සේවා (රූපවාහිනී සහ ගුවන් විදුලි)	40	54
ට්‍රන්කින් / පේජින්/ සිටිසන් බෑන්ඩ්	4	7
දත්ත / ගුවන් විදුලි ටෙලිමෙට්‍රි සේවා	11/16	15/33
ගුවන් සහ සමුද්‍ර සේවා (i) ගුවන් යානා මධ්‍යස්ථාන (ii) නැව් මධ්‍යස්ථාන (iv) ගුවන් ජංගම සේවා	 72 84 4	 76 92 11
පෞද්ගලික ජංගම ගුවන් විදුලි සේවා ආධුනික ගුවන් විදුලි	247 11	252 17

මෙම සමාලෝචන වර්ෂයේදී, නිෂ්කාශන වාර්තා නිකුත් කිරීමේ ඉහළ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන අතර ඒ පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව **- 03.02**

නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව **2015-2016**

සේවාවේ වර්ගය	**නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව**	
	2015	**2016**
සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ ඇතුළු ස්ථාවර සේවා	654	1243
සෙලෙයුලර් ජංගම සේවාව (i) ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් (ii) පෞද්ගලික ජංගම ගුවන් විදුලි	 1308 812	 1341 940
ගුවන් සහ සමුද්‍ර සේවා (i) සමුද්‍ර ජංගම සේවා (ii) ගුවන්ජංගම/ගුවන්යානා ගමන් හැසිරවීම	 90 7	 175 11
වන්දිකා සේවාව		471
ආධුනික ගුවන් විදුලි	21	35

විදුලි සංදේශ ක්ෂේත්‍රය් නව තාක්ෂණය සහ නවෝත්පාදන නිසා, නීති අංශය විසින් නියාමන රාමුව සකස් කිරීමේදී නව අභියෝග වලට මුහුණ දෙමින් සිටී. එබැවින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ රීති බලාත්මක කිරීම පිණිස විවිධ යාන්ත්‍රණයන් සහ ක්‍රමෝපායන් පිළිබඳව අඛණ්ඩව අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ. අභියෝග පිළිබඳව අවධානය යොමු කිරීමේදී නීති අංශය සෙසු සියළුම අංශ වලට ඔවුන්ගේ නීතිමය ගැටළු සම්බන්ධයෙන් සහාය වීම, කොමිෂන් සභාව පාර්ශවයක් වන විවිධ නීතිමය නඩු සම්බන්ධයෙන් පෙනී සිටීම සිදු කරයි.

ශ්‍රී.ල.වි.ස.නි.කොං. සභාවේ අනුකූලතා අංශය සේවා සැපයුම්කාර සමාගම් ආශ්‍රිත කරුණු සලකා බලන අතරම පාරිභෝගිකයින් සඳහා ප්‍රශස්ත විදුලි සංදේශ සේවාවක් සැපයීමේ අභිලාෂයෙන් පොදු මහජනතාවගේ කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරන අංශයකි. මෙම අංශය මගින් සේවා සැපයුම්කාර සමාගම් විසින් නිසි පරිදි සේවා නොසැපයීම හෝ සේවා සැපයුම්කාර සමාගම්වල විෂමාචාර ක්‍රියා ආශ්‍රිත පැමිණිලි වලට එරෙහිව ක්‍රියාමාර්ග ගන්නා අතර , අවශ්‍යවූ විටෙකදී අලාභයන් වෙනුවෙන් මූල්‍ය වන්දි ලබා ගැනීමට අවස්ථාව සලසා දෙයි. වැඩිදුරටත් මෙම අංශය විසින් පොලීසියේ සහාය ඇතිව මහජනතාවගේ අස්ථානගතවූ දුරකථන සොයාදීමට සහාය වේ. දුරකථන භාවිතය සහ දුරකථන ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් මෙරටේ මහජනතාව දැනුවත් කිරීම පිණිස වැඩසටහන් අවශ්‍ය වන බව කොමිෂන් සභාව දැඩිව විශ්වාස කරයි. තවද මේ සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය සුදුසු නිලධාරීන් වශයෙන් සැලකිල්ලට ගෙන පොලිස් නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සහ ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත. එමෙන්ම මේ ආකාරයෙන් මහජනතාව දැනුවත් කිරීම පිණිස ජනමාධ්‍ය භාවිතා කර ඇති අතර එම විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව - 03.03
මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රගතිය – 2016

	විෂයය ක්ෂේත්‍රය	වර්තමාන ප්‍රගතිය
1	සමාජීය සහ වාණිජමය ප්‍රතිලාභ සඳහා විදුලි සංදේශ පහසුකම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	90%
2	පාරිභෝගික ආරක්ෂණය නිසැක කිරීම	95%
3	පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීම සහතික කිරීම	90%

ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවේ ප්‍රතිපත්ති , ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය මෙම විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත ජාත්‍යන්තර ආයතනවල සභාය ඇතිව ඒවා සමඟ සමීපව කටයුතු කරමින් විදුලි සංදේශ ක්ෂේත්‍රයේනව ප්‍රවණතා , තාක්ෂණය සහ නවෝත්පාදන වලට අනුගතව මෙරටේ විදුලි සංදේශ අංශය වැඩිදියුණු කිරීම පිණිස අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදන කිරීමෙහිලා නිරත වන කොමිෂන් සභාවේ වැදගත් අංශයකි. කොමිෂන් සභාව විසින් ලොව සෙසු රටවල ප්‍රශස්ත ක්‍රමවේද මෙරටට රැගෙන ඒම පිණිස අදාල විශ්ව විද්‍යාලවල සභාය ඇතිව මෙම ක්ෂේත්‍රය ආශ්‍රිත පර්යේෂණ අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම පිණිස අවධානය යොමු කරනු ලැබේ. 2016 අනුරූපී වර්ෂයේදී අධිවේගී අන්තර්ජාල සේවා සම්බන්ධයෙන් කොමිෂන් සභාව, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සභාය ඇතිව ජාතික අධිවේගී අන්තර්ජාල සේවා සැලැස්මක් සකස් කිරීමේ පදනම දමා ඇත. විකාශනය වන තාක්ෂණය භාවිතා කරමින් , දුරකථන ක්‍රියාකාර සමාගම් අතර තරහකාරිත්වය ඇති කරමින් , ආයෝජකයින් දිරිගැන්වීම පිණිස , කොමිෂන් සභාව ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සභාය ඇතිව බලපත්‍රකරණය පිළිබඳ නිසි රාමුවක් වැඩිදියුණු කර ඇත. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් අඩු ප්‍රදේශවල පාසල් ශිෂ්‍යයන් සහ විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්ට සභාය වන “ පාසල හා ප්‍රජාව සම්බන්ධීකරණය කිරීමේ ව්‍යාපෘතිය ආශ්‍රිත කරුණු අනාවරණය කර ගැනීම පිණිස සමීක්ෂණයක් පවත්වන ලදී. අන්තර්ජාල සම්බන්ධතා ලබාගැනීම ආශ්‍රිත ගැටළු අඩුවී ඇති අතර බිල්පත් ගෙවීම සම්බන්ධයෙන් ක්‍රමවත් යාන්ත්‍රණයක් සැකසී ඇත. පළාත් අධ්‍යාපන බලධාරීන් විසින් මේ පිළිබඳව දැනුවත් කිරීම් සිදු කර ඇති අතර “විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්ට ” සහායවීමෙහිලා නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස දේශීය පාර්ශවකරුවන්ට සිය අදහස් දැක්වීමට අවස්ථාව සලසමින් වීඩියෝ සම්මන්ත්‍රණයක් ඔස්සේ ජිනීවාහිදී ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ “සංගම් කාර්ය කණ්ඩායම - Council Working Group (CWG) මගින් විවෘත උපදේශනය ලබා ගැනීමට අවස්ථාව සලසන ලදී. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය(ITU) / ජාතික තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය ඒකාබද්ධව සංවිධානය කරන ජාත්‍යන්තර ස්වේච්ඡාදායතයින්ගේ (IIV) වැඩසටහන 2016” මතුගම, කොතලාවලපුර මහා විද්‍යාලය සහ රත්මලාන වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ ගුරුවරුන්, විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයන් සඳහා කොරියානු තොරතුරු තාක්ෂණ ශිෂ්‍ය පුහුණුකරුවන්ගෙන් සමන්විත කණ්ඩායම් තුනක සභාය ඇතිව ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් සම්බන්ධීකරණය කරන ලද තවත් වැඩසටහනකි. Adobe Photoshop, Adobe Illustrator, Video Editing, Ms Office, Database සහ Web Development විෂයය මාලාවේ විෂයයන් අතර වන අතර මෙම වැඩසටහන අවසානයේදී ශිෂ්‍යයන් සහ ගුරුවරුන්ගේ දැනුමේ සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කළේය. ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහ ආහාර සහ කෘෂිකර්ම

සංවිධානයේ (FAO) සහාය ඇතිව "කෘෂිකාර්මික ක්‍රමෝපායන්" සකස් කිරීම පිණිස ජාතික උපදේශන වැඩමුළුවක් පවත්වා ඇති අතර එහි කාර්ය කණ්ඩායම රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම සාමාජිකයින්ගෙන් සමන්විත විය. "කෘෂිකාර්මික ක්‍රමෝපාය" 2016 දෙසැම්බර් 02 වන දින සිට ක්‍රියාත්මක වූ අතර ශ්‍රී ලංකා රජය මෙම නිර්නායකයන් සඳහා එකඟවන ලදී, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය විසින් මෙහෙයවන ලද ලෝක සන්නිවේදන/ තොරතුරු සන්නිවේදන තාක්ෂණ (ICT) දර්ශක ප්‍රශ්නාවලිය සහ ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකය - Global Cyber Security Index – GCI) පිළිබඳ ප්‍රශ්නාවලිය සම්බන්ධයෙන් ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් සමීක්ෂණයක් පවත්වා ඇති අතර එය රාජ්‍යයන්, ජාත්‍යන්තර සංවිධාන, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ලෝක බැංකුව විසින් පුළුල් වශයෙන් භාවිතා කරන අදාල දර්ශක සැපයීමට සහ යාවත් කාලීන කිරීමට ඉවහල් විය. ලෝක විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ දිනය 2016 සිය 151 වෙනි සංවත්සරය සමරන ලද අතර "සමාජ බලපෑම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යවසායකත්වය" යන්න මෙදින තේමාව විය. මෙම අවස්ථාවට අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා, විදුලි සංදේශ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යතුමා, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම්වරයා සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශේෂ පණිවුඩ නිකුත් කරන ලද අතර මෙම අවස්ථාව සිහිපත් කරලමින් අදාල පාර්ශවයන්ගේ සහාය ඇතිව තොරතුරු තාක්ෂණය පිළිබඳව උනන්දුවක් දක්වන පාසල් හැරගිය වූවන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී. සාමාජීය වගකීමක් වශයෙන් 2016 වසරේදී මෙරටේ නායයෑම ඇතිවූ අවස්ථාවේදී විදුලි සංදේශ මාර්ග සහ මහා මාර්ග වලට හානි සිදුවූ බැවින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් එයට සහාය වනු පිණිස ආපදා විදුලි සංදේශ උපකරණ රැසක් ආපදා කළමණාකරන මධ්‍යස්ථාන වලට භාර දෙන ලදී. සමාලෝචන වර්ෂය තුලදී, අවහිරතාවයන් අවම කිරීම පිණිස අදාල බලධාරීන් විසින් වන්ද්‍රිකා නිවේදන / සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. මානව සම්පත් සහ තාක්ෂණය, තාක්ෂණික සහාය, ව්‍යාපෘති පහසුකම්, ශිෂ්‍යත්ව අවස්ථා යනාදී මානව ධාරිතාවය ගොඩනැංවීම පිළිබඳ පුහුණු වැඩසටහන් ඇතුළු මෙරටට වැඩි ප්‍රතිලාභ සැලසීම පිණිස අදාල ජාත්‍යන්තර ආයතන වලට දායක මුදල් / සාමාජික මුදල් (Contributions/ Subscriptions) ගෙවන ලද අතර වසර තුළ ගෙවන ලද මුළු මුදල රුපියල් මිලියන 29.1 කි. විදුලි සංදේශ නියාමන කරුණු ප්‍රවර්ධනය කිරීමෙහිලා මෙරටට පැමිණෙන විදේශීය විශේෂඥයින් සම්බන්ධීකරණය කිරීම මෙම අංශයේ වගකීමකි. සීමාසහිත සතිස් පෞද්ගලික සමාගම සඳහා සෘජු ගෘහස්ථ වන්ද්‍රිකා (Direct to Home Satellite) පිළිබඳ නව බලපත්‍රයක් නිකුත් කර ඇති අතර සීමාසහිත ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් වෙනුවෙන් ස්ථාවර රැහැන් රහිත බලපත්‍රය අළුත් කරන ලදී. ඩයලොග් ආසියාටාහී සංකලිත සම්ප්‍රේෂණ ජාලය සම්බන්ධ කටයුතු සිදු වෙමින් පවතින අතර , සීමාසහිත ලංකා බෙල් සමාගමේ ස්ථාවර රැහැන් රහිත බලපත්‍රය ක්‍රියාත්මක වේ. සීමාසහිත US කේබල් පුද්ගලික සමාගම, සීමාසහිත ඩිස් ටීවී ලංකා පුද්ගලික සමාගම සහ සීමාසහිත ඊ.ඒ.පී.එදිරිසිංහ පුද්ගලික සමාගමේ සෘජු ගෘහස්ථ බලපත්‍රවල කටයුතු ක්‍රියාත්මක වී ඇත.

ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවේ ව්‍යාපෘති සහ පර්යේෂණ අංශය මගින් මෙරටේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තිරසාරභාවය සහ ඵලදායිත්වය ඇති කිරීම පිණිස ව්‍යාපෘති සැලසුම් කර ඇති අතර මේ මොහොත වන විට එම ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වේ. නවීන තාක්ෂණයේ විශ්මිත නිර්මාණයක් වන කොළඹ නෙළුම් කුලුන , සාප්පු සංකීර්ණ, කැරකෙන අවන්හල්, ඉහල උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරි, රාජ්‍ය තානායම්, උත්සවශාලා මෙන්ම විදුලි සංදේශ පහසුකම් වලට අමතරව නරඹන්නන්ට විනෝදාස්වාදය සපයන විවෘත අවකාශයක් සහිත ආකර්ශනීය පහසුකම් රැසකින් සමන්විත වේ. මෙම පහසුකම් කුලුනේ මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට අදහස් කෙරේ. මෙහිදී ඩිජිටල් වීඩියෝ සේවා පහසුකම් සපයන අතර FM විකාශන සහ විදුලි සංදේශ සේවා හවුලේ පරිහරණය කිරීමට හැකිවේ. බාහිර ඇන්ටනාවකින් තොරව රූපවාහිනී නාලිකා නැරඹීමට සමස්ථ ජනතාවට හැකියාව ලබා දෙමින් ඩිජිටල් භෞමික රූපවාහිනී විකාශන සම්ප්‍රේෂණය කිරීමට මෙමගින් අවධානය යොමු වන බැවින් මෙම පහසුකම් ඉතා වැදගත් වේ. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2017 වසරේ අග වන විට සම්පූර්ණ කිරීමට සැලසුම් කර ඇත. මූලික වශයෙන් හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය මගින් විවිධ පහසුකම් සහිතව 100,000 ශ්‍රම බලකායකට ඉඩකඩ පහසුකම් සැලසීමට සැලසුම් කර ඇති අතර පසුව කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට මෙන්ම තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විදේශීය හා දේශීය දැවැන්තයින්ට වැඩි අවස්ථාව සැපයීම දක්වා වෙනස් විය.

ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවේ තරඟකාරිත්ව අංශයට දරාගත හැකි මිලගනන් සහ සේවා තත්ත්වය සහිතව කාර්යක්ෂම විදුලි සංදේශ සේවාවක් සපයමින් පාරිභෝගිකයන්ගේ යහපත නිසැක කිරීමේ වගකීම පවරා ඇත. මේ අතරම මෙම අංශය, දුරකථන ක්‍රියාකාර සමාගම්වල යහපත මෙන්ම සේවා තත්ත්වය සහ අඩු මිල ගනන් සහිත සේවා සහිතව ඔවුන් අතර සාධාරණ තරඟකාරිත්වයක් ඇතිකිරීමට සලකා බලයි. මෙම කාර්යයෙහිලා මෙම අංශය විසින් අයත්‍රම ආශ්‍රිත නියාමන කරුණු සම්බන්ධයෙන් වගකීම, අන්තර්සම්බන්ධීය සේවා පිරික්සීම, කර්මාන්තයේ තොරතුරු ප්‍රසිද්ධ කිරීම, දුරකථන ක්‍රියාකාර සමාගම්වල කාර්යසාධනය විශ්ලේෂණය කිරීම, සහ අදාල පාර්ශවයන්ට අවශ්‍ය උපදෙස් සැපයීම සිදු කරනු ලැබේ. එමෙන්ම විදුලි සංදේශ බදු, ජාත්‍යන්තර විදුලි සංදේශ බදු සහ සෙස් බදු එක්රැස් කිරීම පිළිබඳව මෙම අංශය විසින් වගකියනු ලැබේ. ජාල සහ වෙනත් විදුලි සංදේශ සේවා වැඩිදියුණු කිරීම පිණිස විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නිරතවන විදේශීය විශේෂඥයින් ශ්‍රී ලංකාවට ගෙන්වීම දිරිගන්වන අතර අවශ්‍ය වීසා සම්බන්ධ කටයුතු සිදු කරනු ලැබේ. 2016 වර්ෂය තුළදී, මුළු කර්මාන්ත පිරිවැටුම රුපියල් බිලියන 193.2 ක් වූ අතර මෙම ඉපැයීම්වල 95% සඳහා සාමූහිකව දායක වූයේ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් පහක් සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම් තුනක් විසිනි.

වගුව - 03.04

ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2015-2016

(*රුපියල් මිලියන වලින්*)

සේවාවේ වර්ගය	2015	2016	% වෙනස්වීම 2015-2016
ජංගම	125,120	137,894	10%
ස්ථාවර ප්‍රවේශ	51,138	55,321	8%
මුළු එකතුව	176,258	193,215	10%

2016 වර්ෂයේදී කරන ලද අඛණ්ඩ ආයෝජන දක්වා ඇති අතර එම මුදල රුපියල් බිලියන 82.8 කි.

වගුව - 03.05

ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු ආයෝජන 2015-2016

(රුපියල් මිලියන වලින්)

සේවාවේ වර්ගය	2015	2016
ජංගම	22,703	26,132
ස්ථාවර ප්‍රවේශ	26,245	56,641
මුළු එකතුව	48,948	82,774

මිල අඩුකිරීම සහ සේවා තත්ත්වය පිළිබඳව අවධානය යොමු කරමින් දුරකථන ක්‍රියාකාර සමාගම් අටක් විසින් සාර්ථකව මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී. ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල සියයට 2 පහත වැටීම වෙනුවට ජංගම ග්‍රාහක පදනමේ සියයට 8 වර්ධනයක් ලබා ගෙන ඇත.

වගුව - 03.06

2015 -2016 කාලපරිච්ඡේද සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයින්ගේ සංඛ්‍යාව

සේවාවේ වර්ගය	2015	2016	% වෙනස්වීම 2015-2016
ජංගම	24,384,544	26,227,631	8%
ස්ථාවර ප්‍රවේශ	2,601,196	2,550,432	-2%
මුළු එකතුව	26,985,740	28,778,063	7%

එමෙන්ම අනුරූපී වර්ෂය තුළ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් සම්බන්ධයෙන් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය 2% කින් වර්ධනය වී ඇති අතර ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල වර්ධනය 10% කි.

වගුව- 03.07

2015-2016 කාලපරිච්ඡේද සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යය (ARPU)

සේවාවේ වර්ගය	2015	2016	% වෙනස්වීම 2015-2016
ජංගම	5,131	5,258	2%
ස්ථාවර ප්‍රවේශ	19,659	21,691	10%

සමාලෝචන වර්ෂයේදී ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් දෙකම සම්බන්ධයෙන් බදු වලින් පසු ශුද්ධ ලාභයේ වර්ධනයක් ඇති අතර එය රුපියල් මිලියන 532 කි.

වගුව - 03.08

බදු වලින් පසුව ශුද්ධ ලාභය / (පාඩුව) 2015-2016 - (රුපියල් මිලියන වලින්)

සේවාවේ වර්ගය	2015	2016
ජංගම	-3,552	3,426
ස්ථාවර ප්‍රවේශ	898	106
මුළු එකතුව - ජංගම සහ ස්ථාවර ප්‍රවේශ	-2,654	3,532

2014 වර්ෂයේදී පනවන ලද සියයට 25 විදුලි සංදේශ බදු අනුව 2016 වර්ෂයේදී රුපියල් මිලියන 30,339 අය කර ගත හැකිවූ අතර , අය කර ගන්නා ලද සෙස් බදු ප්‍රමාණය රුපියල් මිලියන 4,121 කි. Over-The – Top හඬ භාවිතය ඉහල යාම නිසා , ජාත්‍යන්තර හඬ හුවමාරු භාවිතය ශීඝ්‍රයෙන් පහළ වැටුණු අතර විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (Telecommunication Development Charges) සියයට 5 කින් පහල වැටුණි. මෙම තත්ත්වය අදාල බදු සියයට සියයකින් ඉහළ යාමට හේතු වූ අතර මෙම වර්ෂය තුළ මෙම බදු මත මුළු එකතුව රුපියල් මිලියන 8,689 ක් විය. එම වර්ෂය තුළ පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු (OLAC- Out Going Local Access) රැස් කර ගැනීමට හැකිවූ අතර එම මුදල රුපියල් මිලියන 1,125කි. මෙරටේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට දිගු කාලීන පදනම සහ ප්‍රවර්ධන පදනම මත අයක්‍රම වර්ග සැලසුම් දෙකක් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන ලදී. දිගු කාලීන පදනම යටතේ කොමිෂන් සභාව විසින් අවසන් කිරීමක් හෝ සංශෝධනය කිරීමක් කරන තෙක් දුරකථන ක්‍රියාකාර සමාගම් වලට සිය කැමැත්ත මත සැලැස්ම අඛණ්ඩව පවත්වාගෙන යාමට අවස්ථාව සැලසේ. ප්‍රවර්ධන පදනම යටතේ දුරකථන ක්‍රියාකාර සමාගම් වෙළඳපල පිළිබඳව අවිනිශ්චිතව පසුවන නිසා එම පදනම මාස තුනක උපරිම කාලපරිච්ඡේදයකට සීමාවේ. 2016 වර්ෂය තුළදී, අයක්‍රම අයදුම්පත් 128 ක් සම්බන්ධයෙන් කටයුතු කර අනුමත වූ අතර එයින් 17 ක් පමණ දිගුකාලීන පදනම මත විය.

මෙම කොමිෂන් සභාවේ පරිපාලන අංශය විසින් එහිලා පැවරුණු කාර්ය භාරය පූර්ණ වගකීමෙන් යුතුව ඉටු කරන අතර කොමිෂන් සභාවේ අංශ සම්බන්ධයෙන් විස්තර කර ඇති පරිදි 2016 වර්ෂය තුළ පැනනැගුණු සියළුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

කොමිෂන් සභාවේ ප්‍රධාන අංශයක් වන අභ්‍යන්තර විගණන අංශය විසින් ආයතනමය කටයුතු කාර්යක්ෂමව සහ ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට සහාය ලබා දේ. එමෙන්ම මෙම අංශය විසින් විගණකාධිපති විසින් සලසන රජයේ නීති සහ රෙගුලාසි වලට අනුගතව මෙහෙයුම් කටයුතු සිදු කිරීම, වංචා වලට දඬුවම් ලබාදීම සහ විමර්ශනය කිරීම , වත්කම් ආරක්ෂා කිරීම සිදු කරයි. අනුරූපී වර්ෂය තුළ විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර මෙම රැස්වීම් වලදී විගණන විමසුම් 34 ක් පමණ සාකච්ජා කර ඒ අනුව අදාල ක්‍රියාමාර්ග ගන්නා ලදී.

2016 වසරේදී ශ්‍රී .ල.වි.ස.නි.කොා.සභාවේ මූල්‍ය ප්‍රගතිය සතුටුදායක විය. ආදායම් උත්පාදනයේ වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර විශේෂයෙන් අදාල වර්ෂය තුළදී කොමිෂන් සභාවේ පහත සඳහන් මූල්‍ය විෂයය ක්ෂේත්‍ර තුළ සැලකියයුතු ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී.

	2016	**2015**	
බලපත්‍ර ගාස්තු	15,859	11,654	36% වැඩිවීම
විදුලි සංදේශ බදු	30,346	24,859	8.9% වැඩිවීම
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු	8,690	5,865	48% වැඩිවීම
මුළු විවිධ ආයෝජන	2,295	1,117	105% වැඩිවීම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව , වගකිවයුතු වැදගත් රාජ්‍ය ආයතනයක් වශයෙන්, සතු විය යුතු අභිප්‍රේරණය කිරීම ප්‍රකාරව මෙරටේ ජනතාවට සහ විදුලි සංදේශ ප්‍රජාවට සිය සේවය කැපවීමෙන් ලබා දේ. මෙම ප්‍රයත්නයේදී , පෞද්ගලික අංශය විසින් ලබාදෙන සේවය ප්‍රශංසනාත්මක වන අතර අභිප්‍රේරණාත්මකය. අපේක්ෂිත ඉලක්ක සාක්ෂාත් කිරීම පිණිස කැපවීමෙන් කටයුතු කරන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය විසින් ලබාදෙන සහාය ඉමහත්ය.

04 පරිච්ඡේදය

2016 වර්ෂය සඳහා අංශ අනුව කාර්යසාධන වාර්තාව

ජාල අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ජාල අංශය ශ්‍රී ලංකාවේ රාජ්‍ය සහ පෞද්ගලික විදුලි සංදේශ ජාල සම්බන්ධ නියාමන කරුණු මෙහෙයවීමට වගකීමෙන් යුතුව කටයුතු කරයි. 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනත ප්‍රකාරව ජාල අංශය යටතේ පවත්නා විෂයය ක්ෂේත්‍රයන් පහත දැක්වේ:-

1. රාජ්‍ය විදුලි සංදේශ ජාලය සඳහා ජාතික අංකන සැලැස්ම.
2. සංඥා කෙටි සංකේත අංක සහ ජාල කෙටි සංකේත අංක වෙන් කිරීම.
3. ඉලක්ක හඳුනාගැනීම.
4. යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම.
5. විදුලි සංදේශ උපකරණ වෙළෙන්දන්ට වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම.
6. ජාල උපකරණ සඳහා මාදිලි අනුමැති සහතිකපත්‍ර සහ රේගු නිෂ්කාශන නිකුත් කිරීම.
7. ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ජාල සඳහා නව තාක්ෂණයන් හඳුන්වාදීම.

ජාතික අංකන සැලිස්ම රටේ ජාතික සම්පතක් වන අතර එබැවින් ඒ සඳහා කාර්යක්ෂම කළමණාකරනයක් සහ පරිපාලන පද්ධතියක් අවශ්‍ය වේ. මෙම අංකන විදුලි සංදේශ සේවාවේදී අවශ්‍ය ආයතන හඳුනාගැනීමට මෙන්ම ක්‍රියාපටිපාටිය මෙන්ම බිල්පත් සම්බන්ධයෙන් භාවිතා කරනු ලැබේ.

විදුලි සංදේශ පහසුකම් ව්‍යාප්ත කිරීමේ පහසුකම් සම්පාදනය කිරීම ජාල අංශයේ ප්‍රධාන කාර්යයන් අතරින් එකකි. ජාල අංශය විසින් රාජ්‍ය මෙන්ම පෞද්ගලික දෙඅංශයේ ආයතන වලට සිය පවත්නා ජාලය ව්‍යාප්ත කිරීමට අවශ්‍ය වන අවස්ථා වලදී හෝ නව යටිතල පහසුකම් භාවිතා කරමින් නව සේවා හඳුන්වාදීමට අනුමැතිය ලබා දීම සිදු කරයි. මේ සම්බන්ධයෙන් ජාල අංශය පහත සඳහන් කරුණු කෙරෙහි සිය අවධානය යොමු කරයි.

1. ආරක්ෂක අමාත්‍යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය යනාදී රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම.
2. ඇන්ටනා ස්ථාපනය කිරීම සම්බන්ධ අයදුම්පත්‍ර ක්‍රියාවලියේදී ඇන්ටනා ව්‍යුහ කළමණාකරන පද්ධති මෘදුකාංග වලට අනුකූලව කටයුතු කිරීම.
3. බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වලට පහසුකම් සැපයීම.
4. මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
5. යටිතල පහසුකම් ව්‍යාප්ත කිරීම ආශ්‍රිත පැමිණිලි මෙහෙයවීම.

6. යටිතල පහසුකම් යෝජනා පිළිබඳව අධ්‍යයනය කිරීම, නිර්දේශ කිරීම මෙන්ම වාර්තා ඉදිරිපත් කිරීම.
7. අවශ්‍ය වූ විට ඇන්ටනා ව්‍යුහය පිළිබඳ නිර්නායකයන් සංශෝධනය කිරීම.

2015 වසරේදී ඉදි කරන ලද නව කුලුනු 163 ඇතුලත්ව 2016 වර්ෂය තුළදී , සමුච්චිත කුලුනු සංඛ්‍යාව 6727 දක්වා වර්ධනය විය. මෙම කාලය තුළ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් දහයක් පැවැත්වීමට ජාල අංශයට හැකි විය.

එමෙන්ම නීති විරෝධී ලෙස කේබල් රූපවාහිනී සේවා පවත්වාගෙනයාම පිළිබඳව ජාල අංශය විසින් සිය අවධානය යොමු කරන අතර විදුලි සංදේශ පනතේ 22 (අ) 1 වගන්තිය ප්‍රකාරව පොලිසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව ඒවා පාලනය කරනු ලැබේ.

පනතේ 5 (ඩ) වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ පද්ධතියකට සම්බන්ධ කරන සියළුම විදුලි සංදේශ උපකරණ සඳහා ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවෙන් මාදිලි අනුමැතිය ලබා ගත යුතුය. මේ සම්බන්ධයෙන් රේගුව, ආයෝජන මණ්ඩලය සහ ආනයන පාලක යනාදීන් සඳහා ඉදිරිපත් කිරීමට බලයලත් ලිපි ලබා ගැනීම පිණිස අදාල උපකරණ ආනයනකරුවන් විසින් අනුගමනය කළ යුතු අනිවාර්යය ක්‍රියාපටිපාටියක් ජාල අංශය විසින් හඳුන්වා දී ඇත.

2016 වර්ෂයේදී නිකුත් කරන ලද මුළු නව මාදිලි අනුමැතීන් සංඛ්‍යාව 20 ක් වන අතර ආනයන නිෂ්කාශන ලිපි සංඛ්‍යාව 4404 කි. එමෙන්ම පෞද්ගලික ගනුදෙනු කරුවන්ගේ ලිපි 25 ක් පමණ නිකුත් කරන ලදී.

මාදිලි අනුමැතිය සහ උපකරණ නිෂ්කාශනය කිරීම

ජාල අංශය විසින් නියාමන කාර්යයන් අඛණ්ඩව සිදු කරන අතර ජාල ආශ්‍රිත උපකරණ ආනයනය කිරීම පිණිස නිෂ්කාශන ලිපි සහ මාදිලි අනුමැතිය නිකුත් කිරීම පිණිස ඉදිරිපත් කරන ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමද මෙම අංශයට පැවරී ඇත. මෙම බලපත්‍රය රහිතව යම් විදුලි සංදේශ උපකරණයක් යම් තැනැත්තකු විසින් ආනයනය කිරීම , විකිණීම , විකිණීම පිණිස ඉදිරිපත් කිරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, කුලියට දීම, බදු දීම, ක්‍රියාකර පෙන්වීම, නඩත්තු කිරීම හෝ අළුත්වැඩියා කිරීම සිදු නොකළ යුතුය. මේ සම්බන්ධයෙන් නිශ්චිත පටිපාටියක් ජාල අංශය විසින් හඳුන්වා දී ඇත. අනුරූපී වර්ෂය තුළ වෙළඳ බලපත්‍ර 833 ක් මෙම අංශය විසින් නිකුත් කර ඇත. වැඩිදුරටත් ජංගම දුරකථන ඇතුළු නීත්‍යානුකූල නොවන ආකාරයෙන් විදුලි සංදේශ උපකරණ අලෙවි කිරීමෙහි නිරත නීතිවිරෝධී වෙළෙන්දන් විසින් පොලිසියේ සහාය ඇතිව විමර්ශන පවත්වනු ලැබේ.

2016 වර්ෂය සඳහා අදාල ජාල අංශය ආශ්‍රිත සංඛ්‍යාලේඛන පහත දැක්වෙන වගුවෙන් දැක්වේ.

විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී .ල.වි.ස.නි.කොා.සභාවට ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ හෝ ගුවන් විදුලි උපකරණ සම්බන්ධයෙන් කටයුතු කිරීමට වෙළඳ බලපත්‍ර නිකුත් කිරීමට බලය පැවරී ඇත.

වගුව - 04. 01

2015-2016 සඳහා ජාල අංශය ආශ්‍රිත සංඛ්‍යා ලේඛන

විස්තරය	**2015**	2016
නිකුත් කරන ලද මුළු වෙළඳ බලපත්‍ර සංඛ්‍යාව	851	833
ඉදි කරන ලද සමුච්චිත කුලුනු සංඛ්‍යාව	6564	6727
කුලුනු සම්බන්ධයෙන් ලැබුණු මුළු පැමිණිලි සංඛ්‍යාව	122	101
මෙහෙයවන ලද මුළු විමර්ශන සංඛ්‍යාව (කුලුනු ආශ්‍රිත)	51	55
කුලුනු සම්බන්ධ මුළු අධිකරණ නඩු සංඛ්‍යාව	2	0
පවත්වන ලද මහජනතාව දැනුවත් කිරීමේ මුළු වැඩසටහන් සංඛ්‍යාව	11	10
දෙන ලද මුළු මාදිලි අනුමැති සංඛ්‍යාව	20	20
මුළු ආනයන නිෂ්කාශන නිකුත් කිරීම් සංඛ්‍යාව	3304	4404
මුළු තනි නිෂ්කාශන කිරීම් සංඛ්‍යාව	18	25
නිකුත් කරන ලද මුළු සමුච්චිත නව කෙටි සංකේත අංක සංඛ්‍යාව	52	62

13XX පරාසයේ කෙටි සංකේත අංක භාවිතා කිරීම හඳුන්වාදීම නිසා අනුරූපී වර්ෂයේදී රාජ්‍යය සහ පෞද්ගලික දෙඅංශයේම ආයතනවල කෙටි සංකේත අංක සඳහා පවතින ඉල්ලුම ඉහල ගොස් ඇත. කෙටි සංකේත අංක පාරිභෝගිකයින් සඳහා ප්‍රශස්ත සේවාවක් සපයන අතර ඔවුන්ගේ ව්‍යාපාර ප්‍රවර්ධනය කරයි. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සඳහා නිකුත් කරන ලද කෙටි සංකේත අංකවල විස්කර පහත වගුවේ දැක්වේ.

වගුව – 04.02

2016 වර්ෂයේදී වෙන් කරන ලද කෙටි සංකේත අංක

රාජ්‍ය ආයතන සඳහා

ආයතනය	කෙටි සංකේත අංකය
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය	1917
උපායමාර්ගික ව්‍යවසාය කළමණාකරන ආයතනය	1916
කෘෂිකර්ම අමාත්‍යාංශය (කෘෂිකාර්සික හා ගොවිජන සේවා රක්ෂණ මණ්ඩලය)	1918
අධ්‍යාපන අමාත්‍යාංශය	1975
හදිසි ගිලන්රථ සේවය	1990

පෞද්ගලික අංශයේ ආයතන සඳහා

ආයතනය	කෙටි සංකේත අංක
සීමාසහිත රත්නපුර රෝහල් හා රසායනාගාර (පුද්) සමාගම	1322
සීමාසහිත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම	1343
ඩයලොග් ආසියාටා පී.එල්.සී	1369
ලින්ක් ලංකා	1314
සීමාසහිත ස්මාර්ට් ට්‍රැවල් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම	1345

එමෙන්ම විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම හා ඒ ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම ජාල අංශයට පැවරී ඇති අතර 2016 වර්ෂයේදී සමස්ථ විදුලි සංදේශ කුලුනු ඉදිකිරීම් සංඛ්‍යාව 6727 කි.

මහජනතාව විසින් කුලුනු ඉදිකිරීමට එරෙහිව ඉදිරිපත් කරන පැමිණිලි සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම ජාල අංශය විසින් ඉටුකරන වැදගත් කාර්යයකි. 2016 වර්ෂයේදී එවැනි පැමිණිලි 101 ලැබී ඇති අතර පැමිණිලි 55 ක පමණ විමර්ශනයන් සිදු කර ඇත.

ජාල අංශය විද්‍යුත් චුම්භක විකිරණ සහ අකුණු වැනි කරුණු සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම පිළිබඳව දැඩි අවධානය යොමු කරන ලදී. මෙම ක්ෂේත්‍රයේ වෘත්තිකයින්ගේ සහාය ඇතිව 2016 වර්ෂයේදී එවැනි මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 10 ක් පැවැත්වීමට හැකිවිය. වෙළඳපලේ පවතින අදාල විදුලි සංදේශ උපකරණවල ගුණාත්මකභාවය සහතික කිරීම පිණිස ජාල අංශය අවධානය යොමු කර ඇති අතර එබැවින් වෙළෙන්දන් සඳහා විදුලි සංදේශ උපකරණ වලට වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම සැලකිලිමත්ව ඉටු කරයි.

සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය

ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සීමිත ජාතික සම්පතක් වන අතර , ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට (TRCSL) , 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් පැවරී ඇති බලතල ප්‍රකාරව,නීත්‍යානුකූල බලධරයා වශයෙන් ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කිරීම සහ භූස්ථානගත චන්ද්‍රිකා කක්ෂයට අදාළ කරුණු කළමණාකරනය කිරීම සහ පාලනය කිරීමට බලය පැවරී ඇත. පනතේ 22 වන වගන්කිය ප්‍රකාරව, ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව (TRCSL) ගුවන් විදුලි සන්නිවේදන සේවා පරිහරණය කරන්නන් සඳහා බලපත්‍ර නිකුත් කිරීම, ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සංරක්ෂණය කිරීම සහ ගුවන් විදුලි සන්නිවේදන ස්ථාපනය කිරීම් මගින් නිපදවෙන විද්‍යුත් චුම්භක අවහිරතා අවම කිරීම පිණිස රීතිවල අනුකූලතාවය බලාත්මක කිරීමේ බලධාරියා වේ.

පහත සඳහන් ක්‍රියාකාරකම් සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශයේ ප්‍රධාන විෂයයන් වේ.

1. ගුවන් විදුලි සංඛ්‍යාත පරාස වෙන් කිරීම.
2. සංඛ්‍යාත පැවරීම.
3. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සඳහා අවශ්‍ය රීති, තාක්ෂණික පරාමිතීන්, සහ ප්‍රමිති ස්ථාපනය කිරීම මෙන්ම චන්ද්‍රිකා කක්ෂ භාවිතා කිරීම.
4. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය සැලසුම් කිරීම.
5. ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සඳහා තාක්ෂණික ප්‍රමිති නියම කිරීම.
6. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය නිසි පරිදි කළමණාකරනය කිරීම.
7. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පිරික්සීම සහ පාලනය කිරීම.

8. ගුවන් විදුලි පර්යන්ත උපකරණ (Radio Terminal Equipment – RTE) සඳහා අනුමැතිය ලබා දීම.
9. ගුවන් විදුලි සන්නිවේදන උපකරණ සම්බන්ධයෙන් විමර්ශන පැවැත්වීම,
10. කලාපීය සහ ජාත්‍යන්තර සම්බන්ධීකරණය සහ සහයෝගීත්වය.
11. ප්‍රධාන සංඛ්‍යාත රෙජිස්ටරය (Master Frequency Register -MFR)පවත්වාගෙනයාම.
12. නව තාක්ෂණයන් සහ සේවා සම්පාදනය කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
13. අවහිරතාවයන්ගෙන් තොරව අවසරලත් විමෝචන භාවිතා කිරීම නැසැක කිරීම.
14. ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලි ගාස්තු රැස් කිරීම.
15. ආධුනික ගුවන් විදුලි සහ ගෝලීය සමුද්‍රීය ආපදා ආරක්ෂණ පද්ධතිය (Global Maritime Distress Safety System (GMDSS) පිළිබඳ විභාග පැවැත්වීම.

කිසිම තැනැත්තෙකුට ශ්‍රී.ල.ව්.ස.නි.කොං.සභාව මගින් ලබා ගන්නා ලද වලංගු බලපත්‍රයක් රහිතව ගුවන් විදුලි සංඛ්‍යාතයක් භාවිතා කළ නොහැකි අතර බලපත්‍රයේ කොන්දේසි සේවාවෙන් සේවාවට වෙනස් වේ. මෙම කොන්දේසි කඩ කරනු ලබන අවස්ථාවලදී, නිසි ක්‍රියාමාර්ගයක් වශයෙන් උපකරණ මුද්‍රාතැබීම හෝ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම සිදු කරනු ලැබිය හැකිය. ගුවන් විදුලි තරංග සහ උපකරණ පරාමිතීන්වල ලක්ෂණ අනුව සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් සිදු කරන සේවා වර්ග කීපයකට බෙදා වෙන් කරන ලදී. පෞද්ගලික හෝ සමාගම් විසින් ආනයන නිශ්කාෂණය ඉල්ලා සිටින විට බලපත්‍රලාභී ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය පරිහරණය කරන්නන්ට බාධා කරන ගුවන් විදුලි අවහිරතාවයන් අවම කිරීම පිණිස ශ්‍රී.ල.ව්.ස.නි.කොං.සභාව විසින් එම උපකරණ නිසි ප්‍රමිතියට අනුකූලබව සහතික කරනු ලැබේ. මෙම ක්‍රමය ක්‍රියාත්මක වුවද අනුරූපී වර්ෂයේදී පරිහණය කරන්නන්ගෙන් අවහිරතා පිළිබඳ පැමිණිලි ලැබුණු අතර ඒවා හඳුනාගෙන ඒ සඳහා නිසි ක්‍රියාමාර්ග ගන්නා ලදී. නිකුත් කරන ලද සංඛ්‍යාත සහ බලපත්‍ර පිළිබඳ විස්තර, නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා, ලැබුණු අවහිරතා පිළිබඳ පැමිණිලි, සහ හඳුනාගත් අනවසර පරිහරණය කරන්නන් පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව – 04.03
වෙන් කරන ලද සංඛ්‍යාත සංඛ්‍යාව, 2015-2016

සේවාවේ වර්ගය	සංඛ්‍යාත සංඛ්‍යාව	
	2015	**2016**
ස්ථාවර සේවාව	1914	1243
විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි)	39	52
සෙලියුලර් ජංගම දුරකථන සේවාව	0	0
දත්ත / ගුවන් විදුලි දුරවේදනය	4	2
ගුවන් සහ සමුද්‍ර සේවා (i) සමුද්‍ර ජංගම සේවා (ii) ගුවන් ජංගම සේවා	 0 0	 0 0
පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව	37	42

වගුව – 04.04

සංඛ්‍යාත වර්ණාවලිය භාවිතා කරන්නන් සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව 2015-2016

සේවා වර්ගය	බලපත්‍ර සංඛ්‍යාව	
	2015	**2016**
ස්ථාවර සේවාව	**121**	**122**
විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි)	40	54
සෙලියුලර් ජංගම සේවාව	5	5
ට්‍රන්කින්/පේජින්/ සිටිසන් බෑන්ඩ්	4	7
දත්ත සහ ගුවන් විදුලි දුරවේදන සේවා	11/16	15/33
ගුවන් සහ සමුද්‍ර සේවා (i) ගුවන්යානා මධ්‍යස්ථාන (ii) නැව් මධ්‍යස්ථාන (iii) සමුදු ජංගම (iv) ගුවන් ගමන් ජංගම	 72 84 1319 4	 76 92 1112 11
පුද්ගලික ජංගම ගුවන් විදුලි සේවාව චන්ද්‍රිකා සේවාව (නව බලපත්‍ර + බලපත්‍ර අළුත් කිරීම) ආධුනික ගුවන් විදුලි	247 18 11	252 13 17

වගුව – 04.05

2016 වර්ෂයේදී ලැබුණු පැමිණිලි සහ පැවැත්වූ විමර්ශන සංඛ්‍යාව

සේවාව	ලැබුණු පැමිණිලි සංඛ්‍යාව		පැවැත්වූ විමර්ශන සංඛ්‍යාව	
	2015	**2016**	**2015**	**2016**
රූපවාහිනී සහ ගුවන් විදුලි විකාශනය	07	06	07	06
වෙනත් සේවාවන්	22	18	22	18

වගුව – 04.06

සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කරන බවට හඳුනාගත් භාවිතා කරන්නන් සංඛ්‍යාව සහ ගනු ලැබූ නිවාරණ ක්‍රියාමාර්ග, 2015 -2016

වර්ගය	හඳුනාගත් නීති විරෝධී භාවිතා කරන්නන් සංඛ්‍යාව		ගනු ලැබූ ක්‍රියාමාර්ගය
	2015	**2016**	
විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලිය)	03	03	සංඛ්‍යාත වර්ණාවලිය නීති විරෝධී ලෙස භාවිතා කිරීම වැලැක්වීමට පියවර ගන්නා ලදී.
වෙනත් සේවාවන්	00	01	

වගුව – 04.05
2015 දී නිකුත් කරන ලද නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව

සේවා වර්ගය	නිෂ්කාශන වාර්තා සංඛ්‍යාව	
	2015	**2016**
සංකේත විබෙදුම් බහුවිධ ප්‍රවේශ ඇතුළු ස්ථාවර සේවාව	654	1243
විකාශන සේවාව (රූපවාහිනී සහ ගුවන් විදුලි)	270	232
සෙලියුලර් ජංගම සේවාව (i) වෙළඳ බලපත්‍ර (ii) ජංගම ක්‍රියාකරුවන් (iii) ට්‍රන්කින් / පේජින් / සිටිසන් බෑන්ඩ් (iv) පෞද්ගලික ජංගම ගුවන් විදුලි	 5911 1308 47 812	 4933 1341 29 940
ගුවන් සහ සමුද්‍රීය සේවා (i) ගුවන්යානා මධ්‍යස්ථාන (ii) නැව් මධ්‍යස්ථාන (iii) සමුද්‍රීය ජංගම (iv)ගුවන් ජංගම හා ගුවන්යානා ගමන් හැසිරවීම	 14 14 90 7	 12 03 175 11
දත්ත සේවාව / ගුවන් විදුලි ටෙලි මෙට්‍රි	242/20	125/07
වන්දිකා සේවාව		471
ආධුනික ගුවන් විදුලි සේවාව	21	35
අඩු බලැති උපකරණ	1900	1858

අවහිරතාවයන්ගෙන් තොර ගුවන් විදුලි සන්නිවේදන සේවා සහතික කිරීම සහ අවහිරතා අනාවරණය කර ගැනීම සහ අවම කිරීම පිණිස සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය විසින් දුරස්ථව මෙහෙයවිය හැකි පද්ධතියට ප්‍රවේශ විය හැකි පරිදි සංඛ්‍යාත වර්ණාවලි ආවේක්ෂණ වාහනයක් සහිත ප්‍රාදේශීය පිරික්සුම් මධ්‍යස්ථාන කොළඹ , කදිරාන සහ මහනුවර ප්‍රදේශවල ස්ථාපනය කරන ලදී.

මේ අතරම, ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව විසින් වර්තමාන තත්ත්වයට ගැලපෙන පරිදි වැඩිදියුණු කිරීම, සංශෝධනය කිරීම, සංවර්ධනය කිරීම හෝ නවීකරණය සඳහා අවශ්‍ය වන දිගු කාලීන කරුණු කිහිපයක් සාකච්ඡා කිරීම පිණිස පියවර ගෙන ඇත. එබැවින්, සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන අංශය 2017 වර්ෂය සඳහා පහත සඳහන් සැලසුම් සහිත ක්‍රමවේදයක් සකස් කර ඇත.

1. බලාත්මක ආයතනවල අවශ්‍යතාවයන්ට මුහුණ දිය හැකි පරිදි බලපත්‍ර කොන්දේසි අළුත් කිරීම හෝ සංශෝධනය කිරීම.
2. වර්තමානයේ පවත්නා මිල ගනන් වසර 20 කට වැඩි කාලයක් පුරා සංශෝධනය කර නොමැති බැවින් එම ගාස්තු සංශෝධනය කළ යුතු වීම.
3. ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් සඳහා පූර්ව ගාස්තු ඇගයීම පිණිස ක්‍රමවේදයක් වැඩිදියුණු කිරීම.
4. වර්තමාන ගුවන් විදුලි රීති වලට සරිලන පරිදි ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය වෙන්කිරීමේ සැලැස්ම යාවත් කාලීන කිරීම.

5. වඩා ප්‍රශස්ත සේවාවක් ලබාදීම පිණිස ප්‍රමාණවත් කාර්ය මණ්ඩලය, ප්‍රමාණවත් ඉඩකඩ සහ විශේෂඥ ඥානය ලබා ගැනීම.
6. ජාත්‍යන්තර ප්‍රමිති ප්‍රකාරව පොදු ආකෘතියක් එක්කර සංසරණය වන දත්ත ඒකරාශී කිරීම පිණිස සුදුසු ප්‍රධාන ගුවන් විදුලි සංඛ්‍යාත රෙජිස්ටරයක් තිබිය යුතු වීම.

නීති අංශය

නීති ප්‍රතිපත්ති සහ නීතියේ ස්වාභාවික යුක්තියේ රීති ප්‍රකාරව ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවේ **(TRCSL)** නීති අංශය විසින් සියළුම නීති සහ නියාමන කරුණු සම්බන්ධයෙන් උපදෙස් ලබා දෙමින් කොමිෂන් සභාව වෙනුවෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම අංශය ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව පාර්ශවයක් වන සියළුම නඩු කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන අතර අධිකරණයේ පෙනී සිටී. වෙනස්වන තාක්ෂණික පරිසරය, නවෝත්පාදන, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ප්‍රවණතා සහ වර්තමාන නියාමන රාමුව නීති අංශය මුහුණ දෙන අභියෝගයන්ය. එබැවින් විදුලි සංදේශ ක්ෂේත්‍රෙය් නායාමනය බලාත්මක කිරීම පිණිස විවිධ යාන්ත්‍රණයන් සහ ක්‍රමෝපායන් අඛණ්ඩව විශ්ලේෂණය කිරීම සහ අධ්‍යයනය කිරීම අවශ්‍ය වේ.

නීති අංශය ඉටු කරන කාර්යයන් පහත දැක්වේ.

- නීතිමය මත/ උපදෙස් අවශ්‍ය කරුණු / ලේඛන සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නීතිමය මත/ උපදෙස් ලබාදීම.
- කොමිෂන් සභාව සඳහා නීති, රෙගුලාසි, නියෝග, නිර්නායකයන් සහ බලපත්‍ර කෙටුම්පත් කිරීම.
- නඩු සම්බන්ධයෙන් ගරු නීතිපති හෝ පුද්ගලික නීතීඥයින් වෙත කරුණු යොමු කිරීම.
- අධිකරණය ඉදිරියේ පවත්නා නඩු සහ අදාළ කෙටුම්පත් සැකසීම, ලිපිගොනු ඉදිරිපත් කිරීම යනාදී සියළුම කරුණු සම්බන්ධයෙන් කොමිෂන් සභාව නියෝජනය කිරීම.
- කොමිෂන් සභාව සඳහා රාජකාරී ලිපි, වෙනත් ලිපි ලේඛන, කොමිෂන් සභා පත්‍රිකා, කොන්ත්‍රාත්තු සහ ගිවිසුම් කෙටුම්පත් කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 18 අ වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රමය නැවත විකිණීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම.
- කොමිෂන් සභාවේ අනෙකුත් අංශ වලට නීති සහාය ලබාදීම සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත සහ 2004 අංක 11 දරන මුදල් පනත ප්‍රකාරව නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ ගත යුතු පියවර බලාත්මක කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත කරුණු පිළිබඳව වෙනත් ආයතන වලට නීති සහාය ලබාදීම.

- කරුණු රැසක් පිළිබඳව නියාමන තීරණ ගැනීමෙහිලා කොමිෂන් සභාවට සහායවීම පිණිස කමිටු සහ සාකච්ඡා වලට සහභාගි වීම.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම්වල නඩු රැසක් විමර්ශනය කිරීම පිණිස නීති බලාත්මක කිරීමේ බලධාරියා වශයෙන් සහායවීම.

සංඛ්‍යාත සඳහා බලපත්‍ර දීම, වෙළඳ බලපත්‍ර දීම,අයක්‍රම, අනුකූලතා ගැටළු,පාරිභෝගිකයන් දැනුවත් කිරීමේ කරුණු සහ අභ්‍යන්තර නීතිමය කටයුතු වැනි කරුණු සම්බන්ධයෙන් නීතිමය සහාය සහ උපදෙස් අවශ්‍ය වේ. 2016 වර්ෂයේදී , අවස්ථා ගණනාවකදී නීති අංශය විසින් නියාමන පියවර ගෙන ඇත. ගුවන් විදුලි සංඛ්‍යාත, බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ටකිරීම්, බලපත්‍ර ලබාදීම මෙන්ම රීති හා උපදෙස් වලට අනුකූලව කටයුතු නොකිරීම සහ මුදල් අයකර ගැනීම ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් මහාධිකරණයේ, අභියාචානධිකරණයේ, දිස්ත්‍රික් උසාවියේ සහ වෙළඳ අධිකරණයේ නඩු පවරා ඇත. කම්කරුවන් ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාව, කර්මාන්ත අධිකරණය සහ මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ නඩු පවරා ඇත. එමෙන්ම විදුලි සංදේශ පනත උල්ලංඝනය කරන අවස්ථා වලදී නීති අංශය විසින් නඩු පැවරීම සිදු කර ඇත. උසාවි නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පොලිස් විමර්ශන වලට සහාය ලබාදීම අරභයා කටයුතු කිරීමේ වර්ධනයක් දක්නට ඇත.

අනුකූලතා අංශය

පාරිභෝගික පැමිණිලි සහ මහජනතාව දැනුවත් කිරීමේ ඒකකය

ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවිධිමත් විදුලි සංදේශ සේවා සම්බන්ධයෙන් ඕනෑම සේවා සැපයුම්කරුවකුට එරෙහිව පැමිණිලි කිරීමට ග්‍රාහකයකුට අවස්ථාව සැලසේ. එමෙන්ම ග්‍රාහකයන්ට එම පැමිණිල්ලට හේතු වන කාරණය නිවැරදි කර ගැනීමට හෝ මුදල් සහන ලබාගැනීමට හැකිවේ. මේ සම්බන්ධයෙන් සේවා සැපයුම්කාර සමාගම්වල විෂම ක්‍රියාවන් සමථයකට පත් කිරීම මෙන්ම ග්‍රාහකයන්ගේ ගැටළු සාකච්ඡා කිරීම පිණිස ශ්‍රී.ල.වි.ස.නි.කොා. සභාවේ අනුකූලතා අංශය අදාල නිසි ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කර ඇත.

එක් පියවරක් වශයෙන්, අනුකූලතා අංශය විසින් අනුරූපී පැමිණිලි කඩිනමින් මෙහෙයවන අතර දෙපාර්ශවයම එකඟ වන විසඳුමක් ගෙන දෙන පරිදි කරුණු නිවැරදි කිරීම පිණිස එම පැමිණිලි සේවා සැපයුම්කාර සමාගම් වලට යොමු කරයි. තවත් වැදගත් සේවාවක් වන අස්ථානගතවූ ජංගම දුරකථන සොයාදීමේ ක්‍රියාවලියේදී මහජනතාවට සහායවීම ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවේ සමාජයීය වගකීමකි. අස්ථානගතවූ දුරකථන පිළිබඳ පැමිණිලි 250 ක් සාමාන්‍යයෙන් දෛනිකව ලැබෙන අතර පොලීසියේ සහාය ඇතිව එලෙස අස්ථානගතවූ දුරකථන රැසක් සොයාදීමට හැකි වී ඇත. ඒ අතරම ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව මෙරටේ මහජනතාවට දුරකථන භාවිතා කිරීම මෙන්ම වෙනත් ආශ්‍රිත කරුණු පිළිබඳව නිසි දැනුවත් කිරීමේ වැඩසටහන් අවශ්‍ය වන බව විශ්වාස කරයි. මෙම කරුණ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පිණිස පොලිස් නිලධාරීන් සහ වෙනත් අදාල රාජ්‍ය නිලධාරීන් ආවරණය කරමින් අනුකූලතා අංශය විසින් 2016 වර්ෂයේදී දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පවත්වා ඇත. විදුලි

සංදේශ කරුණු සම්බන්ධ කටයුතුවල සෘජුවම නිරතවන පොලිස් නිලධාරීන් සඳහා එක් දින වැඩමුළුවක් මෙම අංශය විසින් මෙහෙයවා ඇති අතර වර්ෂය තුළ මෙවැනි වැඩමුළු හයක් පවත්වා ඇත. 2016 වර්ෂයේදී මෙම විෂයය සම්බන්ධ දේශන කටාන, කළුතර ,මිරිහාන පොලිස් විද්‍යාලවල සහ කොළඹ විශේෂ කාර්ය බලකාය සහ යුධහමුදා නිලධාරීන් සඳහා පවත්වා ඇත.

ග්‍රාම නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් වැනි ප්‍රජාව සමඟ සෘජු සම්බන්ධතා පවත්වන සහ පණිවුඩ දැනුම් දිය හැකි වෙනත් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සුදුසු නිලධාරීන් වශයෙන් සැලකෙන අතර එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් 66 ක් පමණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වා ඇත.

දැනුවත් කිරීමේ වැඩසටහන්වල කොටසක් වශයෙන් ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව 2016 වර්ෂයේදී දළ වශයෙන් පුවත්පත් ලිපි 100 ක් ප්‍රසිද්ධ කිරීමට හැකි වී ඇත. මේ කාරණය සම්බන්ධ මූලික තොරතුරු සහ නීති රාමුව පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම පිණිස රූපවාහිනී වැඩසටහන් විකාශනය කර ඇත. එමෙන්ම දුරකථන මෙන්ම සන්නිවේදනය සදාචාර සම්පන්නව භාවිතා කිරීම පිළිබඳව දැනුවත් කිරීම සඳහා ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් අත්පත්‍රිකා සහ පෝස්ටර බෙදා හැර ඇත. එමෙන්ම ශ්‍රී.ල.වි.ස.නි.කොා. සභාව පාරිභෝගික හිතකාමී පරිසරයක් නිර්මාණය කිරීම පිණිස පාරිභෝගික ආරක්ෂණ නිර්නායකයන් පිළියෙල කිරීමේ නිරත වී ඇත.

2016 වර්ෂය සඳහා අනුකූලතා අංශයේ ප්‍රගතිය දැක්වෙන ප්‍රස්ථාරයක් පහත දැක්වේ.

වගුව - 04.08
අනුකූලතා අංශයේ ප්‍රගතිය - 2016

	අරමුණ		ක්‍රියාකාරකම	විස්තර	වර්තමාන ප්‍රගතිය
1	සමාජයීය සහ වාණිජමය ප්‍රතිලාභ සඳහා විදුලි සංදේශ පහසුකම් සැපයීම පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම	1.1.	දැනුවත් කිරීමේ වැඩසටහන්	1. පොලිස් නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	90%
				2. ග්‍රාම නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්	
				3. පොලිස් නිලධාරීන් පොලිස් අභ්‍යාස විද්‍යාලය	
				4. රජයේ කාර්යාල	
		1.2.	රූපවාහිනී / ගුවන් විදුලි වැඩසටහන්		
		1.3.	පුවත්පත්		
		1.4.	දැන්වීම් / නිවේදන	අධ්‍යක්ෂ ජනරාල්වරයාට භාරදීම	
		1.5.	පෝස්ටර් / අත්පත්‍රිකා		
2	පාරිභෝගික ආරක්ෂණය සහතික කිරීම	2.1	නිර්නායකයන් පිළියෙල කිරීම	ක්‍රියාත්මක වෙමින් පවතී	95%
		2.2	නිර්නායකයන් ක්‍රියාත්මක කිරීම	ක්‍රියාත්මක වෙමින් පවතී	
		2.3	පවත්නා පාරිභෝගික ආරක්ෂණය	සම්පූර්ණ කර ඇත	
3	පාරිභෝගික පැමිණිලි නිරාකරණය කිරීම			අඛණ්ඩව ක්‍රියාත්මක වේ	90%

සේවා තත්ත්ව සහ ආවේක්ෂණ

සේවා තත්ත්ව (QOS) ඒකකය

කාර්යයන්

- පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම්වල අන්තර්සම්බන්ධිය ගිවිසුම් සහ බලපත්‍රයේ සඳහන් සේවා තත්ත්ව ප්‍රමිති පිලිපදින්නේදැයි පිරික්සීම.
- පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම්වල ජාල කාර්යසාධනය සඳහා ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් නියම කරන සේවා තත්ත්ව පරාමිති ඉලක්ක අගයන්වල සාක්ෂාත්භාවය පිරික්සීම.
- හඬ සේවා සඳහා පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් විසින් මිනුම්ගත කරන ලද සේවා තත්ත්ව පරාමිති අගයන් සහ ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් ගණනය කරන ලද අගයන් අතර සන්සන්දනාත්මක වාර්තාවක් පිළියෙල කිරීම.
- කාර්යසාධන මිනුම්වල නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම සහ දැනගැනීම සඳහා සන්සන්දනාත්මක වාර්තාව පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් අතර බෙදාහැරීම.
- කාලානුරූප විගණනයන් සිදු කිරීම මගින් පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් විසින් සකස් කරන ලද සේවා තත්ත්ව කාර්යසාධන මිනුම්වල නිරවද්‍යතාවය ඇගයීම.

2016 වසරේදී සිදු කරන ලද ක්‍රියාකාරකම්/කාර්යයන්

- පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් වෙතින් ලැබෙන මාසික සේවා තත්ත්ව වාර්තා ඉදිරිපත් කිරීම විශ්ලේෂණය කිරීම සහ අවශ්‍ය අවස්ථා වලදී සේවා තත්ත්ව පරාමිතීන් වැඩිදියුණු කිරීම පිණිස ඔවුන් සමඟ සාකච්ඡා පැවැත්වීම.
- 2015 වර්ෂයේ තෙවන කාර්තුව සඳහා සන්සන්දනාත්මක වාර්තා පිළියෙල කිරීම සහ කාර්යසාධන මිනුම්වල නිරවද්‍යතාවය වැඩිදියුණු කිරීම සහ දැනගැනීම සඳහා සන්සන්දනාත්මක වාර්තාව පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් අතර බෙදාහැරීම.
- පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් විසින් ජාල කවුළුව මගින් කාර්යසාධන මිනුම් දත්ත ලබාගැනීම සහ ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් දෙන ලද සූත්‍රය ප්‍රකාරව ගණනය කිරීම මෙන්ම, සේවා තත්ත්ව පරාමිතීන් ලෙස නැවත වාර්තා කිරීම . ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් දුරකථන ක්‍රියාකාර සමාගම්වල ජාල අධීක්ෂණය කරන අතර සේවා තත්ත්ව පරාමිතීන් ගණනය කිරීම පිණිස ජාල කවුළු වෙතින් ලැබෙන සකස් නොකරන ලද දත්ත සහ ගණනය කිරීමේ ක්‍රමවේද නැවත ඇගයීම.

ආවේක්ෂණ ඒකකය

කාර්යයන්

- 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් නිකුත් කළ බලපත්‍ර නියමයන් සහ කොන්දේසි වලට අනුකූලව පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් කටයුතු කරන බව පිරික්සීම.
- බලපත්‍රලාභී පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ ලබාදීම පාලනය කිරීම පිරික්සීම, විශ්ලේෂණය කිරීම සහ නියාමන ක්‍රියාමාර්ග අනුමත කිරීම.
- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් නීති විරෝධී ලෙස දුරකථන ඇමතුම් අවසන් කිරීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සහ අවශ්‍යයැයි හැඟෙන පරිදි සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීම.
- බලපත්‍රලාභී වෙළෙන්දන් විසින් අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීම පිළිබඳ විමර්ශන පැවැත්වීම සහ බලපත්‍රයේ නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කිරීම පිළිබඳව අනාවරණය වන්නේ නම් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගැනීම.
- ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් නිකුත් කළ වෙළඳ බලපත්‍රයක් රහිතව වෙළෙන්දන් විසින් නීති විරෝධී ආකාරයෙන් විදුලි සංදේශ උපකරණ විකිණීම පිරික්සීම සහ විමර්ශන පැවැත්වීම මෙන්ම කිසියම් නීති විරෝධී ක්‍රියාවන් මත අවශ්‍යයැයි හැඟෙන පරිදි සුදුසු නියාමන ක්‍රියාමාර්ග ගැනීම සිදු කිරීම.

2016 වර්ෂයේදී සිදු කරනලද ක්‍රියාකාරකම්/කාර්යයන්

- බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් නීති විරෝධී ආකාරයෙන් ඇමතුම් අවසන් කිරීම පිළිබඳ පැමිණිලි 98 සම්බන්ධ විමර්ශන සම්පූර්ණ කිරීම.
- වෙළෙන්දන් විසින් මාදිලි අනුමත නොකරන ලද විදුලි සංදේශ උපකරණ විකිණීමේ අවස්ථා 04 පිළිබඳ විමර්ශන සම්පූර්ණ කිරීම.
- දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් අනුමත නොකරන ලද අයක්‍රම පැකේජ ලබාදීමේ අවස්ථා 43ක් පිළිබඳව විමර්ශන පැවැත්වීම.

අධිවේගී අන්තර්ජාල සේවා ඒකකය

කාර්යයන්

ගුණාත්මකවූ අධිවේගී අන්තර්ජාල සේවා පිළිබඳ ලක්ෂණ විග්‍රහ කිරීමේදී වේගය පොදු මිනුම් ඒකකයක් වශයෙන් පිලිගෙන ඇත. විදුලි සංදේශ ක්ෂේත්‍රයේ නියාමකයා වශයෙන් , ශ්‍රී .ල.වි.ස.නි.කොා.සභාව සිය ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇති අතර, එමගින් පාරිභෝගිකයන් සඳහා ගුණාත්මක අධිවේගී අන්තර්ජාල සේවා සැපයීම තුලින් නිරවද්‍ය තොරතුරු සැපයීමට අපේක්ෂා කෙරේ. නිරවද්‍ය තොරතුරු පිළිබඳව අවධානය යොමු කිරීමේදී එය

දෙවර්ගයක් වන අතර , පළමුවැන්න පාරිභෝගික ආරක්ෂණය වන අතර දෙවැන්න වන්නේ එම තොරතුරු සේවා තරඟකාරිත්වය හමුවේ සිය අධිවේගී අන්තර්ජාල සේවා වැඩිදියුණු කර ගැනීමට සැපයුම්කාර සමාගම් දිරිගැන්වීමයි.

මෙම සන්දර්භය තුළ, ශ්‍රී .ල.වි.ස.නි.කොා.සභාව වෙනුවෙන් මොරටුව විශ්ව විද්‍යාලය භාගත කිරීමේ වේගය ප්‍රකාරව අධිවේගී අන්තර්ජාල සේවා ඇගයීම සිදු කිරීමට හැකි වන පරිදි මෙවලමක් සැලසුම් කර ඇත. මෙම මෙවලම සංරචකයන් දෙකකින් සමන්විත වේ.

1. පාරිභෝගිකයින් විසින් ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවේ වෙබ් අඩවිය ඔස්සේ වේගය මැනීම බාගත කිරීම (the On-line Speed Test – MySpeed)
2. ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් භාවිතා කරන අධිවේගී අන්තර්ජාල සේවා වේග පිරික්සීම බාගත කිරීම (ISP’s Internet Speed Test – NetSpeed)

ඉහත භාවිතාවන් සහ අවශ්‍යතාවයන්ට පහසුකම් සැලසීම පිණිස වෙන් වෙන්වූ වෙබ් පාදක යෙදුම් දෙකක් ක්‍රියාත්මක කෙරේ. ReST (Representational State Transfer) service on Node.js , a server side platform built on Google Chrome’s JavaScript Engine (V8 Engine)

ජාල යෙදුම් නිසි ලෙස පවත්වාගෙනයාමේ පහසුකම් සැලසීමෙහිලා Node.js පහත ලක්ෂණ වලින් සමන්විත වේ.

- Asynchronous and event- driven
- Rich library of various JavaScript modules
- Very fast in code execution
- Single Threaded but Highly Scalable

මෙම සේවා දායකය භාවිතා කිරීම සඳහා HTML 5 enabled web browser අවශ්‍ය වේ.

අන්තර්ජාල සම්බන්ධතාවයේ වේගය මැනීමේ වෙබ් යෙදුම් සඳහා සිංගප්පූරුවේ ස්ථාපනය කරන ලද ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව සතු වෙබ් සර්වරයෙන් පහසුකම් සපයනු ලැබේ. දත්ත සමුදාය සම්බන්ධ සර්වරය සඳහාද එම සර්වරය මගින් පහසුකම් සැපයේ. විවිධ ප්‍රමාණවල බාගත කළ හැකි පොදු නමක් යටතේ ගොනුවූ දත්ත සිංගප්පූරුවේ සත්කාරක සර්වරය, ඇමරිකා එක්සත් ජනපදයේ සහ නෙදර්ලන්තයේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතු වෙබ් සර්වර් යනාදී වශයෙන් විවිධ ස්ථාන තුනක පවතී.

“MySpeed” යෙදුම් ක්‍රමලේඛයේ ප්‍රධාන අරමුණ වන්නේ අන්තර්ජාල සේවා පරිහරණය කරන්නන්ට සිය සම්බන්ධතාවයේ වේගය මැනීම පිණිස අවස්ථාව සලසා දීමයි. පරිහරණය කරන්නන්ට සිය කැමැත්ත අනුව පොදු නමක් යටතේ ගොනුවූ දත්ත බාගත කර ගත හැකිය. සිය අන්තර්ජාල පුළුල් කළාප වේගය මැනීමට අවශ්‍ය අවසාන පරිහරණය කරන්නාට ශ්‍රී. ල.වි.ස.නි.කොා.සභාවේ නිල වෙබ්

අඩවියේ (www.trc.gov.lk) දැක්වෙන වේග පරීක්ෂණ කේතය ක්ලික් කර කිසියම් web browser මගින් හෝ වේග පරීක්ෂණ භාවිතය URL (http://speedtest.trc.gov.lk) සෘජුවම ප්‍රවේශවීමෙන් මෙම යෙදුම් ක්‍රමලේඛය භාවිතා කළ හැකිය.

“Net Speed” සියළුම අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් (ISP) විසින් සපයන අන්තර්ජාල සම්බන්ධතාවල වේගය මැනීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ. මෙම යෙදුම් ක්‍රමලේඛය ක්‍රමානුකූල කාල අන්තරයකදී ස්වයංක්‍රීයව පවත්වාගෙන යාමට අවශ්‍ය නිසා අවම මිනිස් අන්තර් ක්‍රියාකාරිත්වයකින් යුතුව පවත්වාගෙන යාම පිණිස සැලසුම් කෙරේ. මෙම යෙදුම් ක්‍රමලේඛයේ මූලික නිර්මිතය “MySpeed” යෙදුම් ක්‍රමලේඛයට සමාන වන අතර යෙදුම් ක්‍රමලේඛය හා දත්ත සමුදාය උදෙසා පහසුකම් සැලසීමේදී සමාන ක්‍රම භාවිතා කරයි. කෙසේවුවද, Net Speed ක්‍රමලේඛක අන්තර්ජාල සේවා සැපයුම්කරුවන් ලබාදෙන විශේෂ පරිගණක / ලැප්ටොප් මගින් පවත්වාගෙන යනු ලැබේ. මෙම යෙදුම් ක්‍රමලේඛය පූර්ව නිශ්චිත පිහිටීමක සිට පූර්ව නිශ්චිත ගොනුවක් බාගත කිරීමෙන් browser එකක් මගින් පවත්වාගෙන යාමට නිර්මාණය කරනු ලැබේ. මෙම browser ක්‍රමානුකූල අන්තරයකදී යෙදුම් ක්‍රමලේඛය පවත්වාගෙන යාමට සකස් කරනු ලැබේ. URL, සත්කාරක සර්වරයේ අන්තර්ජාල මූලලේඛ ලිපිනය හා පූර්ව නිශ්චිත මෘදුකාංග පරිගණනගත කිරීම යන දෙකම අන්තර්ගතවේ. එම මෙහෙයුම් කාලය තුළදී, බාගත කරන ගොනුව ආශ්‍රිත සංඛ්‍යා ලේඛන හා අන්තර්ජාල වේගය දත්ත සමුදායේ තැන්පත් වේ. පරීක්ෂණ ප්‍රතිඵල දෛනිකව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ (www.trc.gov.lk) දැක්වේ.

ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය

ශ්‍රී .ල. වි.ස.නි.කොා.සභාවේ ප්‍රතිපත්ති, ජාත්‍යන්තර සම්බන්ධතා සහ බලපත්‍ර පරිපාලන අංශය විදුලි සංදේශ ක්ෂේත්‍රය ආශ්‍රිත ප්‍රතිපත්ති සම්පාදනය කරන අතර දේශීය සහ ජාත්‍යන්තර නියාමන කටයුතු සඳහා කොමිෂන් සභාවට සහාය වේ. මෙම අංශය විසින් විදුලි සංදේශ සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල නව තාක්ෂණය භාවිතා කිරීම සහ සංවර්ධනය කිරීමෙහිලා පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය ඉටු කිරීම පිණිස අදාල විශ්ව විද්‍යාලවල සහාය ඇතිව පර්යේෂණ අධ්‍යයන සැලසුම් කිරීම සහ සංවිධානය කිරීමෙහිලා නිරතවේ. මේ සම්බන්ධයෙන් ජාත්‍යන්තර සංවිධාන සහ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව විදුලි සංදේශ සංවර්ධන ව්‍යාපෘති රැසක් සිදු කර ඇත. මෙම ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් , මෙම අංශය ජාත්‍යන්තර ක්‍රියාකාරකම් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට සහාය වේ.

මෙම අංශයේ කාර්යයන් පහත දැක්වේ,

ප්‍රතිපත්ති

1. විදුලි සංදේශ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය උපදෙස් ලබාදීම.
2. අදාල ආයතනවල සහයෝගීත්වයෙන් පර්යේෂණ අධ්‍යයන සිදු කිරීම.
3. ව්‍යාපෘති

ජාත්‍යන්තර සම්බන්ධතා

1. ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවේ ජාත්‍යන්තර සහභාගීත්වයන් සම්බන්ධීකරණය කිරීම.
2. ජාත්‍යන්තර තොරතුරු අභ්‍යන්තර වශයෙන් බෙදාහැරීම.
3. දේශීය සහ ජාත්‍යන්තර සංවිධාන වලින් තොරතුරු එක්රැස් කර ගැනීම.
4. ජාත්‍යන්තර සංවිධාන වලට අදාල තොරතුරු සැපයීම.

බලපත්‍ර පරිපාලනය

1. බලපත්‍ර සම්බන්ධයෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ක්‍රියාත්මක කිරීම.
2. බලපත්‍ර අයදුම්පත්‍ර ඇගයීම.

ප්‍රතිපත්තිමය කරුණු සහ තාක්ෂණයේ නවෝත්පාදනවලින් ප්‍රශස්තව සම්බන්ධවූ ශ්‍රී ලංකාවක් දැකීම අරභයා ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව ‘‘ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රතිපත්ති’’, ‘‘ජාතික අධිවේගී අන්තර්ජාල සේවා සැලැස්ම’’ සහ ‘‘ උපායමාර්ගික සැලැස්ම’’ සකස් කිරීමේ අවශ්‍යතාවය අධ්‍යයනය කිරීම පිණිස කමිටුවක් පත් කර ඇත. මෙය ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රවීනයන්, පාර්ශවකරුවන්ගේ උපදෙස් සහ මෙම කාර්යය පිළිබඳ වැඩමුළුවල සහාය ඇතිව සිදු කරන ලදී. මෙලෙස ශ්‍රී.ල.වි.ස.නි.කොා. සභාව විසින් ශ්‍රී ලංකාවේ ජාතික අධිවේගී අන්තර්ජාල සේවා ප්‍රතිපත්තිය පිළියෙල කිරීමට මූලික කටයුතු ආරම්භ කර ඇත.

ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් කරන ලද ඉල්ලීමක ප්‍රතිඵලයක් වශයෙන්, බලපත්‍රලාභී දුරකථන ක්‍රියාකාර සමාගම් වලට අවශ්‍ය දායකත්වය ලබා ගැනීම මෙන්ම නව ජාත්‍යන්තර ප්‍රවණතා වලට අවධානය යොමු කරමින් බලපත්‍ර රාමුව වැඩිදියුණු කිරීමට ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) සහාය වී ඇත. මෙම ක්‍රියාමාර්ගය තුලින් ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ආයෝජන දිරිගැන්වීම, දුරකථන ක්‍රියාකාර සමාගම් අතර ඵලදායී ආකාරයෙන් තරඟකාරිත්වය ප්‍රවර්ධනය කිරීම, පවත්නා තාක්ෂණය භාවිතා කතිරීම තුලින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකි විය.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) / ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහායක ව්‍යාපෘතියක් වන ‘‘පාසල හා ප්‍රජාව සම්බන්ධීකරණය කිරීමේ ව්‍යාපෘතිය’’ මගින් දුරකථන සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම ව්‍යාපෘතිය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පහසුකම් අඩු ප්‍රදේශවල පාසල් ශිෂ්‍යයන් සහ විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යාන්ට සහාය වීමට ක්‍රියාත්මක කර ඇති අතර එමගින් ශිෂ්‍යයන් 8560 සහ පාසල් 33 ප්‍රතිලාභ ලැබූහ. මෙම සමීක්ෂණය තුලින් ව්‍යාපෘතිය ආශ්‍රිත ගැටළු හඳුනාගන්නා ලද අතර එහි ඇතැම් තීරණ මුහුණපෑ ගැටළු නිරාකරණය කර ගැනීමට ඉවහල් විය. ඌන සංවර්ධිත ප්‍රදේශ සඳහා අන්තර්ජාල සම්බන්ධතා සැපයීම, අන්තර්ජාල බිල්පත් ගෙවීමේ නිසි

යාන්ත්‍රණයක් නොතිබීම මුහුණපෑ ඇතැම් ගැටළු වන අතර පළාත් අධ්‍යාපන බලධාරීන්ගේ සහාය ඇතිව මෙම ගැටළු නිරාකරණය කිරීම පිණිස වැඩපිළිවෙලක් සලසන ලදී.

ආයතනයේ ප්‍රතිපත්ති, නියාමන සහ තාක්ෂණික විෂයය ක්ෂේත්‍ර ඔස්සේ ප්‍රධාන විෂයය ධාරාවක් වන විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් පිළිබඳ ගැටළු සාකච්ජා කිරීම පිණිස ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU) විසින් " විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන් සඳහා අන්තර්ජාලයට ප්‍රවේශවීමේ" විවෘත උපදේශනයක් සිදු කර ඇත. වගකිවයුතු ආයතනයක් වශයෙන් , ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව ජිනීවාහීදී පවත්වන ලද "සංගම් කාර්ය කණ්ඩායම - Council Working Group - CWG" සඳහා වීඩියෝ සම්මන්ත්‍රණ මගින් අවශ්‍ය දායකත්වය ලබාදී ඇත. එමෙන්ම ශ්‍රී.ල.වි.ස.නි.කොා. සභාවේ ඉල්ලීමට ප්‍රතිචාරයක් වශයෙන් දේශීය පාර්ශවකරුවන් සිය අදහස් දක්වමින් මාර්ගගත විවෘත උපදේශනයට දායක වන ලදී.

ශ්‍රී ලංකාවේ විශේෂ අවශ්‍යතා සහිත තැනැත්තන්ගේ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දැනුම සහ නිපුණතාවය වැඩිදියුණු කිරීම පිණිස, ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව (TRCSL) විසින්" ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ කොරියාවේ ජාතික තොරතුරු තාක්ෂණ නියෝජිතායතනය සහයෝගීත්වයෙන් "ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ජාතික තොරතුරු තාක්ෂණ නියෝජිතායතනයේ ජාත්‍යන්තර තොරතුරු තාක්ෂණ ස්වේච්ජාදායකයින්ගේ (IIV) වැඩසටහන සම්බන්ධීකරණය කරන ලදී. කොරියානු ස්වේච්ජාදායක තොරතුරු තාක්ෂණ පුහුණු කණ්ඩායම් තුන කොරියානු ශිෂ්‍යයන් 12 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන් පිටකෝට්ටේ සෙවන විශේෂ පාසල ,මත්තේගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, රත්මලාන කොතලාවලපුර මහා විද්‍යාලයේ විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
මෙම තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ වැඩසටහනේ විෂයය මාලාව Adobe Photoshop, Adobe Illustrator, Video editing, Ms office, Database සහ Web developemnt යන විෂයයන්ගෙන් සමන්විත වූ අතර පුහුණු වැඩසටහන අවසානයේදී ශිෂ්‍යයන් සහ ගුරුවරුන් කොටසකගේ දැනුමේ සැලකිය යුතු වර්ධනයක් විද්‍යාමාන වූහ.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් කලාපය තුළ රටවල් අතර "e - කෘෂිකාර්මික ක්‍රමෝපායන්" පිළිබඳ නිර්නායකයන් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු රට වශයෙන් ශ්‍රී ලංකාව තෝරාගෙන තිබීම නිසා ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවේ සහාය ඇතිව, "e - කෘෂිකාර්මික ක්‍රමෝපායන්" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී. මේ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සාමාජිකයන්ගෙන් සමන්විත කාර්යසාධන බලකායක් ස්ථාපනය කරන ලදී. එමෙන්ම

ස්ථාවර සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් මෙම අවස්ථාවට එක්වූ අතර ශ්‍රී ලංකාවේ ආහාර හා කෘෂිකර්ම සංවිධාන කාර්යාලය මගින් සහාය ලබාදෙන ලදී. මෙම ක්‍රමෝපායන් ශ්‍රී ලංකා රජය විසින් අනුමත කර ඇති අතර ‘‘e- කෘෂිකාර්මික ක්‍රමෝපායන්’’ පිළිබඳ වැඩමුළුව ක්‍රියාත්මක කිරීම ආහාර හා කෘෂිකර්ම සංවිධානය, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදී.

2016 අනුරූපී වර්ෂය තුළ ලොව පුරා විශ්ලේෂී ක්‍රම යොදා ගන්නා රාජ්‍ය, ජාත්‍යන්තර සංවිධාන, බැංකු සහ පෞද්ගලික අංශය විසින් පුළුල්ව භාවිතා කරන දර්ශකයක් වන ගෝලීය තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සංවර්ධන දර්ශකය භාවිතා කිරීම සහ වැඩිදියුණු කිරීම පිණිස ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ලෝක සන්නිවේදනය/තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දර්ශක ප්‍රශ්නාවලිය සහ ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශක ප්‍රශ්නාවලිය පිළිබඳව සමීක්ෂණයක් සිදු කිරීමට හැකිවූ අතර ලෝක විදුලි සංදේශ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ දර්ශක දත්ත සමුදායට, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සහ ලෝක බැංකු ප්‍රකාශන වලට යාවත්කාලීන කරන ලද දත්ත සපයන ලදී.

සයිබර් ආරක්ෂණය පිළිබඳව රටේ වගකීම මැන බැලීමේ අපේක්ෂාව සහ නීති, තාක්ෂණය, සංවිධානමය, ධාරිතාවය සහ ආයතනික ක්‍රියාමාර්ග ආවරණය වන ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශක ප්‍රශ්නාවලිය පරිගණක හදිසි සූදානම් කණ්ඩායම සහ ටෙක් පරිගණක හදිසි සූදානම් කණ්ඩායමේ සහයෝගීත්වයෙන් පවත්වන ලද අතර ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයට ඉදිරිපත් කරන ලදී.

2016 වසරේදී ලෝක විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ දිනයේ තේමාව ‘‘සමාජ බලපෑම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යවසායකත්වය’’ යන්න වූ අතර මෙදින සිය 151 වෙනි සංවත්සරය සාමාජික රටවල සහයෝගීත්වයෙන් සමරන ලද අතර තේමාව පිළිබඳව මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍ය ඔස්සේ මහජනතාව දැනුවත් කරන ලදී. අතිගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා, විදුලි සංදේශ සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණ අමාත්‍යතුමා, ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ මහලේකම්වරයා සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද විශේෂ පණිවුඩ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරන ලදී. තොරතුරු තාක්ෂණ විෂයය පිළිබඳව කැමැත්තක් දක්වන පාසල් හැරගිය වූවන් සඳහා වැඩමුළුවක් ජ්‍යෙෂ්ඨ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් මෙහෙයවන ලදී.

තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණයේ සාර්ථක වෘත්තිකයකු වීම පිණිස ඩිජිටල් නිපුණතාවයේ වැදගත්කම පිළිබඳව ගැහැණු දරුවන් සහ කාන්තාවන් සඳහා තවත් ප්‍රයෝජනවත් වැඩසටහනක්

අධ්‍යාපන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ඒකාබද්ධ ප්‍රයත්නයක් වශයෙන් නැගෙනහිර පළාතේ හැර සෙසු සියළුම පළාත්වල පවත්වන ලදී.

2016 වසරේදී ඇතිවූ ගංවතුර සහ නායයෑම් නිසා විදුලි සංදේශ රැහැන් පද්ධති සහ මහාමාර්ග වලට හානි සිදුවීම නිසා ඒ සම්බන්ධ සහන මෙහෙයුම් වෙනුවෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිලධාරීන් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සම්බන්ධීකරණය ඇතිව හදිසි විදුලි සංදේශ උපකරණ බෙදා හරින ලදී. චන්ද්‍රිකා දුරකථන, අධිවේගී අන්තර්ජාල සේවා චන්ද්‍රිකා පර්යන්ත සහ අමතර කොටස් ආපදා කළමණාකරන මධ්‍යස්ථාන වලට භාර දෙන ලදී.

වෙනත් ආයතන විසින් අපගේ යෝජිත කක්ෂ කොටස් වලට අවහිරතාවයන් ඇතිකිරීම වැලැක්වීම පිණිස ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ සහයෝගය ඇතිව චන්ද්‍රිකා නිවේදනය / සම්බන්ධීකරණය සිදු කරන ලද අතර බලපෑම් ඇති කරනු ලබන ආයතන සම්බන්ධයෙන් ගුවන් විදුලි රීති ප්‍රකාරව නිවේදනය කරන ලදී.

ජාත්‍යන්තර විදුලි සංදේශ සංවිධාන , වෙනත් ඒ සම්බන්ධ ආයතන සඳහා සාමාජිකත්ව දායක මුදල් ගෙවීම මගින්, ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මානව සම්පත් සහ තාක්ෂණය යන දෙඅංශයේම ධාරිතාවය ගොඩනැංවීම පිණිස විදේශීය ශිෂ්‍යත්ව අවස්ථා තාක්ෂණික සහාය, පුහුණු වැඩසටහන්, ව්‍යාපෘති වැඩසටහන් වැනි බොහෝ ප්‍රතිලාභ ලබා ගන්නා ලදී. 2016 වර්ෂය තුළ දක්වන ලද දායකත්වය පහත දැක්වෙන වගුවේ දැක්වේ.

වගුව – 04.09
2016 වර්ෂය සඳහා වාර්ෂික සාමාජිකත්ව දායක මුදල් ගෙවීම

ආයතනයේ නම	දායක මුදල (ශ්‍රී ලංකා රුපියල් වලින්)
ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය (ITU)	22,317,680.62
ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමය (APT)	2,080,912.20
පොදු රාජ්‍ය මණ්ඩලීය විදුලි සංදේශ සංගමය (CTO)	4,228,300.30
යටිතල පහසුකම් නියාමනය පිළිබඳ දකුණු ආසියානු සමුළුව (SAFIR)	545,610.71
එකතුව	**29,172,503.83**

මෙම අංශය විසින් විදුලි සංදේශ නියාමන කටයුතු, පුහුණු කටයුතු, විශේෂඥ සහාය, විශේෂ අවස්ථා සහ අනුග්‍රාහකත්වයෙන් පැමිණෙන විදේශීය නියෝජිතයන් සම්බන්ධීකරණය කරයි.

සෘජු ගෘහස්ථ චන්ද්‍රිකා සේවා - Direct To Home (DTH) Satellite Services, ස්ථාවර රැහැන් රහිත බලපත්‍ර, වෙනත් බලපත්‍ර සඳහා 2016 වසරේදී නව බලපත්‍ර නිකුත් කිරීම, බලපත්‍ර අළුත් කිරීම, සහ අයදුම්පත් ක්‍රියාවලිය පහත දැක්වේ.

සීමාසහිත හවිසන් ටෙලිකොමියුනිකේෂන්ස් (පෞද්ගලික) සමාගමේ බාහිර ප්‍රවේශ දුරකථන ක්‍රියාකරු බලපත්‍රය අළුත් කරන ලදී.

පහත සඳහන් බලපත්‍ර අළුත්කිරීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතී.

සීමාසහිත සතිස් (පෞද්ගලික) සමාගම - වසර 5 ක් සඳහා සෘජු ගෘහස්ථ බලපත්‍රය නිකුත් කරන ලදී.

සීමාසහිත ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් (පෞද්ගලික) ජාලය - ස්ථාවර රැහැන් රහිත බලපත්‍රය අළුත් කරන ලදී.

ඩයලොග් ආසියාටා පී.එල්.සී - ඩිජිටල් ක්ෂුද්‍ර තරංග සම්ප්‍රේෂණ ජාලය වැඩිදියුණු කිරීම සහ දෘශ්‍ය තන්තු කේබල බලපත්‍ර ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම.

සීමාසහිත ලංකා බෙල් සමාගම -ස්ථාවර රැහැන් රහිත බලපත්‍ර ක්‍රියාත්මක කිරීම.

සීමාසහිත US කේබල් (පෞද්ගලික) සමාගම- සෘජු ගෘහස්ථ බලපත්‍ර ක්‍රියාත්මක කිරීම.

සීමාසහිත Dis TV ලංකා පෞද්ගලික සමාගම- සෘජු ගෘහස්ථ බලපත්‍ර ක්‍රියාත්මක කිරීම.

සීමාසහිත ඊ.ඒ.පී. එදිරිසිංහ පෞද්ගලික සමාගම- සෘජු ගෘහස්ථ බලපත්‍ර ක්‍රියාත්මක කිරීම.

ව්‍යාපෘති සහ පර්යේෂණ අංශය

ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ ව්‍යාපෘති සහ පර්යේෂණ අංශය තිරසාර සහ ඵලදායී ලෙස ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය ප්‍රමුඛ පහසුකම් ඇති කරමින් ව්‍යාපෘති ගණනාවක් සැලසුම් කර සහ ක්‍රියාත්මක කර ඇත. වර්තමානයේදී මෙම අංශයට සෙසු ව්‍යාපෘති වලට අමතරව ප්‍රධාන ව්‍යාපෘති තුනක වගකීම පවරා ඇත.

ශ්‍රී.ල.වි.ස.නි.කො. සභාවේ ප්‍රධාන ව්‍යාපෘති

අංකය	ව්‍යාපෘතිය	වටිනාකම	තත්ත්වය
1	කොළඹ නෙළුම් කුලුන	ඇමරිකානු ඩොලර් මිලියන 104.3	ක්‍රියාත්මක වෙමින් පවතී.
2	හම්බන්තොට විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය	රුපියල් බිලියන 2.4	විෂයය පථය අඩුකරන ලදී. ව්‍යාපෘතිය ඵලදායී ආකාරයෙන් සම්පූර්ණ කිරීම පිණිස කටයුතු සිදු කරමින් පවතී.
3	ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ ප්‍රධාන කාර්යාලය පවත්නා ගොඩනැගිල්ල එකතු කිරීම් සහ වෙනස් කිරීම් සහිතව නවීකරණය කිරීම	රුපියල් මිලියන 502	අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. සැලැස්ම සහ ටෙන්ඩර් ලියකියවිලි පිළියෙල කිරීමේ කටයුතු නිම කර ඇත.

විදුලි සංදේශ පහසුකම් සැපයීමට අමතරව, කොළඹ නෙළුම් කුලුන සාප්පු සංකීර්ණ, කැරකෙන අවන්හල්, ඉහළ උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරි, රාජ්‍ය තානායම්, උත්සවශාලා මෙන්ම නරඹන්නන්ට විනෝදාස්වාදය සපයන විවෘත අවකාශයකින් සමන්විත වේ. එමගින් ප්‍රථම වරට ශ්‍රී ලංකාවේ ඩිජිටල් වීඩියෝ සේවා සැපයීමට සහ එෆ්.එම් විකාශන සහ විදුලි සංදේශ සේවා හවුලේ පරිහරණය කිරීමට අවස්ථාව සැලසේ. මෙම පහසුකම තුලින් බාහිර ආන්ටනාවක් රහිතව සමස්ථ

ජනතාවට විකාශන නාලිකා නැරඹීම පිණිස ඩිජිටල් භෞමික රූපවාහිනී සහ විකාශන සේවා සම්ප්‍රේෂණය කිරීමට අවස්ථාව සැලසේ. කුලුනේ මෙහෙයුම් කටයුතු පවත්වාගෙනයාම පිණිස ප්‍රමාණවත් ආදායම ඉහළ උන්නතාංශයකින් යුතු නැරඹුම් මැදිරිය, ආපනශාලා සහ සාප්පු සංකීර්ණ මගින් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මූලික වශයෙන් හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය මගින් විවිධ පහසුකම් සහිතව 100,000 ශ්‍රම බලකායකට ඉඩකඩ පහසුකම් සැලසීමට මෙන්ම මේවන විට කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට සහ ව්‍යවසායික කොටස්කරුවන් වැනි තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ විදේශීය හා දේශීය දැවැන්තයින්ට පහසුකම් සැපයීමට සැලසුම් කර ඇත. දේශීය මෙන්ම විදේශිය ශිෂ්‍යයන් තොරතුරු තාක්ෂණ විශේෂඥයින් බවට පත් කිරීම පිණිස උසස් අධ්‍යාපන අවස්ථා සඳහා පහසුකම් සපයයි.

ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ ක්ෂේත්‍රයට මෙන්ම ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවට වැඩි ප්‍රතිලාභ ලබා ගත හැකි පරිදි ව්‍යාපෘති සහ පර්යේෂණ අංශයේ කාර්යයන් පිළියෙල කර ඇත. කොන්ත්‍රාත්කරුවන් සහ අදාල රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, ව්‍යාපෘති කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාව වෙනුවෙන් පෙනී සිටීම, ශ්‍රී.ල.වි.ස.නි.කො.සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ නිලධාරීන් දැනුවත් කිරීම, ව්‍යාපෘති කටයුතු සඳහා කොමිෂන් සභා අනුමැතිය ලබා ගැනීම, ප්‍රසම්පාදන කටයුතු, අමාත්‍ය මණ්ඩල පත්‍රිකා පිළියෙල කිරීම, වැඩබිම් පරීක්ෂාව, ගෙවීම් කළමණාකරනය කිරීම, ණය, අමුද්‍රව්‍ය , භූමිය, වීසා, ලියකියවිලි සහ ජපන් ජාත්‍යන්තර සහයෝගීත්ව නියෝජිතායතනය (JICA), නෙළුම් කුලුන ව්‍යාපෘතිය සඳහා තොරතුරු තාක්ෂණ විසඳුම් සහ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයන් අතර කීපයකි.
නෙළුම් කුලුන ව්‍යාපෘතියේ ප්‍රගතිය සැලකියයුතු මට්ටමක පවත්නා අතර අවශ්‍ය කටයුතු සපුරා ඇත. පහත දැක්වෙන වගුව මගින් වර්තමාන ප්‍රගතිය පිළිබඳව අවබෝධයක් ලබාදේ.

වගුව 04.10
කොළඹ නෙළුම් කුලුන ඉදිකිරීමේ ප්‍රගතිය

ඉදිකිරීමේ ප්‍රගතිය

විස්තරය	**සම්පූර්ණ කිරීම**
කුලුනේ අත්තිවාරම ශක්තිමත් කිරීමේ වැඩ	100%
පිහිටි පොළොව පිරිසිදු කිරීම පිණිස පිහිටි පොළොව දක්වා කැණීම	100%
කුලුනු ව්‍යුහයේ අත්තිවාරම සම්පූර්ණ කිරීම	100%
කුලුනු බද මීටර් 292 දක්වා ඉදිකිරීම	100%
කුලුනු ශීර්ෂයේ වානේ ව්‍යුහය සහ ගිනිපියගැටපෙළ ඉදිකිරීම	50%

ප්‍රධාන ඉදිකිරීමේ වැඩසටහන

විස්තරය	සම්පූර්ණ කරන දිනය
වානේ ව්‍යුහය - කුලුනු ශීර්ෂය	2016 මැයි
කුලුනු ආධාරකය	2017 මැයි
නිමැවුම් වැඩ- කුලුනු පාදමේ වහලය	2017 ජූලි
මායිම් බිත්ති - කුලුනු පාදම සහ කුලුනු ශීර්ෂය	2017 ජූලි
නිමැවුම් වැඩ - කුලුනු ශීර්ෂය	2017 ඔක්තෝම්බර්
විදුලි සෝපාන	2017 ඔක්තෝම්බර්
ගෙවතු අලංකරණය	2017 ඔක්තෝම්බර්

පහත දැක්වෙන කරුණු හම්බන්තොට විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය හා අදාලවේ.

- ව්‍යාපෘතියේ විෂයය පථය සංශෝධනය කර ඇති අතර දළ බිම් ප්‍රදේශය වර්ග අඩි 92,000 ඇතුළු තෙවන මහලේ ඉදිකිරීම් කටයුතු අවසන් කර ඇත.
- කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ ලිපිය 2016ග08ග19 දින කොන්ත්‍රාත්කරුට යවා ඇත.
- කොන්ත්‍රාත්කරු විසින් වැඩබිම 2016.10.26 දින ශ්‍රී.ල.වි.ස.නි.කොං.සභාවට භාරදී ඇති අතර එතැන් සිට කොමිෂන් සභාව වැඩබිමේ නඩත්තු කටයුතු පවත්වාගෙන යනු ලැබේ.
- ආර්ථික කළමණාකරන සහ දකුණු පළාත් සංවර්ධන අමාත්‍ය මණ්ඩල කමිටුවේ උපදෙස් පරිදි, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ මැදිහත්වීම මත ගොඩනැගිල්ල භාවිතා කිරීමට සුදුසු ආයෝජකයකු තෝරා ගැනීමට අපේක්ෂා කෙරේ.

තරඟකාරිත්ව අංශය

1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කාර්යක්ෂම සහ පූර්ණ ස්වාධීන විදුලි සංදේශ සේවාවක් සැපයීමෙහිලා, මහජනතාවගේ යහපත සහතික කරන , වගකිවයුතු රජයක් වශයෙන්, නියාමන කටයුතු පවත්වාගෙනයාම සහ මෙහෙයවීම පිණිස ශ්‍රී.ල.වි.ස.නි.කොං.සභාවට ප්‍රතිපාදන ලබා දී ඇත. මේ සම්බන්ධයෙන්, සේවා පවත්වාගෙනයාම පිණිස විදුලි සංදේශ බලපත්‍ර ක්‍රියාත්මක කිරීම, විවිධවූ විදුලි සංදේශ සේවා, සේවාවල ගුණාත්මකභාවය සහ ගාස්තු සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, පරිහරණය කරන්නන්ගේ සහ පොදු මහජනතාවගේ යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම අයත් වේ. දුරකථන ක්‍රියාකාර සමාගම් අතර සාධාරණ කරඟකාරිත්වයක් නිසැක කිරීම පිණිස ගුණාත්මක සේවාවක් සහ මිල අඩුකිරීම ඉතා වැදගත් අංගයක් වේ. එබැවින් තරඟකාරිත්ව අංශය අයක්‍රම නියාමනය කිරීම, අන්තර්සම්බන්ධීය සේවා පිරික්සීම, විදුලි සංදේශ කර්මාන්තයේ තොරතුරු ප්‍රසිද්ධ කිරීම, විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල කාර්යසාධනය විශ්ලේෂණය කිරීම, අදාල පාර්ශවයන් සඳහා අවශ්‍ය උපදෙස් සැපයීම සිදු කරනු ලැබේ. ශ්‍රී.ල.වි.ස.නි.කොං.සභාව විසින් ඌන සංවර්ධිත ප්‍රදේශවල විදුලි සංදේශ සේවා ව්‍යාප්ත කිරීම පිණිස දුරකථන ක්‍රියාකාර සමාගම් දිරි ගන්වයි. එමෙන්ම මෙම අංශය විසින් විදුලි සංදේශ බදු, ජාත්‍යන්තර

විදුලි සංදේශ ක්‍රියාකරු බදු සහ සෙස් බදු වැනි බදු වර්ග රැස් කරනු ලබයි. ජාල වැඩිදියුණු කිරීම පිණිස නව සේවා සපයන විදුලි සංදේශ තාක්ෂණය විකාශනය කිරීමෙහිලා ක්‍රියාකරන විදේශීය විශේෂඥයින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම දිරිගන්වන අතර එම විදේශීය විශේෂඥයින්ගේ වීසා ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සහ අවසර ලබාදීම මෙම අංශය විසින් සිදු කරනු ලැබේ.

මෙම අංශය විසින් විදුලි සංදේශ කර්මාන්තයේ යහපත උදෙසා අවශ්‍ය තොරතුරු සැපයීමේ කාර්යයේ නිරත වන අතර ඉටු කරනු ලබන එවැනි කාර්යයන්වල සාරාංශයක් පහත දැක්වේ.

පාරිභෝගික යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, ලංකාවේ ජනතාව සඳහා සාධාරණ, දරාගත හැකි සහ ගුණාත්මක විදුලි සංදේශ සේවා නිසැක කිරීම පිණිස විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තරහකාරිත්වය ප්‍රවර්ධනය කිරීම පිණිස නිසි ක්‍රියාමාර්ග ගැනීම, අයක්‍රම නියාමනය කිරීම, විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් මෙහෙයවීම, අන්තර් සම්බන්ධතා සේවා පිරික්සීම, විදුලි සංදේශ ක්ෂේත්‍රයේ තොරතුරු ප්‍රසිද්ධ කිරීම යනාදී කාර්යයන් රැසක් තරහකාරිත්ව අංශය ඉටු කරයි.

- අයක්‍රම ආශ්‍රිත කරුණු.
- මූල්‍යය සහ කාර්යසාධන විශ්ලේෂණය මගින් දුරකථන ක්‍රියාකාර සමාගම් අධීක්ෂණය කිරීම.
- විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ආර්ථික විශ්ලේෂණය සිදුකිරීම.
- අන්තර්සම්බන්ධතාවය සම්බන්ධයෙන් ආර්ථිකමය කොන්දේසි ක්‍රියාත්මක කිරීම සහ අන්තර් දුරකථන ක්‍රියාකාර සමාගම්වල අන්තර් සම්බන්ධීය වැඩපිළිවෙල අනුමත කිරීම.
- දුරකථන ක්‍රියාකාර සමාගම් මගින් විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන එක්රැස් කර ගැනීම.
- ග්‍රාමීය අංශය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන වැඩසටහන් නිර්දේශ කිරීම.
- ග්‍රාමීය අංශයේ කටයුතු කඩිනම් කිරීම පිණිස ආර්ථිකමය දිරිගැන්වීම් යොදාගැනීමට යෝජනා ඉදිරිපත් කිරීම.
- විදුලි සංදේශ කර්මාන්තයේ සංඛ්‍යා ලේඛන තොරතුරු රැස් කිරීම සහ විශ්ලේෂණය කිරීම.
- රජයේ බදු සහ අයබදු රැස්කිරීම අධීක්ෂණය කිරීම.
- විදුලි සංදේශ කර්මාන්තයේ විදේශීය විශේෂඥයින් සඳහා වීසා පහසුකම් සැපයීම.

2016 වර්ෂයේදී මුළු කර්මාන්ත පිරිවැටුමේ සැලකියයුතු වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර එය රුපියල් බිලියන 200 ඉක්මවා යාමකි. මෙම වටිනාකමින් සියයට 95 ක් වෙනුවෙන් ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් පහක් සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම් තුනක් විසින් සාමූහිකව දායකත්වය ලබා දෙන ලදී. මුළු ආදායම රුපියල් බිලියන 203 වූ නමුත් බදු වලින් පසු ලාභය රුපියල් බිලියන 3.5 ක් විය.ස්ථාවර සහ ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් සිදු කරන ලද අඛණ්ඩ ආයෝජනය රුපියල් බිලියන 82.8 ක් විය. වෙළෙඳපොළ පොදු ස්විචිකරණ දුරකථන ජාල (Public Switching Telephone Network – PSTN) අටකට පමණ සීමාවූ නමුත් ඔවුන් අතර සාර්ථක

තරඟකාරිත්වයක් දැකිය හැකි වූ අතර, මෙම තියුණු තරඟකාරිත්වය කලාපයේ සෙසු රටවල් වලට වඩා මිල මට්ටම පහළ යාමට හේතු විය.

පහත වගු සහ ප්‍රස්ථාර වලින් විදුලි සංදේශ කර්මාන්තය සහ එහි වර්ධනය පිළිබඳව පැහැදිලි දර්ශනයක් පෙන්නුම් කරයි. ස්ථාවර ග්‍රාහක පදනම සියයට 2 කින් අඩු වුවද ජංගම ග්‍රාහක පදනමේ සියයට 8 වර්ධනයක් දක්නට ලැබිණි.

ප්‍රස්ථාර 04.01
මුළු කර්මාන්ත ආදායම



වගුව - 04.11
ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2011-2016
(රුපියල් මිලියන වලින්)

වර්ගය	2011	2012	2013	2014	2015	2016	% වෙනස්වීම 2011-2012	% වෙනස්වීම 2012-2013	% වෙනස්වීම 2013-2014	% වෙනස්වීම 2014-2015	% වෙනස්වීම 2015-2016
ජංගම	83,530	101,704	111,586	119,144	125,120	137,894	22%	10%	7%	5%	10%
ස්ථාවර ප්‍රවේශ	43,660	43,403	46,318	48,652	51,138	55,321	-1%	7%	5%	5%	8%
එකතුව	127,191	145,107	157,904	167,797	176,258	193,215	14%	9%	6%	5%	10%

ප්‍රස්ථාර 04.02

ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම්වල මුළු කර්මාන්ත ආදායම 2011-2016



වගුව - 04.12

2011-2016 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ග්‍රාහකයින්ගේ සංඛ්‍යාව

වර්ගය	2011	2012	2013	2014	2015	2016	% වෙනස් වීම 2011-2012	% වෙනස් වීම 2012-2013	% වෙනස් වීම 2013-2014	% වෙනස් වීම 2014-2015	% වෙනස් වීම 2015-2016
ජංගම	18,319,447	20,324,070	20,447,508	22,123,000	24,384,544	26,227,631	11%	1%	8%	10%	8%
ස්ථාවර ප්‍රවේශ	3,608,392	3,449,391	2,706,787	2,709,848	2,601,196	2,550,432	-4%	-22%	0%	-4%	-2%
එකතුව	21,927,839	23,773,461	23,154,295	24,801,739	26,985,740	28,778,063	8%	-3%	7%	9%	7%

පහත දැක්වෙන පරිදි ස්ථාවර සහ ජංගම ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම් සම්බන්ධයෙන් පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍යයේ වර්ධනයක් දක්නට ලැබිණි.

වගුව - 04.13

2011-2016 කාලපරිච්ඡේදය සඳහා ජංගම සහ ස්ථාවර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වල පරිහරණය කරන්නෙකුගෙන් ලැබෙන ආදායමේ සාමාන්‍ය (ARPU)

වර්ගය	2011	2012	2013	2014	2015	2016	% වෙනස්වීම 2011-2012	% වෙනස්වීම 2012-2013	% වෙනස්වීම 2013-2014	% වෙනස්වීම 2014-2015	% වෙනස්වීම 2015-2016
ජංගම	4560	5004	5,457	5,386	5,131	5,258	10%	9%	-1%	-5%	2%
ස්ථාවර ප්‍රවේශ	12,100	12,583	17,112	17,954	19,659	21,691	4%	36%	5%	9%	10%

වගුවේ සහ ප්‍රස්ථාරයේ දැක්වෙන පරිදි 2016 වර්ෂයේදී ජංගම සහ ස්ථාවර දුරකථන ක්‍රියාකාර සමාගම් දෙකේම බදු වලින් පසු ශුද්ධ ලාභය වාර්තා විය.

වගුව - 04.14
බදු වලින් පසුව ශුද්ධ ලාභය / (පාඩුව) (2011-2016)
(රුපියල් මිලියන වලින්)

වර්ගය	2011	2012	2013	2014	2015	2016
ජංගම	-1,017	-1,970	-143	2,947	-3,552	3,426
ස්ථාවර ප්‍රවේශ	1,285	3,304	2,964	1,723	898	106
එකතුව- ජංගම සහ ස්ථාවර ප්‍රවේශ	268	1,334	2,821	4,670	-2,654	3,532

ප්‍රස්ථාරය 04.03
බදු වලින් පසුව ශුද්ධ ලාභය / පාඩුව 2011-2016



2016 වර්ෂයේදී ආයෝජනයේ වර්ධනය පහත දැක්වේ.

වගුව - 04.15
ජංගම සහ ස්ථාවර ප්‍රවේශ ක්‍රියාකරුවන්ගේ ආයෝජන 2011-2016
(රුපියල් මිලියන වලින්)

වර්ගය	2011	2012	2013	2014	2015	2016
ජංගම	41,999	29,508	49,509	23,444	22,703	26,132
ස්ථාවර ප්‍රවේශ	14,055	20,610	19,052	21,640	26,245	56,641
එකතුව	56,054	50,118	68,561	45,085	48,948	82,774

2011 වර්ෂයේදී හඳුන්වාදුන් ‘‘තනි අනුපාත බදු’’ යනුවෙන් හඳුන්වනු ලබන විදුලි සංදේශ බදු මූලික වශයෙන් වටිනාකම සැපයීම මත සියයට 20 කි. අන්තර්ජාල බදු නොවෙනස්ව පැවති අතර අන්තර්ජාල බදු මත සියයට 10 සහනදායී ගාස්තුවක් පනවන ලද අතර 2014 වසරේ විදුලි සංදේශ බදු සියයට 25 දක්වා වැඩි කර ඇත.ඒ සම්බන්ධ විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව - 04.16
විදුලි සංදේශ බදු 2012-2016
(රුපියල් මිලියන වලින්**)**

වර්ෂය	2012	2013	2014	2015	2016
මුළු විදුලි සංදේශ බදු	19,746	20,026	26,150	27,835	30,339

එමෙන්ම සෙස් බදු විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් මගින් රැස් කරන අතර පහත සඳහන් සංඛ්‍යාලේඛන මගින් විස්තර දැක්වේ.

වගුව - 04.17
සෙස් බදු 2012-2016
(රුපියල් මිලියන වලින්)

වර්ෂය	2012	2013	2014	2015	2016
මුළු සෙස් බදු	3,152	3,455	3,652	3,841	4,121

විදුලි සංදේශ සංවර්ධන ගාස්තු **(Telecoomunication Development Charges -TDC)** සහ පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු **(Out going Local Access Charges -OLAC)** වශයෙන් කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලින් බදු අයකරනු ලබයි. **Viber, WhatsApp, Messenger** සහ **Skype** යනාදී විදුලි සංදේශ සැපයුම්කාර සමාගම් විසින් අන්තර්ජාල සම්මුති ජාලයක් ඔස්සේ සේවා සැපයීමේ භාවිතාවන් **(Over The Top -OTT)** නිසා 2016 වර්ෂයේදී ජාත්‍යන්තර හඬ සන්නිවේදන භාවිතාවන් පහළ වැටී ඇති අතර 2014-2015 වර්ෂ වලදී ආදායම සියයට 5 කින් අඩුවී ඇත. මෙම තත්ත්වය අදාල බදු සියයට සියය දක්වා වර්ධනය කිරීමට හේතු වූ අතර බදු රැස්කිරීම පහත වගුවේ දැක්වේ.

වගුව - 04.18
රැස් කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC) – 2014-2016

වර්ෂය	2014	2015	2016
රැස් කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තු	6,756	5,861	8,689

ප්‍රස්ථාරය 04.04
රැස් කරන ලද විදුලි සංදේශ සංවර්ධන ගාස්තු



එමෙන්ම පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තුව මිනිත්තුවකට රුපියල් 3.00 වර්ෂය තුළ කරන ලද රැස්කිරීම් පහත දැක්වේ.

වගුව 04.19
රැස් කරන ලද පිටතට යන දේශීය ප්‍රවේශ ඇමතුම් ගාස්තු බදු (2014- 2016)

වර්ෂය	2014	2015	2016
රැස් කරන ලද පිටතට යන දේශීය ප්‍රවේශ ඇමතුම් ගාස්තු බදු(රුපියල් මිලියන වලින්)	1,894	1,592	1,125

ප්‍රස්ථාර 04.05
රැස් කරන ලද පිටතට යන දේශීය ප්‍රවේශ ඇමතුම් ගාස්තු බදු



දිගු කාලීන පදනම සහ ප්‍රවර්ධන පදනම යන නමින් 2015 වසරේදී අයක්‍රම අනුමැතීන් වර්ග දෙකක් පනවන ලද අතර මුළු අයක්‍රම සංඛ්‍යාව 208 ක් පමණ විය. දුරකථන ක්‍රියාකාර සමාගම්වල ජාලය යාවත් කාලීන කිරීම පිණිස විදුලි සංදේශ ක්ෂේත්‍රය පිළිබඳ විදේශීය ප්‍රවීනයින්ගේ අවශ්‍යතාවය අවධාරණය කළ ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව ඒ අනුව 2015 වසරේදී එම ප්‍රවීනයන්ගේ වීසා අයදුම්පත් 397 සලකා බලන ලද අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

බලාත්මක විදුලි සංදේශ පනත ප්‍රකාරව ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාවට විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල අයක්‍රම සැලසුම් අනුමත කිරීමට බලය පැවරී ඇති අතර දුරකථන ක්‍රියාකාර සමාගම් වලට දිගුකාලීන පදනම සහ ප්‍රවර්ධන පදනම ලෙස අයක්‍රම සැලසුම් දෙවර්ගයක් ඉදිරිපත් කළ හැකිය. දිගුකාලීන පදනම කොමිෂන් සභාව විසින් හඳුන්වාදෙන අවසන්කිරීමක් හෝ සංශෝධනයක් සහිතව බලපවත්වන අතර ඇතැම් අවස්ථාවලදී දුරකථන ක්‍රියාකාර සමාගම් විසින් පවත්නා අයක්‍රම සැලැස්ම අඛණ්ඩව පවත්වාගෙන යාමට අපේක්ෂා කරයි. වෙළඳපල සහ පාරිභෝගික හැසිරීම ඒකාකාරව නොපවතින නිසා ප්‍රවර්ධන පදනම තාවකාලික වන අතර උපරිම වශයෙන් මාස තුනක කාලයක් සඳහා අදාල වේ.

2016 අනුරූපී වර්ෂයේදී , අයක්‍රම අයදුම්පත්‍ර 128 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඒ සඳහා අනුමැතිය ලබා දුන් අතර එය දිගු කාලීන පදනම මත වූ අයක්‍රම අනුමැතීන් 17කින් සමන්විත වේ.

ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් විදුලි සංදේශ කර්මාන්තයේ ස්ථායිතාවය සඳහා 2010 වසරේ සිට බලපවත්වන පරිදි දේශීය ඇමතුම් ගාස්තු සහ කෙටි පණිවුඩ සේවා වෙනුවෙන් පාදස්ථ මිලක් පනවා ඇති අතර 2011 සහ 2016 වර්ෂවලදීද සංශෝධනය කර ඇත. නව පාදස්ථ මිල පොදු පාදස්ථ මිල යනුවෙන් හැඳින්වේ. අදාල මිල ගනන් පහත දැක්වේ.

වගුව - 04.20
පාදස්ථ මිල සංශෝධනය කිරීම

අයිතමය	එකම ජාලය (On net) සහ ජාල අතර (Off net) පොදු පාදස්ථ මිල (මිනිත්තුවකට රුපියල්Rs. Per Minute / බහු මාධ්‍ය පණිවුඩ සේවා (MMS) /කෙටි පණිවුඩ සේවාවකට රුපියල්
දේශීය හඬ ඇමතුම් (මිනිත්තු පාදක බිල්කරණය ප්‍රකාරව)	1.50
දේශීය හඬ ඇමතුම් (තත්පර පාදක බිල්කරණය ප්‍රකාරව)	1.80
බහු මාධ්‍ය පණිවුඩ සේවා (MMS) /කෙටි පණිවුඩ සේවා (SMS)	0.20

වර්තමාන ලෝකයේ විදුලි සංදේශ කර්මාන්තයේ පවත්නා තාක්ෂණය ලබා ගැනීම පිණිස, ශ්‍රී.ල.වි.ස.නි.කොා.සභාව විසින් විදේශීය වෘත්තිකයින්ගේ වීසා අයදුම්පත්‍ර ක්‍රියාවලිය සම්බන්ධයෙන් කටයුතු කරන අතර නිර්දේශ කිරීම පිණිස ජනාධිපති ලේකම් කාර්යාලයට යවනු ලබයි. මෙම අංශය විසින් වර්ෂය තුළ එවැනි අයදුම්පත්‍ර 245 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත.

පාලන අංශය

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පරිපාලන අංශය ආයතනික සැලසුම්කරණය, සංවිධානය, මෙහෙයවීම හා පාලනය, ආයතනය තුළ මෙන්ම ආයතනයෙන් බැහැර වෙනත් ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම, ආයතනමය සහ විනය කටයුතු, ඇගයීම, පුහුණු කිරීම, ගෙවීම් නිර්දේශ කිරීම/අනුමත කිරීම , භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය, ප්‍රවාහන පහසුකම් සැලැස්වීම, කාර්ය මණ්ඩලයේ ශුභසාධන කටයුතු සොයා බැලීම මෙන්ම කාර්යයන් වැඩිදියුණු කිරීම පිණිස භෞතිකමය

පරිසරයක් පවත්වාගෙනයාම,තොරතුරු තාක්ෂණ පහසුකම් සහ පුස්තකාල පහසුකම් සැපයීම , ආයතනික සැලැස්ම සහ වාර්ෂික වාර්තා පිළියෙල කිරීම, නීති සහ රීති පිළියෙල කිරීම මෙන්ම ආයතනයේ වැදගත් අවස්ථාවන් සඳහා මාධ්‍යය ආවරණය ලබාදීම සිදු කරන කොමිෂන් සභාවේ කේන්ද්‍රස්ථානය වන අතර, ඉහත සඳහන් සේවාවන්හී නිරත වන අතර ඊට අමතරව කොමිෂන් සභාවේ දෛනික කාර්යයන් වන පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙනයාම, බඳවා ගැනීම්, සේවය ස්ථීර කිරීම්, සේවය උසස් කිරීම්, කාර්යසාධනය ඇගයීම, විනය පරීක්ෂණ මෙන්ම මානව සම්පත් සංවර්ධන අයවැය යනාදිය පිළියෙල කිරීම සිදු කරනු ලබයි.

වගුව - 04.21
විදේශීය සහ දේශීය පුහුණු වැඩසටහන් - 2016

	විෂයය/පුහුණුවේ /ශිෂ්‍යත්වයේ /සම්මන්ත්‍රණයේ විෂය පථය	රට	සිට	දක්වා	අරමුදල් සපයන ආයතනය
1	තොරතුරු ආරක්ෂණය හා පරිගණක පිළිබඳ පුහුණු පාඨමාලාව	චීනය	2016.04.17	2016.04.27	APT
2	අවකාශ ගුවන් විදුලි සන්නිවේදනය	ජිනීවා	2016.04.04	2016.04.17	ITU
3	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රතිපත්ති සහ නියාමන සමුළුව	ජපානය	2016.07.11	2016.07.15	APT
4	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම 1	ජිනීවා	2016.09.17	2016.09.22	TRCSL
5	2016 ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ D අධ්‍යයන කණ්ඩායම 1 සහ 2	ජිනීවා	2016.04.03	2016.04.17	TRCSL
6	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ T අධ්‍යයන කණ්ඩායම 13 රැස්වීම	ජිනීවා	2016.06.26	2016.07.03	TRCSL
7	අධ්‍යයන කණ්ඩායම 3/ කාර්ය කණ්ඩායම 3K	ජිනීවා	2016.06.19	2016.07.02	TRCSL
8	ආසියා ශාන්තිකර සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරන සම්මන්ත්‍රණය	තායිලන්තය	2016.04.24	2016.04.27	APT
9	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ රැහැන් රහිත කණ්ඩායම 20 වන රැස්වීම	තායිලන්තය	2016.09.05	2016.09.10	APT
10	දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ කාර්ය කණ්ඩායම	මාලදිවයින	2016.03.22	2016.03.25	APT
11	ශ්‍රී ලංකා නිදහස් වෙළඳ සංගමයේ ශ්‍රී ලංකා නියෝජිත සාමාජිකයන්	සිංගප්පූරුව	2016.12.12	2016.12.16	TRCSL
12	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ආපදා කළමණාකරනය පිළිබඳ 7 වන වැඩමුළුව	තායිලන්තය	2016.04.2424-Apr-16	2016.05.0101-May-16	APT

13	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය/ පාකිස්තානු විදුලි සංදේශ අධිකාරියේ නියාමකයින්ගේ වටමේස සාකච්ජාව	පාකිස්තානය	2016.07.17	2016.07.23	APT
14	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමය - ඉන්දියානු විදුලි සංදේශ නියාමන අධිකාරියේ පාරිභෝගික ආරක්ෂණය පිළිබඳ පුහුණුව	ඉන්දියාව	2016.03.20	2016.03.24	TRCSL
15	තොරතුරු මාධ්‍ය විධායක වැඩසටහන	සිංගප්පූරුව	2016.08.21	2016.08.27	ITU
16	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ D අධ්‍යයන කණ්ඩායම	ජිනීවා	2016.04.17	2016.05.01	ITU
17	චීන ජාතික ඉලෙක්ට්‍රොනික්ස් ආනයන සහ අපනයන සංස්ථාව වාරිකාව	චීනය	2016.12.16	2016.12.20	TRC
18	සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ R අධ්‍යයන කණ්ඩායම WPIA රැස්වීම	ජිනීවා	2016.11.12	2016.12.18	TRCSL
19	භෞමික රූපවාහිනී විකාශන ව්‍යාපෘතිය ඩිජිටල්කරණය කිරීමේ වැඩසටහන	ජපානය	2016.06.26	2016.07.02	JICA
20	භෞමික රූපවාහිනී විකාශන ව්‍යාපෘතිය ඩිජිටල්කරණය කිරීම	ජපානය	2016.06.26	2016.07.02	JICA
21	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ 1 වන රැස්වීම	චීනය	2016.07.25	2016.07.29	APT
22	දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ සංගමයේ සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ වැඩමුළුව	භූතානය	2016.04.17	2016.04.22	APT
23	සංඛ්‍යාත වර්ණාවලිය පිරික්සීම පිළිබඳ කාර්ය කණ්ඩායම 1C රැස්වීම සහ ගුවන් විදුලි සන්නිවේදන අධ්‍යයන කණ්ඩායම 1 රැස්වීම	ජිනීවා	2016.01.06	2016.06.12	TRCSL
24	සේවා තත්ත්වය හා අත්දැකීම් තත්ත්වය පිළිබඳ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ t අධ්‍යයන කණ්ඩායම 12 කාර්යසාධනය	ජිනීවා	2016.06.04	2016.06.18	TRCSL
25	සංඛ්‍යාත වර්ණාවලි කළමණාකරනය පිළිබඳ පුහුණු පාඨමාලාව	ඉන්දියාව	2016.08.23	2016.08.31	APT
26	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ D අධ්‍යයන කණ්ඩායම 02 රැස්වීම	ජිනීවා	2016.09.26	2016.09.30	TRCSL
27	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රාරම්භක කණ්ඩායමේ 4 වන රැස්වීම	වියට්නාමය	2016.08.23	2016.08.26	APT

28	ලෝක විදුලි සංදේශ ප්‍රමිතිකරණ රැස්වීම	ටියුනීසියා	2016.10.24	2016.11.05	ITU
29	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ ප්‍රාරම්භක කණ්ඩායමේ 3 රැස්වීම	නේපාලය	2016.06.13	2016.06.18	APT
30	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ අධ්‍යයන කණ්ඩායම 3 කලාපීය රැස්වීම	ඉන්දියාව	2016.09.20	2016.09.23	TRCSL
31	අධ්‍යයන කණ්ඩායම 3 රැස්වීම	ජිනීවා	2016.02.21	2016.03.03	TRCSL
32	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ R අධ්‍යයන කණ්ඩායම 5 හා කාර්ය කණ්ඩායම 5 A	ජිනීවා	2016.05.08	2016.05.22	TRCSL
33	Towerxchance ආසියානු විදුලි සංදේශ කුලුනු සම්මන්ත්‍රණය Asia Telecom Tower Conference	සිංගප්පූරුව	2016.12.14	2016.12.16	APT
34	සයිබර් අපරාධ වැලැක්වීම හා විමර්ශනය පිළිබඳ සමුළුව	චීනය	2016.06.27	2016.07.17	APT
35	අධ්‍යයන කණ්ඩායම 15, ජාල , තාක්ෂණය සහ යටිතල පහසුකම්	ජිනීවා	2016.09.25	2016.10.02	TRCSL
36	කාර්ය කණ්ඩායම 5A : ජංගම සේවා	ජිනීවා	2016.11.06	2016.11.13	TRCSL
37	සංඛ්‍යාත වර්ණාවලිය පිළිබඳ දකුණු ආසියානු විදුලි සංදේශ නියාමකයින්ගේ කාර්ය කණ්ඩායම	ඉන්දියාව	2016.05.23	2016.05.26	APT
38	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා හා විද්‍යුත් භාවිතාවන් පරිහරණය කිරීම පිළිබඳ ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ පුහුණු පාඨමාලාව	ජපානය	2016.02.28	2016.03.19	APT
39	මීළඟ හා නව පරම්පරාවේ ජංගම සන්නිවේදන ක්‍රියාමාර්ග පිළිබඳ පුහුණු පාඨමාලාව	ජපානය	2016.01.18	2016.01.28	APT
40	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ විශිෂ්ඨත්ව වැඩසටහන	තායිලන්තය	2016.08.14	2016.08.20	TRCSL
41	ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ආසියා ශාන්තිකර මධ්‍යස්ථානයේ Quadplay පිරිවැයකරණය සහ මිලකරණය පිළිබඳ විශිෂ්ඨතා වැඩසටහන	තායිලන්තය	2016.08.14	2016.08.20	ITU
42	සම්මන්ත්‍රණ සඳහා සූදානම්වීමේ පුහුණු පාඨමාලාව	තායිලන්තය	2016.03.27	2016.04.01	APT
43	රැහැන් රහිත අධිවේගී අන්තර්ජාල සේවා පිළිබඳ මාර්ගගත/මුහුණට මුහුණ වැඩසටහන	තායිලන්තය	2016.12.11	2016.12.17	APT

44	සම්මන්ත්‍රණ සඳහා සූදානම්වීමේ පුහුණු පාඨමාලාව	තායිලන්තය	2016.03.27	2016.04.01	TRC
45	විශ්වීය ප්‍රවේශ සඳහා අධිවේගී අන්තර්ජාල ප්‍රතිපත්තිය පිළිබඳ පුහුණු පාඨමාලාව	ඉන්දියාව	2016.09.20	2016.09.29	APT
46	සයිබර් ආරක්ෂණ මූලධර්ම පිළිබඳ පුහුණු පාඨමාලාව	ඉන්දියාව	2016.09.27	2016.10.05	APT
47	ග්‍රාමීය ප්‍රදේශවල දුරකථන සන්නිවේදන සේවා ව්‍යාප්තවීමේ විසඳුම්	ජපානය	2016.11.12	2016.11.24	APT
48	කාර්ය කණ්ඩායම 2 රැස්වීම	තායිලන්තය	2016.06.07	2016.06.09	TRC
49	සයිබර් ආරක්ෂණ තාක්ෂණයේ නව ප්‍රවණතා	ජපානය	2016.11.09	2016.11.19	APT
50	ආසියා ශාන්තිකර විදුලි සංදේශ සංගමයේ Big Data විශ්ලේෂණ පිළිබඳ පුහුණු පාඨමාලාව	චීනය	2016.10.16	2016.10.28	APT
51	අනාගත මෘදුකාංග පිළිබඳ පුහුණු පාඨමාලාව	තායිලන්තය	2016.11.06	2016.11.12	APT
52	අසිරිමත් නගරය පිළිබඳ පුහුණු පාඨමාලාව	චීනය	2016.11.08	2016.11.19	APT
53	ප්‍රවීන හා කාර්ය කණ්ඩායමේ 4 හා 7 රැස්වීම	ජිනීවා	2016.10.02	2016.10.09	TRCSL
54	නියාමකයින් සඳහා ගෝලීය සමුළුව-16 තේමාගත පූර්ව සම්මන්ත්‍රණය	ඊජිප්තුව	2016.05.10	2016.05.16	ITU
55	අල්ට්‍රා අධිවේගී අන්තර්ජාල සමුළුව -2016	ජර්මනිය	2016.09.28	2016.10.02	/TTRCSL/Huwai
56	කළමණාකරන කමිටුවේ 40 වැනි සැසිය	ජිජි	2016.11.26	2016.12.03	TRC
57	සංගමයේ 2016 සැසිය	ජිනීවා	2016.05.24	2016.06.04	ITU
58	නව සංවර්ධන උපායමාර්ග පිළිබඳ සමුළුව	පිලිපීනය	2016.06.07	2016.06.11	TRC

දේශීය පුහුණු වැඩසටහන් - 2016

	විෂයය	ආයතනය
1	පරිපාලනමය වෘත්තිකයන් සඳහා කම්කරු නීතිය පිළිබඳ වැඩමුළුව 2016.03.01	**සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල**
2	ශාස්ත්‍රවේදී උපාධි/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව	**ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය**
3	වරලත් බදු උපදේශක - අදියර II	**ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය**
4	අභ්‍යන්තර විගණනය - සැලසුම්කරණය, අභ්‍යන්තර පාලන සහ ආපදා ඇගයීම - 2016 මාර්තු 10	PRAG ආයතනය
5	තොරතුරු තාක්ෂණ නිෂ්පාදන පිළිබඳ ප්‍රසම්පාදනය සහ ලංසු ඇගයීම 2016 මාර්තු 24	PRAG ආයතනය
6	මූල්‍ය ආර්ථික විද්‍යා ශාස්ත්‍රවේදී උපාධි වැඩසටහන 2016	**කොළඹ විශ්ව විද්‍යාලය**
7	බදු අනුකූලතා කළමණාකරනය - 2016 අප්‍රියෙල් 22	**ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය**
8	ගිණුම් වෘත්තිකයන් සඳහා වැටුප මත බදු බලපෑම (උපයන විට ගෙවීම) පිළිබඳ වැඩමුළුව - 2016 මැයි 06	**ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය**
9	Greenstone ඩිජිටල් පුස්තකාල මෘදුකාංග පිළිබඳ වැඩමුළුව - 2016 අප්‍රියෙල් 28-29	**ශ්‍රී ලංකා පුස්තකාල සංගමය**
10	37 වෙනි ජාතික සම්මන්ත්‍රණය - 2016 ඔක්තෝම්බර් 19-21	**ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය**

මූල්‍ය අංශය

සමාලෝචනය

මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ කොමිෂන් සභාවේ සියළුම මූල්‍ය කටයුතු ආශ්‍රිත මූල්‍ය කළමණාකරනය සිදු කිරීමයි. ආදායම එකතු කිරීම සහ එම අරමුදල් නිසි පරිදි ආයෝජනය කරමින් ප්‍රශස්ත ආකාරයෙන් පරිහරණය කිරීම සෙසු ප්‍රධාන කාර්යයන් අතර වේ.එමෙන්ම මූල්‍ය රීති, අදාල චක්‍රලේඛ සහ කොමිෂන් සභා තීරණ වැනි අදාල නීති සහ රීති වැනි ව්‍යවස්ථාපිත රාමුව තුළ මුදල් පාලනය කිරීම සහ වියදම් කිරීම වැනි කටයුතු සිදු කිරීම මූල්‍ය අංශය විසින් සිදු කරනු ලැබේ.

එමෙන්ම කොමිෂන් සභාව විසින් මූල්‍ය කටයුතු පිළිබඳ ප්‍රධාන තීරණ ගන්නා බැවින්, නිවැරදි මූල්‍ය වාර්තා පවත්වා ගැනීම මූල්‍ය අංශයේ ප්‍රධාන වගකීමක් වේ.සියළුම රාජ්‍ය ආයතන, සියළුම මූල්‍ය ප්‍රතිපත්ති රජයේ මූල්‍ය රෙගුලාසි වලට හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරන ආයතනය විසින් ප්‍රසිද්ධ කළ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට සහ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව සිදු කරන බව සහතික කිරීම මෙන්ම ගණුදෙනුවල නිරවද්‍යතාවය සහ පරිපූර්ණත්වය තහවුරු කිරීම පිණිස මූල්‍ය වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සඳහා නීතියෙන්ම බැඳී සිටී. සමාලෝචන වර්ෂය තුළදී අප විසින් අපගේ මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. මූල්‍ය කළමණාකරන අංශයේ කාර්යයන් ඓතිහාසික දත්ත වාර්තාකරණය සඳහා පමණක් සීමා නොවන අතර මූල්‍ය පරිපාලනය, පිරිවැය පාලනය, ව්‍යාපෘති ඇගයීම, සංවර්ධන සැලසුම්කරණය සහ ඵලදායි හා

කාර්යක්ෂම ආකාරයෙන් උපාය මාර්ගික තීරණ ගැනීමෙහිලා සහභාගිවීම මෙම අංශය මගින් සිදු කරන වැදගත් කාර්යයන් වේ.

කාර්යයන්

- අයවැය/පුරෝකථනය සහ ඒ හා සමාන කාරණාවල විචල්‍යයන්ට අනුව මූල්‍ය බලපෑම් වාර්තාකරණය කිරීම.
- වාර්ෂික අයවැය/පුරෝකථන පිළියෙල කිරීම.
- අභ්‍යන්තර පාලන පද්ධතිය ස්ථාපනය කිරීම සහ පවත්වාගෙනයාම.
- සියළුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා පවත්වාගෙනයාම සහ සේවා ප්‍රශස්ත ආකාරයෙන් පරිහරණය කිරීමට සහ ආරක්ෂා කිරීමට වගබලා ගැනීම.
- ප්‍රාග්ධන සහ ආදායම් වියදම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා ඉහල කළමණාකාරිත්වයට උපදෙස් ලබාදීම සහ සහායවීම.
- බදු සැලසුම්කරණය කිරීම මෙන්ම අදාල ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට අනුකූලව කටයුතු කිරීම.
- විගණකාධිපති වාර්තා සහ විගණන කමිටු වාර්තා වැනි මූල්‍ය වාර්තා සහ කාලානුරූප මෙහෙයුම් සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම මෙන්ම අවශ්‍ය නම් අපගමනයන් නිවැරදි කිරීම සඳහා නිවැරදි/සුදුසු ක්‍රියාමාර්ග ගැනිම.
- රජය සහ පාර්ලිමේන්තු පනත මගින් පනවන විවිධ බදු කඩිනමින් එකතු කිරීමට වගබලා ගැනීම සහ ක්‍රියාමාර්ග ගැනීම.
- එකතු කරන ලද අරමුදල් කාර්යක්ෂමව සහ නිසි පරිදි මහා භාණ්ඩාගාරය සඳහා ප්‍රේෂණය කිරීමට වග බලා ගැනීම.
- අතිරික්ත අරමුදල් ඇත්නම් විදුලි සංදේශ ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අඩු අවදානමක් සහිත වැඩි ප්‍රතිලාභ ලබන ආයෝජනවල ප්‍රශස්ත ලෙස පරිහරණය කිරීමට වග බලා ගැනිම.
- කොමිෂන් සභාවේ කාර්තු හා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම.
- ආදායම, වියදම, වත්කම් සහ වගකීම් පිළිබඳව මූල්‍යකරණය සහ සංඛ්‍යාලේඛන වාර්තා පවත්වාගෙනයාම මෙන්ම ඉහළ කළමණාකාරිත්වයට අවශ්‍ය වූ විට තොරතුරු සැපයීම.

කාර්යසාධනය

ආදායම

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධනය කරන ලද 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත මගින් කොමිෂන් සභාවේ ආදායම උපයා ගැනීම සහ රැස්කිරීමේ ව්‍යවස්ථාපිත බලතල පැවරී ඇත. ඒ අනුව කොමිෂන් සභාව විසින් ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු, බලපත්‍ර ගාස්තු, සෙස් ගාස්තු, පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු, වෙළඳ බලපත්‍ර ගාස්තු හා පොදු ස්විචිකරණ දුරකථන ජාල (PSTN) ක්‍රියාකාර සමාගම් සහ ගුවන් විදුලි සංඛ්‍යාත පරිහරණය කරන්නන්ගේ ආදායම උපයා ගැනීම/එකතු කිරීම කරනු ලැබේ. වැඩිදුරටත් කොමිෂන් සභාවේ ආදායම පහත සඳහන් පරිදි වසරින් වසර වර්ධනය වී ඇත.

වගුව - **04.22**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ආදායම 2014 – 2016

ආදායම් ප්‍රභවය	2016 (රු. '000)	2015 (රු. '000)	2014 (රු. '000)
පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු	1,751,344	107,708	261,816
සෙස් ගාස්තු	4,067,179	3,840,742	3,651,983
ගුවන් විදුලි සංඛ්‍යාත බලපත්‍ර ගාස්තු	7,496,093	6,756,145	8,672,210
ගුවන් විදුලි සංඛ්‍යාත පූර්ව ගාස්තු	367,347	0	0
වෙළඳ බලපත්‍ර ගාස්තු	14,771	13,087	12,337
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු	73	56	95
නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු	892	764	797
ගුවන් යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු	1,170	941	1,048
රැහැන් රහිත දුරකථන වෙළඳ ගාස්තු	90,760	66,757	51,506
විභාග ගාස්තු	417	394	374
අයදුම්පත් සැකසීමේ ගාස්තු	1,632	6,531	1,020
කෙටි සංකේත ගාස්තු	19,388	14,796	8,418
විවිධ ආදායම් (ස්ථාවර තැන්පතු සහ කාර්ය මණ්ඩල ණය යනාදිය සඳහා පොළියෙන් ලැබෙන ආදායම)	2,295,412	1,117,143	1,711,196
එකතුව	**16,106,478**	**11,925,066**	**14,372,802**

විදුලි සංදේශ බදු

වර්තමාන විදුලි සංදේශ බදු අනුපාතය විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් විසින් සපයන අන්තර්ජාල සේවාව හැර විදුලි සංදේශ සේවා සැපයීමේ අගය මත සියයට 25 ක් වේ. අන්තර්ජාල සේවා සැපයීමේ ගාස්තුව වර්තමානයේදී සියයට 10 බදු අනුපාතයක් මත පනවන ලදී.

ප්‍රස්ථාරය **04.06**

විදුලි සංදේශ බදු රුපියල් මිලියන වලින්, **2014-2016**



වැඩිදුරටත්, රජය විසින් පද්ධති බලපත්‍ර ක්‍රියාකරු ගාස්තු සහ සෙස් ගාස්තු වෙනුවට දුරකථන ක්‍රියාකාර සමාගම්වල වාර්ෂික දළ පිරිවැටුම මත 2% සෙස් ගාස්තුවක් හඳුන්වාදෙන ලදී.

ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු

ඉහත ආදායමට අමතරව 2009 අංක 13 දරන මුදල් පනතින් සංශෝධිත 2004 අංක 11 දරන මුදල් පනත ප්‍රකාරව විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවක් (TDC) වශයෙන් මිනිත්තුවකට ඇමරිකානු ඩොලර් 0.30 ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්දක් සහ ලැබෙන සහ පිටතට යැවෙන ජාත්‍යන්තර ඇමතුම් වලින් මිනිත්තුවකට රු.2.00 බද්දක් පිළිවෙලින් කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලින් රැස් කරන ලදී.

පහත සඳහන් ප්‍රස්ථාරයෙන් පසුගිය වසර තුන තුළ ආදායම වර්ධනයවීමේ රටාව පෙන්නුම් කරයි.

ප්‍රස්ථාරය 04.07
ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බදු
(රුපියල් මිලියන වලින් , 2014-2016)



1996 අංක 27 දරන විදුලි සංදේශ සංශෝධිත පනත ප්‍රකාරව රැස් කරන ලද ආදායම

එමෙන්ම ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම පහත සඳහන් ප්‍රස්ථාරයෙන් පෙන්නුම් කළ හැකිය.

ප්‍රස්ථාරය 04.08
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මුළු ආදායම
(2014-2016 රුපියල් මිලියන වලින්)



ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ

2016 වර්ෂයේදී, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රජයේ ආදායම ශක්තිමත් කිරීම පිණිස මහා භාණ්ඩාගාරය සඳහා රුපියල් බිලියන 63.8ක් ප්‍රේෂණය කර ඇත.

වගුව - 04.23
ඒකාබද්ධ අරමුදල සඳහා ප්‍රේෂණ

වර්ෂය	2016 රුපියල් මිලියන වලින්	2015 රුපියල් මිලියන වලින්	ප්‍රතිශතයේ වර්ධනය
වර්තමාන වර්ෂය	48.8	43.6	12%
පසුගිය වර්ෂය	15.0	0.00	-

දේපල, පිරියත හා උපකරණ

2016 වර්ෂය තුළදී දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම සඳහා වෙන් කරන ලද මුදල රුපියල් මිලියන 45.3 අතරින් රුපියල් මිලියන 32.6 , රුපියල් මිලියන 3.1, රුපියල් මිලියන 1.6 පිළිවෙලින් තාක්ෂණික උපකරණ, කාර්යාල උපකරණ සහ වීඩියෝ උපකරණ මිලදී ගැනීමට වැය කර ඇත.

ආයෝජන

කොමිෂන් සභාව විසින් මහජන බැංකුවේ දෛනිකව කොටස් මුදල් වෙළඳපල ගණුදෙනු පවත්වාගෙන යන අතර 2016 වර්ෂයේදී එවැනි කොටස් වෙළඳපල ගණුදෙනු වලින් ලැබුණු පොළී ආදායම වශයෙන් රුපියල් මිලියන 166 ක් උපයා ගෙන ඇත.

කාර්ය මණ්ඩලය

සමාලෝචන වර්ෂය තුළදී , මූල්‍ය අංශය විසින් අධ්‍යක්ෂවරයකු (01), නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් දෙදෙනකු (02) (එක් නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු 2016 පෙබරවාරි මස සිට විශ්‍රාම ගෙන ඇත), සහකාර ගණකාධිකාරීවරයකු(01), සංවර්ධන නිලධාරීන් දෙදෙනෙකු (02) , කළමණාකරන සහකාරවරු පස්දෙනෙකු (05) සහ තොරතුරු තාක්ෂණ සහකාරවරයකු (01) ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් දෙදෙනකුගෙන්(02) සමන්විත සාමාජිකයන් 14 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සහිතව වගකීම් සහිත කාර්යයන් ඉටු කරන ලදී.

05 පරිච්ඡේදය

අභ්‍යන්තර විගණන කාර්යසාධනය සහ විගණන කමිටු වාර්තා

සමාලෝචනය

අභ්‍යන්තර විගණන අංශය ආයතනයේ මෙහෙයුම් කටයුතු වැඩිදියුණු කිරීමේ සහ වටිනාකම එකතු කිරීමේ අරමුණින් ක්‍රියා කරන ස්වාධීන අංශයකි. දත්ත හා ව්‍යාපාරික ක්‍රියාවලිය විශ්ලේෂණය කිරීම සහ ඇගයීම් පදනම් කරගෙන අවබෝධය සහ නිර්දේශ ලබාදීම මගින් ආයතනයේ ඵලදායීත්වය සහ කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීමේ උත්ප්‍රේරකයකු වේ. විගණන අංශය ස්වාධීනව උපදෙස් ලබාදෙන විෂයානුබද්ධ ප්‍රභවයක් වශයෙන්, පරිපූර්ණ සහ වගකිවයුතු විධිවිධාන යෙදීමේදී, රාජ්‍ය ආයතන වලට සහ ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වයට ප්‍රයෝජනවත් වේ. ආයතනයේ අභ්‍යන්තර විගණන අංශයේ විෂයය පථය පුළුල් අතර මෙහෙයුම් කටයුතුවල ඵලදායිතාව , මූල්‍ය වාර්තාවල විශ්වාසනීයත්වය , වංචා වලට දඬුවම් ලබාදීම සහ විමර්ශනය කිරීම, වත්කම් ආරක්ෂා කිරීම, නීති සහ රීති වලට අනුකූලතාවය දැක්වීම වැනි විෂයය ක්ෂේත්‍රයන් පිළිබඳව කටයුතු කරනු ලැබේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා (ප්‍රධාන අභ්‍යන්තර විගණක) සෘජුවම කොමිෂන් සභාවට වාර්තා කරන අතර විගණන වාර්තා විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. පරිපාලනමය වශයෙන් ප්‍රධාන අභ්‍යන්තර විගණක අධ්‍යක්ෂ ජනරාල්වරයාට වාර්තා කල යුතුවේ.

කාර්යයන්/රාජකාරි

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පවත්නා ගිණුම් තැබීම සහ වාර්තාකරන ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා ඒවා සමාලෝචනය කිරීම හා ඇගයීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කිසියම් ගැටළු පැන නැඟී තිබෙනම් ඒවාට අදාල බලපෑම් විමර්ශනය කිරීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වත්කම් අලාභයන් සහ වංචාවලින් ආරක්ෂා වී තිබේදැයි නිශ්චිතව දැන ගැනීම.
- ගණුදෙනුවල ශක්‍යතාවය , ගණුදෙනුවල ප්‍රතිලාභ විමර්ශනය කිරීම සහ නාස්තිය සහ පමණ ඉක්මවා වියදම් කිරීම ඉවත් කිරීම තුලින් වියදම් අඩු කිරීමේ මාර්ග පිළිබඳව ගවේශණය කිරීම.
- ඉහත දැක්වෙන ක්‍රියාමාර්ග තුලින් සොයා දැනගන්නට ලැබෙන කරුණු පාදක කර ගනිමින් විගණන කමිටු වෙත වාර්තා ඉදිරිපත් කිරීම සහ විගණන කමිටු රැස්වීම් කැඳවීමට පියවර ගැනීම.
- විගණන කමිටු තීරණ සකස් කිරීම සහ අදාල නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස ඒවා අංශ ප්‍රධානීන් වෙත බෙදාහැරීම.
- විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත අර්ධ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම.

- අධ්‍යක්ෂ ජනරාල්/කොමිෂන් සභා සාමාජිකයන් ඉල්ලා සිටින විට විශේෂ විමර්ශන පැවැත්වීම.
- අධ්‍යක්ෂ ජනරාල්/කොමිෂන් සභාව විසින් කලින් කල පත් කරනු ලබන විවිධ කමිටු වලට සහායවීම හා නිර්දේශ ලබාදීම.

2016 වර්ෂයේදී , විගණන කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර එම රැස්වීම් වලදී පහත සඳහන් කරුණු සාකච්ජා කර ඇත.

ආවරණය වන විෂයය ක්ෂේත්‍ර පහත දැක්වේ.

1. 2016 පෙබරවාරි 11 දින පැවති විගණන කමිටු රැස්වීම

1.1 පහත දැක්වෙන වාර්තා/කරුණු සාකච්ජා කර ඇති අතර ඒ සඳහා ගන්නා ලද තීරණ/ක්‍රියාමාර්ග මතු දැක්වේ.

විෂයය ක්ෂේත්‍රය		ගන්නා ලද ක්‍රියාමාර්ග/තීරණ
1	මූල්‍ය උපකරණ හඳුනාගැනීම සහ මිනුම්කරණය - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39	
i.	වෙළඳ ණයගැතියන් ණය හා ලැබීම් වශයෙන් හඳුනාගත යුතු අතර ණය හිලව් කිරීමේ පිරිවැය අනුව මැනිය යුතුය.	මේ කාරණය සම්බන්ධයෙන් සුදුසු විසඳුමක් ලැබෙන තෙක් විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ සාකච්ජා කරන ලද අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ මූල්‍ය විසින් මේ සම්බන්ධයෙන් පාදක සටහනක් යෙදීමට උපදෙස් ලබා දෙන ලදී.
ii.	ආයෝජන නිරවද්‍යව ඉදිරිපත් කිරීම- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති -39	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
2	මූල්‍යය ප්‍රකාශන පිළියෙල කිරීම- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01	
i.	අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 අනුකූලව මූල්‍යය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
	ආ. මූල්‍යය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ද්‍රවශීලතාවයට අනුකූලව ඉදිරිපත් කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
	ඇ. ජංගම සහ ජංගම නොවන වත්කම් වර්ගීකරණය ප්‍රමිතියට අනුකූල නොවේ.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
ii.	වියදම්වල අසාමාන්‍ය වර්ගීකරණය ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැකිය හැකිය.	
	අ. අවත්වැඩියා හා නඩත්තු පිරිවැය ආයතන හා පරිපාලන වියදම්වලට එකතු කළ යුතුය.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
	ආ. අදාල ආදායම හෝ වියදම ගැලපීම වෙනුවට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් සඳහා අඩු/වැඩි වෙන්කිරීම් ආයතනය විසින් සිදු කර ඇත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
iii.	ව්‍යාපාර මෙහෙයුම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් අවශ්‍ය වන නමුත් ඒවා අනාවරණය කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම තොරතුරු අනාවරණය කිරීමට එකඟ වන ලදී.
iv.	I කෙරීගෙන යන වැඩ වශයෙන් හැඳින්විය නොහැකි රු.841,572 වටිනාකමකින් යුත්	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.

	ආනයනය කරන ලද ඩබල් කැබ් රථය කෙරීගෙන යන වැඩ යටතේ අන්තර්ගත වේ.	
3	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති -07	
i.	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ අයිතමවල වර්ගීකරණය අදාල නොවේ.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
4	දේපල, පිරියත සහ උපකරණ - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති -16	
i.	පරිහරණය සඳහා ලබා ගන්නා දින සිට වත්කම්වල ක්ෂයවීම ආරම්භ වේ.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
ii.	සම්පූර්ණයෙන්ම ක්ෂයවීම් කරන ලද දේපල, පිරියත සහ උපකරණවල දළ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
iii.	සමානුපාතවල වෙනස්කම් පිළිබඳව ප්‍රකාශනයේ කිසිම අනාවරණය කිරීමකින් තොරව රු.16,200,000 ප්‍රතිඇගයීම් සංචිතය ආයතනය විසින් ප්‍රතිප්‍රකාශිත කර ඇත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම තොරතුරු අනාවරණය කිරීමට එකඟ වන ලදී.
5	බදු - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17	
i.	රු.300,000,000 වටිනාකමින් යුත් නෙළුම් කුලුන ඉඩම සඳහා ගෙවන ලද බදු කුලිය දේපල, පිරියත සහ උපකරණ වශයෙන් ප්‍රාග්ධනීකරණය කිරීම.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එම තොරතුරු අනාවරණය කිරීමට එකඟ වන ලදී.
	ii.බදු සම්බන්ධයෙන් අනාවරණය කිරීම් ඉදිරිපත් කර නොමැත. නෙළුම් කුලුන ඉඩම සඳහා බදු කුලී- රු. 2,115,212,127/- 2014/12/31 දිනට ඉඩම වෙනුවෙන් රඳවාගත් බදු මුදල රු. 345,502/	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
6	සේවක ප්‍රතිලාභ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19	
i.	අදාල කාරණය හඳුනාගෙන ඇති අතර නියම කරන ලද ප්‍රතිලාභ සැලැස්ම විධිමත්ව ඉදිරිපත් කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
ii.	නියමිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාල අවශ්‍ය කරන අනාවරණය කිරීම් විධිමත්ව ඉදිරිපත් කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
7	අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් වෙන් කිරීම- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37	
i.	මූල්‍යය ප්‍රකාශනයේ රු. 47,346,608,433 වටිනාකමකින් යුත් අසම්භාව්‍ය වගකීම් ප්‍රමාණවත් ලෙස අනාවරණය කිරීම.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
8	1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (ඇ) වගන්තිය යටතේ නිකුත් කරන ලද විගණකාධිපති වාර්තාව 2014/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය	• ණයගැති ගිණුම්වල ණය ශේෂය දැක්වීම. • ණයගැතියන්ගේ ණය ශේෂයේ තත්ත්වය පැහැදිලි කරමින් කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

9	2003 වර්ෂයේදී ඉතුරුම් ගිණුම්වල තැන්පත්කරුවන් සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා නොගැනීම - ඇමරිකන් ඩොලර් 420,000	• මූල්‍ය ප්‍රකාශනයේ ඩොලර් පරිවර්තන ගාස්තුව දැක්වීම. • මෙම කරුණ සම්බන්ධයෙන් උපදෙස් අපේක්ෂා කරමින් කොමිෂන් පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
10	හම්බන්තොට , සූරියවැව තොරතුරු තාක්ෂණ උද්‍යානයේ ඉඩමේ තත්ත්වය.	2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කිරීමට.

1.2 2016 පෙබරවාරි 11 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු පහත දැක්වේ;

i. 2015/12/31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා කෙටුම්පත් කළ මූල්‍ය ප්‍රකාශනය

ii. අවසන් වරට පවත්වන ලද පොදු ව්‍යාපාර කමිටුවේ වාර්තා, පිලිතුරු, වර්තමාන තත්ත්වය හා ගන්නා ලද ක්‍රියාමාර්ග යනාදිය...

2. 2016 පෙබරවාරි 24 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම

2.1 සාකච්ඡා කරන ලද වාර්තා/කරුණු සහ ඒ සම්බන්ධයෙන් ලන්නා ලද තීරණ/ ක්‍රියාමාර්ග පහත දැක්වේ.

විෂයය ක්ෂේත්‍රය		**ගන්නා ලද ක්‍රියාමාර්ග/ තීරණ**
1	මූල්‍යය උපකරණ - හඳුනාගැනීම හා මිණුම්කරණය - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39	
i.	වෙළඳ ණයගැතියන් ණය හා ලැබීම් වශයෙන් හඳුනාගත යුතු අතර ණය හිලව් කිරීමේ පිරිවැය අනුව මැනිය යුතුය.	ණයගැතියන් ලැබිය යුතු ගිණුම් යටතේ දැක්වීම.
ii.	ආයෝජන නිරවද්‍යව ඉදිරිපත් කිරීම- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති -39	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
2	මූල්‍යය ප්‍රකාශන පිළියෙල කිරීම- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01	
i.	අ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 1 අනුකූලව මූල්‍යය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
	ආ. මූල්‍යය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් ද්‍රවශීලතාවයට අනුකූලව ඉදිරිපත් කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
	ඇ. ජංගම සහ ජංගම නොවන වත්කම් වර්ගීකරණය ප්‍රමිතියට අනුකූල නොවේ.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
ii.	වියදම්වල අසාමාන්‍ය වර්ගීකරණය ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දැකිය හැකිය.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
	අ. අළුත්වැඩියා හා නඩත්තු පිරිවැය ආයතන හා පරිපාලන වියදම්වලට එකතු කළ යුතුය.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.

	ආ. අදාල ආදායම හෝ වියදම ගැලපීම වෙනුවට ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ ආදායම් සහ වියදම් සඳහා අඩු/වැඩි වෙන්කිරීම් ආයතනය විසින් සිදු කර ඇත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
iii.	ව්‍යාපාර මෙහෙයුම් සහ ප්‍රධාන ක්‍රියාකාරකම් අවශ්‍ය වන නමුත් ඒවා අනාවරණය කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
iv.	කෙරීගෙන යන වැඩ වශයෙන් හැඳින්විය නොහැකි රු.841,572 වටිනාකමකින් යුත් ආනයනය කරන ලද ඩබල් කැබ් රථය කෙරීගෙන යන වැඩ යටතේ අන්තර්ගත වේ.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
3	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති -07S	
i.	මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනයේ අයිතමවල වර්ගීකරණය අදාල නොවේ.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
4	දේපල, පිරියත සහ උපකරණ - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති -16	
i.	පරිහරණය සඳහා ලබා ගන්නා දින සිට වත්කම්වල ක්ෂයවීම ආරම්භ වේ.	ගිණුම්වල සිදුකරන ලද ප්‍රතිපත්ති වෙනස්කම් අනාවරණය කිරීම.
ii.	සම්පූර්ණයෙන්ම ක්ෂයවීම් කරන ලද දේපල, පිරියත සහ උපකරණවල දළ වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ අනාවරණය කර නොමැත.	සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ප්‍රති ඇගයීම සහ සාධාරණ වටිනාකම ඉදිරිපත් කිරීම.
iii.	සමානුපාතවල වෙනස්කම් පිළිබඳව ප්‍රකාශනයේ කිසිම අනාවරණය කිරීමකින් තොරව රු.16,200,000 ප්‍රතිඇගයීම් සංචිතය ආයතනය විසින් ප්‍රතිප්‍රකාශිත කර ඇත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
5	බදු - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17	
i.	රු.300,000,000 වටිනාකමින් යුත් නෙළුම් කුලුන ඉඩම සඳහා ගෙවන ලද බදු කුලිය දේපල, පිරියත සහ උපකරණ වශයෙන් ප්‍රාග්ධනීකරණය කිරීම.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වර්තමාන තත්ත්වය අනාවරණය කිරීම.
ii.	බදු සම්බන්ධයෙන් අනාවරණය කිරීම් ඉදිරිපත් කර නොමැත. නෙළුම් කුලුන ඉඩම සඳහා බදු කුලී- රු. 2,115,212,127/- 2014/12/31 දිනට ඉඩම වෙනුවෙන් රඳවාගත් බදු මුදල - රු. 345,502/-	ඉඩමේ නිවැරදි වටිනාකම පරීක්ෂා කිරීම.
6	සේවක ප්‍රතිලාභ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති	
i.	අදාල කාරණය හඳුනාගෙන ඇති අතර නියම කරන ලද ප්‍රතිලාභ සැලැස්ම විධිමත්ව ඉදිරිපත් කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
ii.	නියමිත ප්‍රතිලාභ සැලසුම් වලට අදාල අවශ්‍ය කරන අනාවරණය කිරීම් විධිමත්ව ඉදිරිපත් කර නොමැත.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.
7	අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම් වෙන් කිරීම- ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37	

i. මූල්‍යය ප්‍රකාශනයේ රු. 47,346,608,433 වටිනාකමකින් යුත් අසම්භාව්‍ය වගකීම් ප්‍රමාණවත් ලෙස අනාවරණය කිරීම.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට එකඟ වන ලදී.

2.2 2016 පෙබරවාරි 24 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීමේදී සාකච්ඡා කරන ලද කරුණු පහත දැක්වේ;

i. 2015/12/31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා කෙටුම්පත් කළ මූල්‍ය ප්‍රකාශනය

3. 3. 2016 ජූනි 14 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම

3.1 සාකච්ඡා කරන ලද වාර්තා/කරුණු සහ ඒ සම්බන්ධයෙන් ලන්නා ලද තීරණ/ ක්‍රියාමාර්ග පහත දැක්වේ.

විෂයය ක්ෂේත්‍රය	**ගන්නා ලද ක්‍රියාමාර්ග/ තීරණ**
වාර්තා අංකය CIA/16/01 දිනය 2016/04/20 වැටුප් පිළියෙල කිරීමේ නව ක්‍රමය ක්‍රියාත්මක කිරීම.	අභ්‍යන්තර විගණන අංශය විසින් වැරදි නිරීක්ෂණය කර ඒවා නිවැරදි කිරීම පිණිස මූල්‍ය අංශයට දැනුම් දෙන ලදී.
වාර්තා අංකය CIA/16/03 දිනය 2016/06/01 මූල්‍යය බලතල පැවරීම 2016	• අධ්‍යක්ෂ මූල්‍යය විසින් තීරණ ප්‍රකාරව නිවැරදිකිරීම්/ සංශෝධනය කිරීම් සිදු කිරීමට උපදෙස් දෙන ලදී. • සංශෝධනය කරන ලද මූල්‍යය බලතල සීමාවන් 2016 සංශෝධනය කිරීමට.
වාර්තා අංකය CIA/16/04 දිනය 2016/06/08 විගණකාධිපතිගෙන් ලබා ගන්නා ලද වාර්තාව විගණන වාර්තා දාහතරක් (14) ක් සහ ඊට පිලිතුරු සාකච්ඡා කරන ලදී. 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (ඇ) වගන්තිය ප්‍රකාරව 2015/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිකුත් කරන ලද මූල්‍ය ප්‍රකාශනය අභ්‍යන්තර විගණනය නෙළුම් කුලුන ව්‍යාපෘතිය සහ හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානය විගණනය කිරීම.	• අභ්‍යන්තර විගණන අංශයේ පවතින පුරප්පාඩු පිරවීම. • නෙළුම් කුලුන හා හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට සුදුසු ආයතනයක සේවය ලබා ගැනීම.
වාර්තා අංකය CIA/16/04 දිනය 2016/06/08 විගණකාධිපතිගෙන් ලැබුණු වාර්තාව විදුලි සංදේශ බදු සහ සෙස් බදු එක්රැස් කිරීම	විදුලි සංදේශ බදු හා සෙස් බදු ගාස්තු සම්බන්ධයෙන් විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වල විගණකවරුන් විසින් සහතික කරන ලද වාර්තාකරණ ආකෘතියක් හඳුන්වාදීම.
වාර්තා අංකය CIA/16/04දිනය 2016/06/08 විගණකාධිපතිගෙන් ලැබුණු වාර්තාව මූල්‍යය ප්‍රකාශනය විගණනය - 2015/12/31	කමිටුව විසින් වහාම පිලිතුරු ලබා දෙන මෙන් උපදෙස් දෙන ලදී.

මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය- උපයන විට ගෙවීම.	කමිටුව විසින් තීරණයක් ගැනීම පිණිස මෙම චක්‍රලේඛය කොමිෂන් සභාව වෙත යොමු කිරීමට උපදෙස් ලබා දෙන ලදී.

4. 2016 ඔක්තෝම්බර් 28 දින පවත්වන ලද විගණන කමිටු රැස්වීම

4.1 සාකච්ඡා කරන ලද වාර්තා/කරුණු සහ ඒ සම්බන්ධයෙන් ලන්නා ලද තීරණ/ ක්‍රියාමාර්ග පහත දැක්වේ.

විෂයය ක්ෂේත්‍රය	**ගන්නා ලද ක්‍රියාමාර්ග/ තීරණ**
නෙළුම් කුලුන සහ තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය.	උක්ත ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කිරීමට කටයුතු යොදා ඇත.
විදුලි සංදේශ බදු සහ සෙස් බදු ගාස්තු එක්රැසු කිරීම.	• විදුලි සංදේශ බදු හා සෙස් බදු ගාස්තු සම්බන්ධයෙන් දුරකථන ක්‍රියාකාර සමාගම්වල විගණකාධිපතිවරුන් විසින් සහතික කරන ලද වාර්තාකරණ ආකෘතියක් හඳුන්වාදීම. • විදුලි සංදේශ බදු හා සෙස් බදු ගාස්තු සම්බන්ධයෙන් දුරකථන ක්‍රියාකාර සමාගම්වල විගණකාධිපතිවරුන් විසින් සහතික කරන ලද වාර්තාකරණ ආකෘතියක් හඳුන්වාදීම කඩිනම් කිරීම.
වාර්තා අංක CIA/16/02 දිනය 2016/05/25 ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් ගෙවිය යුතු හිඟ ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු.	සංඛ්‍යාත වර්ණාවලි අංශය සහ මූල්‍යය අංශය එක්ව කොමිෂන් සභාව වෙත කොමිෂන් සභා පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.
වාර්තා අංක CIA/16/04 දිනය 2016/08/09 ජංගම දුරකථන ක්‍රියාකාර සමාගම්වල බදු	ඉදිරියේදී නියමිත දිනය හෝ එදිනට පෙර බදු එක්රැස් කිරීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
වාර්තා අංකය CIA/16/05 දිනය 2016/08/09 වවුචර් ගෙවීම පරීක්ෂා කිරීම- 2016 ජනවාරි සිට මාර්තු දක්වා	පිලිතුරු වලට අනුකූලව ක්‍රියාමාර්ග ගැනීම.
වාර්තා අංකය CIA/16/06 දිනය2016/08/09 විදේශ ගමන්	• විදේශ ගමන් ලේඛනය යාවත්කාලීන කිරීම. • 2017 වර්ෂය සඳහා වාර්ෂික පුහුණු වැඩසටහන සකස් කිරීම. • පිලිතුරේ එකඟවූ පරිදි නිවැරදි ක්‍රියාමාර්ග ගැනීම.
වාර්තා අංකය CIA/16/07 දිනය 2016/10/24 විගණකාධිපතිගෙන් ලැබුණු වාර්තා • නෙළුම් කුලුන ව්‍යාපෘතිය ඉදිකිරීම. • නෙළුම් කුලුන ව්‍යාපෘතිය- උපදේශන සේවා.	උපදේශන ගාස්තු ගෙවීම සහ ව්‍යාපෘතිය දීර්ඝ කිරීමේ කාලය සඳහා අනුමැතිය ලබා ගැනීම.
අදාල බලධාරීන් වෙත ගෙවන ලද ව්‍යවස්ථාපිත ලෙවීම්වල සාරාංශය	කමිටුව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවල අන්තර්ගතය සටහන් කර ගන්නා ලදී.

2017 වර්ෂය සඳහා ආයතනික සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රසම්පාදන සැලැස්ම සහ අයවැය.	ඉහත සඳහන් ලියකියවිලි වහාම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම.
වාර්ෂික වාර්තාව - 2014 සහ 2015	2014 සහ 2015 /12/31 දිනෙන් අවසන් වර්ෂ සඳහා වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ගවල ප්‍රගතිය ඉදිරිපත් කිරීම.
වාර්ෂික විගණන වැඩසටහන -2017	කමිටුව විසින් නෙළුම් කුලුන සහ තොරතුරු තාක්ෂණ උද්‍යානය වැනි විශේෂ ව්‍යාපෘතිවල අභ්‍යන්තර විගණනය පිළිබඳ පාදක සටහනක් එක් කිරීමට යෝජනා කරන ලදී.

මූල්‍ය ප්‍රකාශනය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2016.12.31	2015.12.31 (RESTATED)
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත සහ උපකරණ	**4**	12,34,92,69,594	12,40,46,32,997
කෙරීගෙන යන වැඩ	**5**	11,30,19,18,644	9,61,02,06,384
ආයෝජන	**6**	35,70,97,404	22,46,05,53,336
අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම	**7**	1,32,17,39,434	1,43,96,74,995
ජංගම නොවන වත්කම් වල මුළු එකතුව		**25,33,00,25,076**	**45,91,50,67,712**
ජංගම වත්කම්			
ලැබිය යුතු ගිණුම්	**8**	6,55,04,38,085	5,82,09,53,940
පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්	**9**	3,96,715	53,24,290
ණය සහ අනෙකුත් ලැබීම්	**10**	13,19,31,361	27,90,18,537
මුදල් සහ සමානුපාත	**11**	12,06,31,93,512	91,66,68,961
මුළු ජංගම වත්කම්		**18,74,59,59,673**	**7,02,19,65,730**
මුළු වත්කම්		**44,07,59,84,749**	**52,93,70,33,442**
සම කොටස් සහ වගකීම්			
සම කොටස්			
රජයේ දායක මුදල්	**12**	52,62,14,744	52,62,14,744
සමුච්චිත අතිරික්තය		19,47,78,17,131	28,67,92,65,809
නැවත ඇගයූ අතිරික්තය		3,73,80,000	3,73,80,000
සම කොටස් වල මුළු එකතුව		**20,04,14,11,875**	**29,24,28,60,553**
ජංගම නොවන වගකීම්			
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන)		6,63,48,01,047	5,59,52,48,248
රඳවා ගැනීම්	**13**	87,91,98,298	80,68,18,929
පාරිතෝෂික දීමනා	**14**	25,96,474	42,42,627
නාගරික සංවර්ධන අධිකාරිය		9,45,00,00,000	9,45,00,00,000
ජංගම නොවන වගකීම්වල මුළු එකතුව		**16,96,65,95,819**	**15,85,63,09,804**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය

(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය) *(ඉතිරිය.....)*

	සටහන්	2016.12.31	2015.12.31
ජංගම වගකීම්			
ගෙවිය යුතු ගිණුම්	**15**	46,33,47,017	22,28,70,612
අත්තිකාරම් , තැම්පතු සහ වෙනත් ගෙවීම්	**16**	4,03,46,26,238	4,88,61,11,003
භාණ්ඩාගාරයට ගෙවිය යුතු	**17**	2,57,00,03,799	2,72,88,81,467
මුළු ජංගම වගකීම්		**7,06,79,77,054**	**7,83,78,63,082**
මුළු වගකීම්		**24,03,45,72,873**	**23,69,41,72,886**
මුළු සම කොටස් සහ වගකීම්		**44,07,59,84,749**	**52,93,70,33,439**

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් සමස්ථ මූල්‍ය ප්‍රකාශනයේ කොටසකි. කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනය මගින් 2016 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ සිදු කරන ලද කාර්යයන් පිළිබඳව සත්‍ය හා සාධාරණ සමාලෝචනයක් කර ඇති බවත් කාලපරිච්ඡේදය සඳහා අතිරික්ත එතැන් සිට අවසන් වන බවත් සහතික කරමි.

.....

එම්.කේ.ජයන්ත
අධ්‍යක්ෂ - මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශය පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම කොමිෂන් සභාව සතු වේ. කොමිෂන් සභාව වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදී.

.....

ඔස්ටින් ප්‍රනාන්දු
සභාපති

.....

එම්. කිංස්ලි ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල් (වැඩ බලන)

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය හෝ අලාභය සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2016.12.31	2015.12.31
ආදායම			
ආදායම	**18**	56,02,39,55,218	48,23,51,31,152
මුළු මෙහෙයුම් ආදායම		**56,02,39,55,218**	**48,23,51,31,154**
අඩු කළා : නියාමන වියදම්	**19**	-16,41,91,324	-9,78,43,863
මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම		**55,85,97,63,893**	**48,13,72,87,291**
අඩු කළා: වෙනත් වියදම්			
ආයතන සහ පරිපාලන වියදම්	**20**	54,83,74,998	52,98,69,832
මූල්‍ය සහ වෙනත් වියදම්	**21**	30,82,690	28,86,118
බොල් ණය ගැතියන් සඳහා වෙන් කිරීම්		-3,07,42,498	1,77,05,645
ඉක්ම නොවූ / (ඉක්මවූ) වෙන් කිරීම්		0	0
විදේශ විනිමය ගනුදෙනු මත (ලාභය) /අලාභය		-26,72,418	-65,50,542
මුළු වියදම		**51,80,42,772**	**54,39,11,053**
අඛණ්ඩ මෙහෙයුම් තුලින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පෙර		**55,34,17,21,121**	**47,59,33,76,238**
අඩු කළා: ආදායම් බදු		-72,77,60,032	-37,80,32,104
අඛණ්ඩ මෙහෙයුම් තුලින් වර්ෂය සඳහා ලාභය ආදායම් බදු ගෙවීමට පසු		**54,61,39,61,089**	**47,21,53,44,134**
වෙනත් විස්තීරණ ආදායම			
පාරිතෝෂික වෙන්කිරීම මත ලාභය / (අලාභය)		14,94,318	5,08,549
වර්ෂය සඳහා මුළු වෙනත් විස්තීරණ ආදායම		14,94,318	5,08,549
බදු ගෙවීමෙන් පසු වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම		**54,61,54,55,407**	**47,21,58,52,683**
අඩු කළා: ඒකාබද්ධ අරමුදල් දායකත්වය	**22-1**	-48,81,69,04,084	-43,65,21,19,487
ඒකාබද්ධ අරමුදලට දායකකිරීමෙන් පසුව වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම		**5,79,85,51,322**	**3,56,37,33,196**
එකතු කළා:			
ඉදිරියට ගෙනා මුළු විස්තීරණ ආදායම		**28,67,92,65,809**	**25,57,95,63,170**
අඩුකළා: ඒකාබද්ධ අරමුදලට දායකත්වය	**22-2**	**-15,00,00,00,000**	**0**
සුපිරි වාසි බදු		0	-46,40,30,556
		13,67,92,65,809	**25,11,55,32,614**
ඉදිරියට ගෙන ගිය මුළු විස්තීරණ ආදායම		**19,47,78,17,131**	**28,67,92,65,809**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශ
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	සටහන්	2016.12.31		2015.12.31
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ				
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ	**22**	51,57,49,69,413		46,83,93,11,572
බදු ගෙවීම්		-47,13,06,899		-32,03,68,348
සුපිරි වාසි බදු ගෙවීම්		0		-46,40,30,556
පාරිතෝෂික ගෙවීම්		-19,22,265		-8,70,483
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහ		**51,10,17,40,249**		**46,05,40,42,186**
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ				
දේපළ පිරියත සහ උපකරණ මිලට ගැනීම		-4,59,53,629	*	-20,62,24,879
කෙරීගෙන යන වැඩ යටතේ ව්‍යාපෘති		-1,69,17,12,259	*	-1,79,63,29,533
ස්ථාවර තැන්පතු ශුද්ධ ආයෝජන සහ ප්‍රති ගැනුම් ගිවිසුම යටතේ රජයේ සුරැකුම්පත්		22,10,34,55,931	*	-7,30,64,42,682
ස්ථාවර තැන්පතු ආයෝජන (පාරිතෝෂික ගෙවීම)		-43,00,000	*	-1,48,65,000
ප්‍රතිගැනුම් ගිවිසුම යටතේ රජයේ සුරැකුම්පත් වලින් පොළී ආදායම		2,10,10,15,117	*	96,79,97,435
දේපල පිරියත සහ උපකරණ අලෙවි කිරීම		3,76,850	*	1,66,73,344
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල		**22,46,28,82,010**		**-8,33,91,91,315**
මූල්‍ය ක්‍රියාකාරකම් මගින් උත්පාදනය වූ මුදල් ප්‍රවාහ				
අත්තිකාරම් ගෙවීම ලියාපදිංචි කිරීම		11,79,35,562		2,65,08,259
කොටස් වෙළඳපල ගණුදෙනු වලින් පොළී ආදායම		16,62,66,227		12,74,19,331
ඒකාබද්ද අරමුදල සඳහා ප්‍රේෂණ		-63,81,69,04,084		-43,65,21,19,486
ව්‍යාපෘති ණය - එක්සිම් බැංකුව (නෙළුම් කුලුන)		1,03,95,52,799		97,14,06,186
රඳවාගැනීම්		7,23,79,369		19,15,96,692
නාගරික සංවර්ධන අධිකාරිය		0		-15,00,00,000
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා යෙදවූ ශුද්ධ මුදල්		**-62,42,07,70,127**		**-42,48,51,89,019**
මුදල් හා මුදල් සමානුපාතවල ශුද්ධ (අඩුවීම) / වැඩිවීම		**11,14,38,52,133**		**-4,77,03,38,148**
මුදල් හා මුදල් සමානුපාතවල වෙනස්වීම				
2016 ජනවාරි 01 දිනට		91,66,68,961		5,68,04,56,567
(අඩුවීම) / වැඩිවීම		11,14,38,52,133		-4,77,03,38,148
මුදල් හා මුදල් සමානුපාතවල විනිමය අනුපාතය (අලාභය) / ලාභය		26,72,418		65,50,542
2016 දෙසැම්බර් 31 දිනට		**12,06,31,93,512**		**91,66,68,961**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමානුපාතවල වෙනස්කම් ප්‍රකාශනය
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	රාජ්‍යදායක වීම්	ප්‍රතිප්‍රමාණ අතිරික්ත	සමුච්චිත අතිරික්ත	මුළු සමානුපාත
2015 ජනවාරි 31 දිනට ශේෂය	52,62,14,744	3,73,80,000	25,57,95,63,170	26,14,31,57,914
අඩු කළා: සුපිරි වාසි බදු	-	-	-46,40,30,556	-46,40,30,556
	52,62,14,744	3,73,80,000	25,11,55,32,614	25,67,91,27,358
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	-	-	3,56,37,33,195	3,56,37,33,195
ප්‍රතිප්‍රකාශිත	-	-	-	0
2015 දෙසැම්බර් 31 දිනට ශේෂය	**52,62,14,744**	**3,73,80,000**	**28,67,92,65,809**	**29,24,28,60,553**
2016 ජනවාරි 31 දිනට ශේෂය	52,62,14,744	3,73,80,000	28,67,92,65,809	29,24,28,60,553
අඩුකළා: ඒකාබද්ද අරමුදලට මාරුකිරීම	-	-	-15,00,00,00,000	-15,00,00,00,000
	52,62,14,744	3,73,80,000	13,67,92,65,809	14,24,28,60,553
2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	-	-	5,79,85,51,322	5,79,85,51,322
2016 දෙසැම්බර් 31 දිනට ශේෂය	**52,62,14,744**	**3,73,80,000**	**19,47,78,17,132**	**20,04,14,11,875**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් - 2016.12.31

(මෙම සටහන්වල සියළුම වටිනාකම් වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ).

1. පොදු තොරතුරු

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව විදුලි සංදේශ ක්ෂේත්‍රය නියාමනය කිරීම සඳහා ස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයකි.

කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්යාලය අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08 පිහිටා තිබේ.

පනතේ සඳහන් පරිදි කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යයන් පහත සඳහන් වේ.

කොමිෂන් සභාව විසින් පනත යටතේ තමා සතු බලතල ජාතික යහපත ප්‍රවර්ධනය කිරීම සඳහා තමා වඩාත්ම යෝග්‍ය යයි තමා සලකන ආකාරයට සහ විශේෂයෙන්,

(අ) ශ්‍රී ලංකාවේ ජාතික හා අන්තර්ජාතික විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා සියලුම සාධාරණ ඉල්ලීම් ඉටු කළ හැකි වන පරිදි විශ්වාසය තැබිය හැකි සහ කාර්යක්ෂම සේවාවක්, (එවැනි සේවාවක් සැපයීම ප්‍රායෝගික නොවන අවස්ථාවල හැර) හදිසි සේවා, පොදු දුරකථන කුටි සේවා, නාමාවලි තොරතුරු සේවා, සමුද්‍රීය සේවා, ග්‍රාමීය සේවා සහ වෙනත් ප්‍රදේශවල ජාතික යහපත පිණිස අවශ්‍ය යයි සළකනු ලබන සේවා ඇතුළුව, සපයනු ලබන බවට වගබලා ගැනීම.

(ආ) (අ) ඡේදයේ ව්‍යාප්තියට හානියක් නොමැතිව, සෑම ක්‍රියාකරුවකුගේම බලපත්‍රයේ සඳහන් කර ඇති සේවාවන් සපයනු ලැබීම නිසැක කිරීම සඳහා, එකී සෑම ක්‍රියාකරුවෙකුටම අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය සහ කළමනාකරණ සම්පත් ඇති බවට සහ ඔහු විසින් ඒවා යොදා ගනු ලබන බවට වග බලා ගැනීම.

(ඇ) අය කරනු ලබන ගාස්තු සහ සපයනු ලබන විදුලි සංදේශ සේවාවන් සහ විදුලි සංදේශ උපකරණ වල තත්වය හා විවිධත්වය සම්බන්ධයෙන් පාරිභෝගිකයන්ගේ, ගැනුම්කරුවන්ගේ සහ වෙනත් පාවිච්චි කරන්නන්ගේ සම්බන්ධතාවයන් හා පොදුවේ මහජන යහපත ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ඈ) විදුලි සංදේශ සේවා හා සම්බන්ධ වාණිජ කටයුතු වල නිරත තැනැත්තන් අතර ඵලදායී තරඟකාරිත්වයක් පවත්වා ගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම සහ ඒ තැනැත්තන්ගේ කාර්යක්ෂමතාවය සහ පිරිමැසුම්දායක බව ප්‍රවර්ධනය කිරීම.

(ඉ) අභ්‍යන්තර සහ ජාත්‍යන්තර විදුලි සංදේශ පහසුකම් පිළිබඳ සීඝ්‍ර සහ අඛණ්ඩ සංවර්ධනයක් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) අත්‍යාවශ්‍ය ප්‍රමාදයන් හෝ බාධාවන්ගේ හෝ අවහිරවලින් තොර විශ්වාසදායක සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම තම වගකීම් ඉටු කිරීමට ක්‍රියාකරුවන්ට හැකිකම ඇති බවට නිසැක කිරීම.

(උ) විදුලි සංදේශ සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර ගැන නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සහ ඒ නව තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කිරීම සහ ඒ ක්‍රම භාවිතා කිරීම.

(ඌ) ශ්‍රී ලංකාවෙන් පිටත සිය ව්‍යාපාරික ස්ථාන ඇති, විදුලි සංදේශ සේවා බහුල වශයෙන් පාවිච්චි කරන්නන් ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාරික ස්ථාන පිහිටු වීම පිණිස දිරිගැන්වීම; සහ

(එ) ජාත්‍යන්තර සංක්‍රාන්ති සේවා සඳහා ශ්‍රී ලංකාව යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම.

2. පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සිය මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (“SLFRS”) සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනතේ නියමයන් අනුකූලව පිළියෙල කර ඇත.

ශ්‍රී ලංකා ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (“SLFRS”) පිළිබඳ නව කාණ්ඩයක් නිකුත් කර ඇති අතර 2012 ජනවාරි 01 දින හෝ එදිනට පසුව ආරම්භ වන වර්ෂය සඳහා ව්‍යවසායකයන් විසින් මෙම ප්‍රමිති ඵලදායි ලෙස අදාල කර ගැනීම අවශ්‍ය වේ.

3. විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

මෙම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් සඳහන් නොවන්නේනම් මිස ඉදිරිපත් කළ වර්ෂය සඳහා නිත්‍ය වශයෙන් අදාල වී ඇත.

3.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (‘’SLFRS”) අනුකූලව පිළියෙල කර ඇති මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ පිළියෙල කර ඇත. මෙම ගිණුම්වලට උද්ධමනකාරී සාධකයන් සඳහා ගැලපීම් කර නැත.

3.1.1 ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම්

ශේෂ පත්‍රයේ දිනට පසුව සිදු වූ සියලු ප්‍රමාණාත්මක සිද්ධීන් සැලකිල්ලට ගන්නා ලද අතර අවශ්‍ය අවස්ථාවල ගිණුම් සඳහා සුදුසු ගැලපීම් සිදු කර ඇත.

3.1.2 විදේශ විනිමය පරිවර්තනය කිරීම

ගණුදෙනු සිදුවූ අවස්ථාවේ පැවති විදේශ විනිමය අනුපාතය සියළු විදේශ මුදලින් වූ ගණුදෙනු සඳහා යොදාගෙන ඇත. ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකය අනුව විදේශ මුදලින් ඇති වත්කම් සහ වගකීම් පරිවර්තනය කරයි. ප්‍රතිඵල ලෙස ඇතිවන ලාභය හෝ අලාභය ආදායම් වියදම් ගිණුමේ දක්වා ඇත.

3.2 වත්කම් සහ වත්කම් තක්සේරු කිරීමේ පදනම.

3.2.1 දේපළ, පිරියත සහ උපකරණ

(අ) පිරිවැය

සියළුම දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂය පිරිවැය හෝ හානිකරන අලාභය මත සටහන් කරනු ලැබේ. දේපළ, පිරියත සහ උපකරණ පිළිබඳ පිරිවැය එහි ගැනුම් මිල සහ පරිහරණය කිරීමට අපේක්ෂිත වත්කම්වල සේවා තත්ත්වය මත සෘජු ආරෝපිත පිරිවැයෙන් සමන්විත වේ.

කොමිෂන් සභාවේ අයිතම ආශ්‍රිතව අනාගත ආර්ථිකමය ප්‍රතිලාභ රැගෙන ඒම හෝ ප්‍රවාහය කිරීම පිණිස ස්ථාවර ආකාරයෙන් වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම සහ වැඩි දියුණු කිරීමේ අරමුණින් සිදුකරන පසුව එන කාලපරිච්ඡේදය සඳහා පිරිවැය ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු ලැබේ. ආදේශන කොටස්වල ප්‍රකාශ කරන වටිනාකම් හඳුනාගනු නොලැබේ. අනෙකුත් සියළුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම් ඒවා සිදු කරන මූල්‍ය වර්ෂය තුළ පරිපූර්ණ වියදම් වලින් අය කරනු ලැබේ.

(ආ) ක්ෂය වීම්

ඉඩම් ක්ෂය කිරීමට නොහැකිය. සෙසු වත්කම් ක්ෂයකිරීමේදී ලාභය හෝ අලාභය දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල එක් එක් කොටස්වල ඵලදායී ජීවිත කාලය පුරා ක්ෂය කිරීමේ සරල රේඛීය ක්‍රමය මත හඳුනාගනු ලැබේ. අත්පත් කර ගන්නා වර්ෂයේදී ක්ෂය කිරීම වත්කම පරිහරණයට ගන්නා ලද මාසයේ සිට සමානුපාතික පදනම මත ගණනය කරනු ලබන අතර අදාල වත්කම ඉවත් කරන මාසයේදී ක්ෂය කිරීම සිදු නොකරයි.

(ඇ) ක්ෂය වීම් (ඉතිරි.....)

දේපළ, පිරියත සහ උපකරණවල ඇස්තමේන්තු කළ ඵලදායී ජීවිත කාලය

ගොඩනැගිලි	වසර 20 වැඩි
විදුලි සංදේශ උපකරණ	වසර 10 වැඩි
ලී බඩු සහ සවි කිරීම්	වසර 10 වැඩි
කාර්යාල උපකරණ	වසර 10 වැඩි
පරිගණක	වසර 04 වැඩි
වායුසමීකරණ යන්ත්‍ර	වසර 10 වැඩි
මෝටර් රථ	වසර 08 වැඩි
විදුලි උත්පාදන යන්ත්‍ර	වසර 10 වැඩි
විදුලි සෝපාන යන්ත්‍ර	වසර 10 වැඩි
කාර්යාල ලී බඩු	වසර 10 වැඩි
කාර්මික උපකරණ	වසර 10 වැඩි
වෙබ් සර්වර්	වසර 04 වැඩි
කාය වර්ධන උපකරණ	වසර 04 වැඩි
මාධ්‍ය ඒකකයේ උපකරණ	වසර 04 වැඩි

(ඇ.) කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවල පිරිවැය සඳහන් වේ. මෙය ප්‍රාග්ධනය අපේක්ෂාවෙන් ගොඩනැගිලි ඉදිකිරීම සහ පද්ධති සංවර්ධනයෙහිලා සෘජුවම වැය කරන ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ.

(ඉ) ශේෂපත්‍රයෙහි වත්කම් හෝ වගකීම් ඉවත් කිරීම

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක ප්‍රකාශ කරන වටිනාකම එහි පරිහරණය මත තවදුරටත් හඳුනාගනු නොලැබේ. දේපල, පිරියත සහ උපකරණවල ප්‍රකාශ කරන වටිනාකම සමඟ පරිහරණය කිරීමේ ලාභ ප්‍රයෝජන සැසඳීමෙන් දේපල, පිරියත සහ පාඩුව තීරණය වන අතර ‘‘වෙනත් අදායම්’’ ලාභය හෝ පාඩුව තුලින් ශුද්ධ ලාභය හඳුනා ගනු ලැබේ.

3.2.2. ආයෝජන

අයෝජනවල ප්‍රතිගැනුම් ගිවිසුම යටතේ මාස තුනකට නොඅඩු කාලයක් තුළ සිදු කරන ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් සහ කොටස් වෙළඳපල ආයෝජන ඇතුළත් වේ. වර්ෂය අවසානය දක්වා මෙම ආයෝජන පිරිවැය ධන උපචිත පොළිය මත සඳහන් වේ.

3.2.3.ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු ගිණුම් එක්රැස් කර ගත නොහැකි සියළුම වටිනාකම් සඳහා වන සියළුම දීමනා සහ මුල් බිල්පත් වටිනාකම් මත හඳුනාගනී. සම්පූර්ණ වටිනාකම රැස්කිරීම තවදුරටත් අපේක්ෂා කල නොහැකි විට අඩමාන ලැබීම් පිළිබඳ ඇස්තමේන්තු පිළියෙල කරණු ලැබේ.

3.2.4. මුදල් සහ මුදල් සමානුපාත

මුදල් සහ මුදල් සමානුපාත අතැති මුදල් සහ බැංකු තැන්පතු වලින් සමන්විත වේ. වත්කමක් පරිහරණය සඳහා යොදා ගැනීමේදී ක්ෂය වීම ආරම්භ වන අතර පරිහරණයෙන් ඉවත් කරන කල එහි ක්ෂයවීම අවසන් වේ.

3.3.වගකීම් සහ වෙන් කිරීම්

ශේෂපත්‍ර දිනට පවතින සියලුම ප්‍රමාණාත්මක වගකීම් මූල්‍ය ප්‍රකාශනයේ ඇතුලත් කර ඇති අතර ශේෂපත්‍ර දිනට පවතින නමුත් වටිනාකම නිවැරදිවම අගය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් වෙන් කිරීමක් සිදු කොට ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සඳහන් දින සිට වසරක් ඇතුලත ඉල්ලුම මත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීම් වශයෙන් සැලකේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් වශයෙන් සැලකේ.

3.3.1 ප්‍රාග්ධන බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම්

ශේෂපත්‍ර දිනට ඇති ප්‍රාග්ධන වියදම් බැඳියාවන් සහ අසම්භාව්‍ය බැරකම් ගිණුම් සඳහා සටහන් ලෙස හෙළිදරව් කර ඇත.

3.3.2.කාර්ය මණ්ඩල ප්‍රතිලාභ

(අ) විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම

වර්ෂය තුල විශ්‍රාම ගැනීමේ පාරිතෝෂික වෙන් කිරීම පහත දැක්වේ

	2016(රු)	**2015 (රු)**
2005 ජනවාරි 01 දිනට	40,942,627	36.686,637
ජංගම සේවා පිරිවැය	3,260,668	3,194,029
පොලී පිරිවැය	2,809,761	2,440,993
විස්තීර්ණ අදායම් ප්‍රකාශයේ ලාභ සහ අලාභ ගාස්තු	6,070,429	5,635,022
තථ්‍ය අලාභ/ (ලාභ)	(1,494,318)	(508,549)
ගෙවන ලද ප්‍රතිලාභ	1,922,265	870,482
2015 දෙසැම්බර් 31 දිනට	43,596,474	40,942,627

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම යටතේ අවශ්‍ය කරන පරිදි සියළුම සුදුසු සේවකයන් සඳහා වන ප්‍රතිලාභ සැලසුම් පිළිගෙන ඇත. ප්‍රතිලාභ සැලසුම්වල අරමුදල් නොමැත.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් මගින් සේවකයෙකු විශ්‍රාම ගැනීම මත ලබාගන්නා ප්‍රතිලාභවල වටිනාකම විස්තර කෙරේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිළිබඳ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනවල හඳුනාගත් වගකීම් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති - LKAS 19 : සේවක ප්‍රතිලාභවල නියම කර ඇති පරිදි පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් කොමිෂන් සභාව විසින් වාර්ෂිකව ගණනය කරනු ලැබේ.

පසුගිය වර්ෂයේ අධි හෝ ඌන වෙන් කිරීම් නිසා සිදුවන වෙනස්කම් මගින් පැන නගින ලාභය හෝ අලාභය එය සිදුවන කාලපරිච්ඡේදයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා අය කිරීම හෝ බැර කිරීම කරනු ලැබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශනවල වර්ෂය සඳහා පාරිතෝෂික අය කිරීම ක්ෂණිකව හඳුනාගනු ලැබේ. කොමිෂන් සභාව විසින් පාරිතෝෂික බැඳීම් සඳහා සමාන වටිනාකම ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරනු ලැබේ.

පහත සඳහන් ප්‍රධාන තථ්‍ය උපකල්පනයන් සැලකිල්ලට ගෙන කොමිෂන් සභාව විසින් පාරිතෝෂික වෙන් කිරීම සිදු කරනු ලැබේ.

පොළී අනුපාතිකය	- වාර්ෂිකව සියයට 7
වැටුප් වර්ධක අනුපාතය	- සියයට 1 සිට සියයට 6.7 දක්වා
විශ්‍රාම ගැනීමේ වයස	- අවුරුදු 60

(ආ) නිශ්චිත සහභාගී සැලසුම්

නිශ්චිත සහභාගී සැලසුමක් සඳහා සහභාගිත්වය පිළිබඳ බැඳීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ සිදු කරන ලද වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සේවක අර්ථසාධක අරමුදල (EPF) සහ සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල (ETF) සඳහා පිළිවෙලින් සියයට 15 සහ සියයට 3 ට නොඅඩු දළ පාරිශ්‍රමික ප්‍රමාණයකින් දායක වේ.

(ඇ) සේවක අර්ථසාධක අරමුදල

කොමිෂන් සභාවේ සියළුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වන අතර මේ සඳහා සිය මූලික වැටුපෙන් සියයට 10ක් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එම සේවකයාගේ මූලික වැටුපෙන් සියයට 15 දායකත්වය දරයි.

සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල

සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදල සඳහා කොමිෂන් සභාවේ සියළුම සේවකයන්ගේ මූලික වැටුපෙන් සියයට 3 ක ප්‍රමාණයක් දායක වේ.

3.4 ආදායම හඳුනා ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 අනුව උපචිත පදනම මත මූලික වශයෙන් ආදායම හඳුනාගෙන ඇත.

3.4.1 සෙස් ගාස්තු ක්‍රියාකරුවන්ගේ පිරිවැටුම මත ප්‍රතිශතයක් ලෙස (2%) අයකරනු ලැබේ.

3.4.2 ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම් වලට බලපත්‍ර නිකුත් කිරීමේදී ක්‍රියාකරුවන්ගේ බලපත්‍ර ගාස්තු මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

3.4.3. වෙළඳ බලපත්‍ර ගාස්තු

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 21 වන වගන්තිය ප්‍රකාරව කිසියම් තැනැත්තෙකුට බලපත්‍ර නිකුත් කිරීමේදී වෙළෙඳ බලපත්‍ර ගාස්තු මුදල් පදනම මත හඳුනාගනු ලැබේ.

3.4.4. විදුලි සංදේශ බදු

2011 අංක 21 දරණ විදුලි සංදේශ බදු පනත යටතේ විදුලි සංදේශ ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන විදුලි සංදේශ බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර පසුව රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කර ඇත.

3.4.5. විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව

2004 අංක 11 දරන මුදල් පනතේ 111 කොටස යටතේ බාහිර ප්‍රවේශ ක්‍රියාකරුවන්ගෙන් ලැබෙන විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායමක් වශයෙන් හඳුනා ගන්නා ලදී. පසුව මෙම ආදායමෙන් සියයට 50 ප්‍රතිශතයක් රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

3.4.6. ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු

2004 අංක 11 දරන මුදල් පනතේ 111 කොටස සහ 2011 දෙසැම්බර් 29 වන දිනැති අංක 1738/15 අතිවිශේෂ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කර ඇති රීති යටතේ බාහිර ප්‍රවේශ දුරකථන ක්‍රියාකාර සමාගම්වලින් ලැබෙන ජාත්‍යන්තර පිටතට යැවෙන ඇමතුම් බදු ආදායමක් වශයෙන් හඳුනාගෙන ඇති අතර දෙවනුව රජයේ ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කරන ලදී.

3.4.7. පොළී ආදායම

පොළී ආදායම ප්‍රතිගැනුම් ගිවිසුම යටතේ කෙටි කාලීන ස්ථාවර තැන්පතු සහ කෙටි කාලීන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන ලද අරමුදල් මත පොළී ආදායමෙන් සහ කොටස් වෙළඳපල ආයෝජනවලින් සමන්විත වේ. පොළී ආදායම කල්පිරෙන දිනය මත වන උපචිත ලාභය හෝ අලාභය වශයෙන් හඳුනා ගනී.

3.4.8. ආදායම් බදු

කොමිෂන් සභාව එහි ප්‍රධාන ආදායම් ප්‍රභවය මත ආදායම් බද්දෙන් නිදහස් කරනු ලැබේ. ආදායම් බදු ගාස්තුව පොළී ආදායමේදී පමණක් හඳුනාගනු ලැබේ.

ආදායම් බදු වර්ගීකරණය

වර්ෂය	වටිනාකම(රු.)
2014	70,000,000
2015	21,982,852
2016	635,777,180
එකතුව	**727,760,032**

3.4.9. ආර්ථික සේවා ගාස්තුව (ESC)

ආර්ථික සේවා ගාස්තුව විශේෂ අනුපාතිකයන් අනුව වගකිවයුතු පිරිවැටුම මත ගෙවිය යුතුවේ. 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ නියමයන් සහ දෙවනුව එහි සිදු කරන ලද සංශෝධනයන් ප්‍රකාරව ආර්ථික සේවා ගාස්තුව ආදායම් බදු වගකීම් වලින් අඩු කරනු ලැබේ. පනතේ අදාල විධිවිධාන ප්‍රකාරව සියළු හිමිකම් නොලබන ලද ගෙවීම් ඉදිරියට ගෙන යා හැකි අතර ගෙවිය යුතු ආදායම් බදු හිලව් කරණු ලැබේ.

3.5. වියදම

වියදම ආදායමේ විශේෂ අයිතමවල ඉපැයීම් සහ දරණ පිරිවැය අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන විස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ හඳුනාගනු ලැබේ. කොමිෂන් සභාවේ කටයුතු පවත්වාගෙන යාම සහ කාර්යක්ෂම ආකාරයෙන් ප්‍රාග්ධන වත්කම් නඩත්තු කිරීමෙහිලා සිදු කරන සියළුම වියදම් වර්ෂය සඳහා අතිරික්ත ආදායමෙන් අයකරගනු ලැබේ.

3.6. ව්‍යාපෘති

3.6.1 කොළඹ නෙළුම් කුලුන

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (ශ්‍රී.ල.වි.ස.නි.කොා. සභාව) විසින් 2010 ඔක්තෝම්බර් 27 සහ 2011 දෙසැම්බර් 14 දිනැති පිළිවෙලින් යොමු අංක 10/2473/401/301 සහ 11/2262/501/026 දරණ අමාත්‍ය මණ්ඩල තීරණ ප්‍රකාරව ''කොළඹ නෙළුම් කුලුන'' නමින් මීටර් 350 ක් උසැති බහු කාර්යය රූපවාහිනී සහ විදුලි සංදේශ කුලුන ඉදි කිරීමට ආරම්භ කර ඇත. එමෙන්ම අමාත්‍ය මණ්ඩලය විසින් මෙම ව්‍යාපෘතියේ ඉදි කිරීමට කටයුතු China National Electronics Importers & Exports Corporation (CEIEC) හා Aeraspace Long March International Trade Co. Ltd. (ALIT) සමාගම්වලට ප්‍රදානය කරන ලදී.

කොන්ත්‍රාත්කරු සඳහා ලබාදුන් කාලය දීර්ඝ කරන ලද අතර මෙම ව්‍යාපෘතිය 2017 ඔක්තෝම්බර් 31 දින වන විට අවසන් කිරීමට අපේක්ෂිතය.

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමෙන් පසු 2 වන අදියර වශයෙන් සුවිශාල විනෝදාස්වාදය සපයන උද්‍යානයක් ඉදිකිරීම සැලසුම් කිරීම ආරම්භ කිරීමට නියමිතය.

මෙම ඉදිකිරීමේ පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 104.3 වශයෙන් ඇස්තමේන්තු කර ඇති අතර, ඉන් 85% ක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ඇපකරුවකු වශයෙන් අත්සන් තබන ලද, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සහ EXIM බැංකුව විසින් අත්සන් කරන ලද අංක BLA-201207 දරණ ගැනුම්කරුවන්ගේ ණය ගිවිසුම යටතේ - Export-Import Bank of China (EXIM) බැංකුව විසින් වසර 14 ක ණය ක්‍රමය මත මුදල් සපයන ලදි. ඇමරිකානු ඩොලර් මිලියන 15.645 ක් වන සියයට 15ක් වූ ව්‍යාපෘති පිරිවැය ශේෂය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් දරනු ඇත.

වැඩබිමේ ද්‍රව්‍ය ඇතුලත්ව සිදු කරන ලද සමස්ථ කාර්ය අන්තර්ගතව ව්‍යාපෘතියේ නිම කරන ලද ව්‍යාපෘතිය සියයට 61.25 ක් වන අතර ඇමරිකන් ඩොලර් මිලියන 61.285 ක් වැය වී ඇත. 2016.12.31 දින වන විට පවත්නා රඳවා ගැනීම් සහ අත්තිකාරම් පියවා ගැනීම් පිළිවෙලින් ඇමරිකන් ඩොලර් මිලියන 5.215 ක් සහ ඇමරිකන් ඩොලර් මිලියන 8.861 ක් වූහ.

කොළඹ නෙළුම් කුලුන ව්‍යාපෘතිය ඉදිකිරීම පිණිස ලබා ගන්නා ලද එක්සිම් බැංකු ණය මුදල සියයට සියයක වෙන්කළ ණය මුදලක් වන බැවින් , ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 23 ප්‍රකාරව ව්‍යාපෘතිය අවසන් වන විට මුළු ණය මුදල් පිරිවැය සහ අදාල වියදම් සම්පූර්ණයෙන්ම ප්‍රාග්ධනීකරණය කෙරෙනු ඇත.

3.6.2 ඉඩම - නෙළුම් කුලුන

2011 දෙසැම්බර් 22 දිනැති යොමු අංක 11/2262/501/026TBR දරණ අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අක්කර 7 රූඩ් 2 පර්චස් 8.41 (හෙක්ටයාර 3.0564) ප්‍රමාණයකින් සමන්විතව ''කොළඹ නෙළුම් කුලුන'' ඉදිවන නෙළුම් කුලුන භූමිය නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පොළී රහිතව පවරා දෙනු ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) හා නාගරික සංවර්ධන අධිකාරිය (UDA) විසින් අත්සන් කළ අවබෝධතා ගිවිසුම අනුව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් රුපියල් මිලියන 1500 මූලික ගෙවීමක් සහ පැවරීමේ ගිවිසුම අත්සන් කළ දින සිට වසර 34ක් ඇතුලත රුපියල් මිලියන 300 ක් ගෙවීමට එකඟ විය.

ඉඩම භාර දුන් දින සිට අදාල බලධරයා වෙත උපයෝගී බිල්පත් සහ තක්සේරු අනුපාත ගෙවීමට යටත්ව, 2012 ජුලි 18 දිනැති, නාගරික සංවර්ධන අධිකාරියේ ලිපිය මගින් හිස් භෞතික අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට භාර දෙන ලදි. අදාල බලධාරින් විසින් නියමිත පටිපාටිවලට යටත්ව හිමිකම් අයිතිය පැවරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබයි.

3.6.3. තොරතුරු තාක්ෂණ උද්‍යානය, හම්බන්තොට, සුරියවැව

2012.06.14 දිනැති අංක 12/0836/501/019 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සලකා බලා අමාත්‍ය මණ්ඩලය විසින් 2012 ජූලි 04 දින පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළැඹි තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථාන ව්‍යාපෘතිය (හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යාන ව්‍යාපෘතිය) ස්ථාපනය කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර) ව්‍යාපෘති ඉන්ජිනේරු වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) පත් කරන ලදී,

අනුමත ටෙන්ඩර් පටිපාටිය මත , ඉදිකිරීමේ පිරිවැය රුපියල් 2,493, 870,318 සහිතව සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම වෙත ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරන ලදී.

සැලසුම් කර ඇති පරිදි, 2015 ජූනි වන විට ගොඩනැගිල්ලේ තෙවන මහල දක්වා සැලකිය යුතු පමණකින් ගොඩනැගිලි ව්‍යුහය සම්පූර්ණ කරන ලදී. නමුත් මෙම ප්‍රදේශයේ වෙනත් සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කළ ආකාරයට ආරම්භවී නැති බවත් , එය තොරතුරු තාක්ෂණ උද්‍යානයෙන් අපේක්ෂිත විවිධ ආදායම් උත්පාදන හැකියාවන් කෙරෙහි අහිතකර අන්දමට බලපා ඇති බවත් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ආයෝජන මණ්ඩලය හා ජනාධිපති ලේකම් කාර්යාලය නිරීක්ෂණය කර ඇති අතර. මෙම ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ ඉන්ජිනේරු උපදේශක වශයෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව (SLLRDC) ව්‍යාපෘතිය ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ කටයුතු වල නිරත වන අතර, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම අතර එලැඹුණු කොන්ත්‍රාත්තුව 2016 අගෝස්තු 10 දින

අවසන් විය. එබැවින් ව්‍යාපෘති ඉන්ජිනේරු වන ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශය ප්‍රකාරව, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම සමග වූ කොන්ත්‍රාත්තුව අවසන් කිරීම හැර වෙනත් විකල්පයක් නොතිබිණි. මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද මුළු පිරිවැය රුපියල් මිලියන 715 ක් (ආපසු අය කර ගැනීමට ඇති රුපියල් මිලියන 157 අත්තිකාරම් මුදල ඇතුලත්ව) වන අතර සීමාසහිත තුඩාවේ සහ සහෝදරයෝ (පෞද්ගලික) සමාගම නැමැති කොන්ත්‍රාත්කරු, කොන්ත්‍රාත්තුව අවසන් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව ආරාවුල් බේරුම්කාර මණ්ඩලය වෙත යොමු කර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, රාජ්‍ය හා පෞද්ගලික හවුල් පදනම මත මෙම ව්‍යාපෘතිය දියුණු කරමින් ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව මේ වන විට සලකා බලමින් පවතී.

වැඩබිමේ ද්‍රව්‍ය ඇතුලත්ව සිදු කරන ලද සමස්ථ කාර්ය අන්තර්ගතව ව්‍යාපෘතියේ නිම කරන ලද ව්‍යාපෘතිය සියයට 33 ක් වන අතර රුපියල් මිලියන 350 ක් වැය වී ඇත. 2015.12.31 දින වන විට පවත්නා රඳවා ගැනීම් සහ අත්තිකාරම් පියවා ගැනීම් පිළිවෙලින් රුපියල් මිලියන 33.9 සහ රුපියල් මිලියන 67.9 ක් විය.

3.7. අවිනිශ්චිත වියදම්

(අ) <u>දිසා අධිකරණ නඩු අංකය 6188/2010</u>

Gewaan Engineering සමාගමේ හිමිකරු වන ගාමිණී රාජපක්ෂ මහතා, ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වගඋත්තරකරුවකු කරමින්, අංක 6188/2010 දරන නඩුව දිසා අධිකරණයේ ගොනු කර ඇත.

2007 ජූලි 19 දින පැමිණිලිකරු හා වගඋත්තරකරු අතර එළැඹී ගිවිසුම උල්ලංගනය කිරීම මත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ඒ සඳහා වූ හානිය අයකර ගැනීම පිණිස පැමිණිලිකරු මෙම නඩුව ගොනු කර ඇති අතර අපේක්ෂිත සහන යටතේ පැමිණිලිකරු හානිය වෙනුවෙන් අපේක්ෂිත මුදල රු. මිලියන 1.5 කි.

(ආ) **<u>මහාධිකරණය සිවිල් නඩු අංක 137/2011</u>**

නීත්‍යානුකූල මැදිහත්වීම ඇතිව නඩු තීන්දුවේ දිනය දක්වා රුපියල් බිලියන 47 ,345,112,000 සම්පූර්ණ මුදල පියවන තෙක් නඩු තීන්දුවේ මුදල රැස්කර ගැනීමේ නඩු තීන්දුව/නියෝගය සඳහා සීමාසහිත ELECTROTEKS සමාගම විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එරෙහිව අංක HC (Civil) 137/11 දරන නඩුව පවරා ඇත.

සංඛ්‍යාත බලපත්‍ර ගාස්තුව රු. 172, 500,000 සහ රු. 2,300,000 නොපියවීම මත වගඋත්තරකරු විසින් ප්‍රතිස්ථාපනය කිරීමේ ගාස්තුවක් අයකර ඇත.

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ගිණුම් සටහන - 2016.12.31 *(ඉතිරිය.....)*
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

4. <u>දේපල, පිරියත සහ උපකරණ</u>

පිරිවැය	**2016.01.01** දිනට ශේෂය ප්‍රතිප්‍රකාෂිත	**2016** වර්ෂය සඳහා		**2016.12.31** දිනට ශේෂය
		එකතු කිරීම්	ඉවත් කිරීම් / මාරු කිරීම්	
ඉඩම්	14,88,63,771	0		14,88,63,771
බද්දට ගත් ඉඩම	3,45,502	0		3,45,502
ගොඩනැගිලි	15,03,81,065	0		15,03,81,065
කොකාවිල් කුලුන	31,49,33,479	0		31,49,33,479
වවුනියා කුලුන	2,99,00,741	0		2,99,00,741
වාහන	16,87,17,224	0	0	16,87,17,224
වායු සමීකරණ	1,39,90,092	11,14,060		1,51,04,152
විදුලි සෝපාන	46,83,848	0		46,83,848
විදුලි උත්පාදක යන්ත්‍ර	26,65,428	0		26,65,428
පරිගණක	9,06,99,387	11,00,100	75,000	9,18,74,487
වෙබ් සර්වර්	22,13,661	0		22,13,661
වෙනත් කාර්යාල උපකරණ	2,86,18,979	30,77,159	40,000	3,17,36,137
ජංගම දුරකථන	10,61,867	0		10,61,867
කාර්යාල උපකරණ	2,02,57,035	8,53,422	1,64,500	2,12,74,957
තාක්ෂණ උපකරණ	3,61,99,813	3,26,19,073	15,000	6,88,33,886
FMMS ව්‍යාපෘති නිරීක්ෂණ උපකරණ	6,17,12,127	0		6,17,12,127
FMMS ව්‍යාපෘති උපකරණ	40,83,03,544	0		40,83,03,544
කායවර්ධන උපකරණ	56,29,707	0		56,29,707
විඩියෝ ඒකක උපකරණ	1,09,61,059	16,11,207		1,25,72,266
පරිගණක මෘදුකාංග	34,40,168	49,89,606		84,29,774
	1,50,35,78,493	**4,53,64,627**	**2,94,500**	**1,54,92,37,622**
නෙළුම් කුලුන ඉඩම	11,71,52,12,127	0	**0**	11,71,52,12,127
	13,21,87,90,620	**4,53,64,627**	**2,94,500**	**13,26,44,49,749**

ක්ෂය කිරීම	2016.01.01 දිනට ශේෂය	2016 වර්ෂය සඳහා		2016.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	ඉවත් කිරීම් / මාරු කිරීම්	
ගොඩනැගිලි	11,13,03,571	45,89,778		11,58,93,349
කොකාවිල් කුලුන	15,00,57,430	3,14,93,348		18,15,50,778
වවුනියා කුලුන	1,49,50,371	29,90,074		1,79,40,445
වාහන	7,38,08,448	2,00,93,797		9,39,02,245
වායු සමීකරණ	98,06,970	7,12,724		1,05,19,694
විදුලි සෝපාන	46,83,848	0		46,83,848
විදුලි උත්පාදක යන්ත්‍ර	26,65,428	0		26,65,428
පරිගණක	7,16,23,881	82,16,696	75,000	7,97,65,577
වෙබ් සර්වර්	22,13,661	0		22,13,661
වෙනත් කාර්යාල උපකරණ	2,01,30,158	16,43,532	40,000	2,17,33,690
ජංගම දුරකථන	5,77,577	80,279		6,57,856
කාර්යාල උපකරණ	1,24,62,025	14,74,660	1,64,500	1,37,72,184
තාක්ෂණ උපකරණ	1,55,13,707	47,96,337	15,000	2,02,95,044
FMMS ව්‍යාපෘති නිරීක්ෂණ උපකරණ	39,08,451	77,14,016		1,16,22,467
FMMS ව්‍යාපෘති උපකරණ	30,46,13,061	1,10,12,372		31,56,25,433
කායවර්ධන උපකරණ	42,09,180	14,07,427		56,16,607
විඩියෝ ඒකක උපකරණ	1,01,21,839	5,63,074		1,06,84,912
පරිගණක මෘදුකාංග	15,08,019	45,28,919		60,36,938
	81,41,57,622	**10,13,17,032**	**2,94,500**	**91,51,80,156**
ශුද්ධ පොත් අගය	**12,40,46,32,997**			**12,34,92,69,594**

සටහන්:

ඉඩම සඳහා අගය වන රු. 148,235,572 තුල මීගමුව කදිරාන පිහිට ඇති රු. 45,000,000.00 වටිනා ඉඩම්වල වටිනාකම්ද ඇතුලත්ය. එම ඉඩමේ විශාලත්වය අක්කර 112 රූඩ් 02 පර්චස් 10.5කි. ඉඩමේ විශාලත්වයෙන් අසන්න වශයෙන් සියයට 50 ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් විසින් අත්පත් කරගෙන ඇත. එම අත්පත් කර ගැනීමෙන්වූ බලපෑම ගිණුම්වලට ගෙන නැත.

5. කෙරී ගෙන යන වැඩ

	2016.01.01 දිනට ශේෂය	2016 වර්ෂය සඳහා		2016.12.31 දිනට ශේෂය
		එකතු කිරීම්	(මාරු කිරීම්)	
පද්ධති මෘදුකාංග ස්ථාපනය කිරීම	1,36,42,063	-1,36,42,063		0
ප්‍රවේශ ශාලාව සහ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල	1,00,57,910	0		1,00,57,910
නෙළුම් කුලුන ඉදිකිරීම	9,07,75,71,973	1,56,13,58,609		10,63,89,30,582
තොරතුරු තාක්ෂණ උද්‍යානය - හම්බන්තොට	50,89,34,439	14,39,95,713		65,29,30,152
ඩබල් කැබ් - අපනයනය	0	0	0.00	0
WASH ROOM නවීකරණය කිරීම	0	0		0
	9,61,02,06,384	**1,69,17,12,259**	**0.00**	**11,30,19,18,644**

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
ගිණුම් සටහන - 2016.12.31 *(ඉතිරිය.....)*
(ශ්‍රී ලංකා රුපියල් වලින් ප්‍රකාශිතය)

	31.12.2016	31.12.2015
6. ආයෝජන		
භාණ්ඩාගාර තැන්පතු	35,40,00,000	35,40,00,000
ස්ථාවර තැන්පතු - මහජන බැංකුව	0	12,75,00,00,000
ප්‍රතිගැනුම් ගිවිසුම යටතේ රජයේ සුරැකුම්පත්	0	9,15,00,00,000
	35,40,00,000	22,25,40,00,000
ස්ථාවර තැන්පතු සහ ප්‍රතිගැනුම් ගිවිසුම යටතේ ලැබිය යුතු පොළී	30,97,404	20,65,53,336
	35,70,97,404	**22,46,05,53,336**
7. අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම		
අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම (නෙළුම් කුලුන)	1,09,26,02,866	1,19,83,52,636
අත්තිකාරම් ගෙවීම් ලියාපදිංචි කිරීම (තොරතුරු තාක්ෂණ උද්‍යානය)	22,91,36,568	24,13,22,359
	1,32,17,39,434	**1,43,96,74,995**
8. ලැබිය යුතු ගිණුම්		
ලැබිය යුතු සෙස් ගාස්තු	39,75,38,451	33,92,19,175
ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු	1,20,89,27,093	88,76,21,501
ලැබිය යුතු පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ඇමතුම් ගාස්තු	7,28,80,642	11,94,37,954
ලැබිය යුතු විදුලි සංදේශ බදු	1,89,26,59,609	1,91,35,96,295
අයවිය යුතු කොකාවිල් කුලුන	9,16,65,480	8,34,77,886
අයවිය යුතු හිග කාර්ය මණ්ඩල ණය	25,47,337	25,52,169
ලැබිය යුතු ගුවන් ටිකට්පත්	0	0
ලැබිය යුතු කොකාවිල් බදු කුලී A/C	1,32,94,668	0
ලැබිය යුතු කෙටි සංකේත අංක	20,433	0
වෙළඳ ණයගැති **08** අ	2,87,09,04,371	2,22,50,48,960
ජංගම ක්‍රියාකරු බදු	0	25,00,00,000
	6,55,04,38,085	**5,82,09,53,940**

08 අ. වෙළඳ ණයගැතියෝ

ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු	3,21,29,14,856		2,59,78,16,315
ආධුනික ගුවන් විදුලි බලපත්‍ර ගාස්තු	44,783		30,411
	3,21,29,59,639		2,59,78,46,726
අඩු කළා - බොල් ණය ගැතියන් සඳහා වෙන් කිරීම **	-34,20,55,268		-37,27,97,766
	2,87,09,04,371		**2,22,50,48,959**

සටහන : (1)	**ණයගැතියන්**	%	**වෙන්කිරීම**
***බොල්ණය ගැතියන් සඳහා වෙන් කිරීම**			
වසර 02ට වඩා වැඩි	34,16,14,949	100	37,16,20,005
වසර 01 ට වඩා වැඩි වසර 02ට වඩා අඩු	4,40,319	10	11,77,762
වසර 06 ට වඩා වැඩි වසර 01ට වඩා අඩු	0		0
වසර 02 ට වඩා වැඩි මාස 06ට වඩා අඩු	0		0
වසර 01 ට වඩා වැඩි මාස 02ට වඩා අඩු	0		0
මාස 01ට වඩා අඩු	0		0
	34,20,55,268		**37,27,97,766**

සටහන : (2)

ඉහත ආකාරයෙන් පිළිවෙලින් වසරකට වඩා වැඩි බොල් සහ අඩමාන ණයගැතියන් සඳහා සියයට 100 සහ සියට 10 වෙන් කිරීම් ලබා දීමෙන් පසු සාධාරණ අගයකින් යුතුව බොල් ණය ගැතියන් ප්‍රකාශ කෙරේ.

		2016.12.31	2015.12.31
9. පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්			
පූර්ව ගෙවීම්		0	0
විශේෂ අතිකාරම්		575	575
උත්සව අත්තිකාරම්		2,10,000	2,72,000
ගැනුම් අත්තිකාරම්		1,86,140	1,51,640
ස්ථාවර වත්කම් සංක්‍රමණ		0	49,00,075
		3,96,715	**53,24,290**
10. ණය හා වෙනත් ලැබීම්			
ආපදා ණය		2,79,99,773	2,58,90,225
මෝටර් රථ ණය		9,85,11,236	10,56,20,762
දේපල ණය		27,02,529	31,14,049
මෝටර් බයිසිකල් ණය		4,87,546	3,59,331
අයකර ගත යුතු වැටුප් අඩු කිරීම්		27,655	27,655
වෙනත් ලැබීම්		20,56,122	25,56,326
ලැබිය යුතු පොදු රක්ෂණ හිමිකම A/C		21,500	0
CEB ආරක්ෂක ඇප තැන්පතු A/C (IT PARK)		1,25,000	
එකතු කළ අගය මත බදු පාලන ගිණුම		0	14,14,50,189
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්		0	0
හිමි විය යුතු ආර්ථික සේවා ගාස්තු		0	0
		13,19,31,361	**27,90,18,537**
11. මුදල් හා මුදල් සමානුපාත			
බැංකු මුදල්	**11 අ**	79,86,416	64,10,35,061
අතැති මුදල්	**11 ආ**	55,000	2,37,503
කොටස් වෙළඳපල ඉතුරුම් ගිණුම්		12,05,51,52,097	27,53,96,397
		12,06,31,93,512	**91,66,68,961**
11 අ. බැංකු මුදල්			
මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව (තැන්පතු ගිණුම)			
ගිණුම් අංක.119/RFC /SA/USD/0032		8,45,12,221	8,01,33,717
නාරාහේන්පිට ශාඛාව (එකතු කිරීමේ ගිණුම)			
ජංගම ගිණුම් අංක.119-1-001-4-3693169		-11,54,34,747	31,85,98,221
මහජන බැංකුව - නාරාහේන්පිට ශාඛාව			
ජංගම ගිණුම් අංක.119-1-001-6-3693264		2,04,298	23,27,68,161
ලංකා බැංකුව - නාරාහේන්පිට ශාඛාව			
ජංගම ගිණුම් අංක.2323167		3,87,04,643	95,35,509
		79,86,416	**64,10,35,608**
11ආ. අතැති මුදල්			
සුළු මුදල් - ප්‍රධාන කාර්යාලය		10,000	10,000
සුළු මුදල් - පාලන හා මානව සම්පත්		5,000	5,000
සුළු මුදල් - කොකාවිල්		10,000	10,000
සුළු මුදල් - නෙළුම් කුලුන		25,000	25,000
සුළු මුදල් - අධක්ෂ ජනරාල් කාර්යාලය		0	15,000
සුළු මුදල් - අනුකූලතා		5,000	5,000
සුළු මුදල් - විමර්ශන		0	0
අතැති මුදල් - (එකතු කිරීමේ ගිණුම)		0	1,67,503
		55,000	**2,37,503**

12. රජයේ දායක වීම්

ලෝක බැංකු ණය ගිවිසුම්	29,85,72,434	29,85,72,434
එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන	1,95,33,906	1,95,33,906
වෙනත් රජයේ දායකවීම්	20,81,08,404	20,81,08,404
	52,62,14,744	**52,62,14,744**

13. රඳවා ගැනීම්

රඳවා ගැනීම් - නෙළුම් කුලුන	79,09,16,803	74,29,09,015
රඳවා ගැනීම් - තොරතුරු තාක්ෂණ උද්‍යානය	8,82,81,496	6,39,09,914
	87,91,98,298	**80,68,18,929**

14. පාරිතෝෂික ප්‍රතිලාභ

පාරිතෝෂික සඳහා වෙන් කිරීම්	4,35,96,474	4,09,42,627
ස්ථාවර තැන්පතු (පාරිතෝෂික)	-4,10,00,000	-3,67,00,000
ශුද්ධ ප්‍රතිලාභ වගකීම්	**25,96,474**	**42,42,627**

15. ලැබිය යුතු ගිණුම් උපචිත වියදම්

දුරකතන - කාර්යාල	12,86,332	5,78,063
- නිවාස	0	2,25,472
වැටුප් පාලන (කොන්ත්‍රාත් සේවකයන්)	1,34,543	21,13,111
ගෙවිය යුතු වැටුප්	2,16,384	1,18,134
ගෙවිය යුතු වන්දිඹු හා අනත්දරු	2,991	72,678
විදුලිය	26,70,660	26,40,460
ජලය	43,978	31,573
සනීපාරක්ෂක සේවා	6,02,691	4,14,824
ආරක්ෂක සේවා	17,82,235	12,52,200
අතිකාල	15,78,169	7,35,994
සේවක අර්ථ සාධක අරමුදල	28,26,964	28,55,772
සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	3,38,397	3,40,354
අන්තර්ජාල	3,56,466	2,61,993
වෛද්‍ය රක්ෂණ හිමිකම්	2,50,995	2,50,995
ගමන් සහ යැපීම් දීමනා	19,460	
කාර්ය මණ්ඩල සුභ සාධනය	2,46,342	1,75,830
පුවත් පත් සහ නිවේදන	43,325	72,055
විගණක ගාස්තු	12,78,110	12,67,520
බදු කුලී	6,24,984	4,55,810
ප්‍රසාද දීමනා	1,97,74,777	1,83,19,345
රඳවා ගැනීම්	40,595	60,595
2/3 පොළිය ප්‍රතිපූරණය කිරීම	0	2,00,962
දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල් (ආර්ථික සේවා ගාස්තු , ජාතිය ගොඩනැගීමේ බදු, මුද්දර ගාස්තු)	4,90,92,689	0
වැටුප් අඩු කිරීම්	2,28,055	87,292
අලුත්වැඩියා සහ නඩත්තු	0	2,95,104
ගෙවිය යුතු ගුවන් ටිකට්පත්	1,12,120	1,34,500
ගෙවිය යුතු මුද්දර ගාස්තු	10,33,933	8,53,310
ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු (කොමිෂන් සභා සාමාජික දීමනා)	20,55,248	77,905
විවිධ	11,76,166	6,99,01,484
ආදායම් බදු සඳහා වෙන් කිරීම්	37,55,30,411	11,90,77,278
	46,33,47,017	**22,28,70,612**

16. <u>අත්තිකාරම් තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු දෑ</u>			
අත්තිකාරම් ලෙස ලැබුණු ආදායම්		3,93,71,01,869	4,82,13,96,341
ටෙන්ඩර් සඳහා ආපසු ගෙවිය යුතු තැන්පතු		15,46,667	16,86,667
ආපසු ගෙවිය යුතු තැන්පතු - සේවක		20,86,843	20,86,843
මෙගාහර්ට් 1800 පරාසය සඳහා ලැබුණු අත්තිකාරම්		5,75,00,000	5,75,00,000
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ			
ඵලදායී ආපදා කළමනාකරණ සමුළුව		34,210	34,210
හානි වූ ඇන්ටෙනා සඳහා රක්ෂණ හිමිකම්		25	25
සංඛ්‍යාත අය කර ගැනීම		17,48,731	17,30,776
CTO විදුලි සංදේශ මධ්‍යස්ථාන ව්‍යාපෘති		9,24,492	9,24,492
එකතු කල අගය මත බදු පාලන ගිණුම		3,29,31,752	0
ඉදිකිරීම් ණයගැතියන්		7,51,650	7,51,650
		4,03,46,26,238	4,88,61,11,003
17. <u>භාණ්ඩාගාරයට ගෙවිය යුතු දෑ</u>			
භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ සංවර්ධන අරමුදල 50%		60,44,63,546	44,38,10,750
භාණ්ඩාගාරයට ගෙවිය යුතු පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු		7,28,80,642	11,94,37,954
භාණ්ඩාගාරයට ගෙවිය යුතු විදුලි සංදේශ බදු		1,89,26,59,611	1,91,56,32,763
ජංගම දුරකථන ක්‍රියාකරු බදු		0	25,00,00,000
		2,57,00,03,799	2,72,88,81,467
18. <u>ආදායම</u>			
ආදායම - බලපත්‍ර ගාස්තු	**18 අ**	15,85,93,09,005	11,65,42,66,334
විදුලි සංදේශ බදු		30,34,63,76,676	27,85,93,39,451
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු	**18 ආ**	8,69,05,91,326	5,86,58,10,050
පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු		1,12,76,78,211	1,60,57,15,317
ජංගම දුරකථන ක්‍රියාකරු බදු		0	1,25,00,00,000
		56,02,39,55,218	48,23,51,31,152
18 අ. <u>ආදායම - බලපත්‍ර ගාස්තු</u>			
පද්ධති ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු		1,75,13,44,170	10,77,08,483
සෙස් ගාස්තු		4,06,71,79,362	3,84,07,42,141
ගුවන් විදුලි සංඛ්‍යාත ගාස්තු		7,49,60,92,897	6,75,61,45,435
සංඛ්‍යාත පූර්ව ගාස්තු		36,73,46,939	0
වෙළඳ බලපත්‍ර ගාස්තු		1,47,70,619	1,30,86,877
ආධුනික ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු		72,958	55,738
නැව් මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු		8,92,001	7,64,455
ගුවන් යානා මධ්‍යස්ථාන බලපත්‍ර ගාස්තු		11,69,944	9,40,818
රැහැන් රහිත දුරකතන බෙදා හැරීමේ ගාස්තු		9,07,60,198	6,67,57,611
විභාග ගාස්තු		4,17,138	3,93,858
අයදුම්පත්‍ර සැකසීමේ ගාස්තු		16,32,651	65,31,511
කෙටි සංකේත අංක ගාස්තු		1,93,87,755	1,47,95,918
අතිරික්ත ආදායම - 18 අ (1)		2,29,54,12,016	1,11,71,43,155
		16,10,64,78,647	**11,92,50,66,000**
අඩුකළා: ජාතිය ගොඩ නැගීමේ බදු		-24,71,69,642	-27,07,99,666
		15,85,93,09,005	**11,65,42,66,334**

18 අ(1). <u>අනෙකුත් ආදායම්</u>

කාර්ය මණ්ඩල ණය වලින් ලද පොළී ආදායම	54,29,347	54,79,557
තැන්පතු මත පොළී ආදායම	1,96,44,52,870	36,53,70,996
ප්‍රතිගැනුම් ගිවිසුම මත පොළී ආදායම	13,65,62,247	60,26,26,438
කොටස් වෙළඳපල ගණුදෙනු මත පොළී ආදායම	16,62,66,227	12,74,19,331
වෙනත් ආදායම් (ප්‍රදාන)	0	0
කොකාවිල් බදු කුලී	2,11,67,983	
ස්ථාවර වත්කම් ඉවත් කිරීම මත ලාභය / පාඩුව	3,76,850	1,28,07,094
උසාවි නඩු වලින් අය කර ගැනීම	0	32,86,623
විවිධ	11,56,492	1,53,116
	2,29,54,12,016	**1,11,71,43,155**

18 ආ. <u>විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC)</u>

විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම	8,69,05,91,326	5,86,58,10,050
අඩු කළා:		
විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ණය මුදා හැරීම	0	0
	8,69,05,91,326	**5,86,58,10,049**

19. <u>නියාමන වියදම්</u>

ITU වාර්ෂික සාමාජික මුදල	2,48,76,586	2,23,17,681
APT වාර්ෂික සාමාජික මුදල	22,78,072	20,80,912
SAFIR වාර්ෂික සාමාජික මුදල	6,04,416	5,45,611
SATRC සඳහා දායකත්වය	0	3,48,618
වාර්ෂික පුස්තකාල සාමාජික මුදල	15,000	94,914
CTO වාර්ෂික සාමාජික මුදල	39,97,302	42,28,300
නියාමන කටයුතු සඳහා සහභාගී වීම	2,22,28,930	1,50,06,042
නඩු ගොනු කිරීම, පෙනී සිටීමේ උසාවි ක්‍රියාමාර්ග	33,39,278	49,13,866
විදුලි සංදේශ සංවර්ධනය පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම	0	7,51,617
ජාල සංවර්ධනය අධීක්ෂණය කිරීම	0	56,333
පොදු දුරකථන කුටි කර්මාන්තය පිළිබඳ සමීක්ෂණය	4,796	0
අන්තර් ජාලයෙන් ළමයින් ආරක්ෂා කිරීම	4,87,646	0
පාසල් හා ප්‍රජාව සම්බන්ධීකරණය කිරීම	0	2,48,500
SATRC රැස්වීම	0	0
විවිධ නියාමන වියදම්	16,52,713	19,16,907
විශේෂ අවශ්‍යතාවයන් සහිත තැනැත්තන් සඳහා සන්නිවේදන පහසුකම් සැපයීම	10,54,244	0
ආර්ථිකමය සමාජ වගකීම	10,15,75,000	1,29,13,925
සේවා තත්ත්ව පිළිබඳ සමීක්ෂණය	0	5,60,000
විදේශීය නියෝජිතයන් පැමිණීම	4,13,542	1,39,847
විදුලි සංදේශ නියාමකයන් පිළිබඳ ගෝලීය සමුළුව	0	3,05,23,871
තොරතුරු සන්නිවේදන තාක්ෂණය වැඩි දියුණු කිරීම	55,550	0
සගරා සහ ප්‍රකාශන	0	3,885
නෙළුම් කුලුන ව්‍යාපෘතිය	2,09,531	3,10,042
නියාමන කටයුතු සඳහා ප්‍රවාහන හා යැපීම් දීමනා	13,98,719	0
ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා සත්කාරකත්වය දැක්වීම	0	8,82,992
	16,41,91,324	**9,78,43,863**

20. ආයතන සහ පරිපාලන වියදම්

වැටුප්	13,42,08,108	13,69,97,048
සේවක අර්ථසාධක අරමුදල (15% දායකමුදල්)	1,93,10,021	3,27,30,228
සේවක භාරකාර අරමුදල (3% දායක මුදල්)	45,86,673	54,81,100
ජීවන වියදම් දීමනා	0	0
ප්‍රවාහන දීමනා	1,87,56,408	1,87,84,215
ගෙවල් කුලී දීමනා	1,16,81,493	1,15,36,561
වෙනත් දීමනා	15,53,687	34,75,727
කාර්ය සාධන දිරි දීමනා	2,90,97,764	2,89,75,290
විශේෂ දීමනා	5,31,589	2,90,667
අමතර දීමනා	2,35,85,722	2,32,10,352
ප්‍රසාද දීමනා	1,25,49,822	1,23,92,498
අතිකාල දීමනා	1,02,57,964	70,74,216
සභාපතිගේ දීමනා	12,00,000	7,98,362
පාවිච්චි නොකළ විවේක නිවාඩු දීමනා	1,13,17,504	93,03,758
විශ්‍රාම වැටුප් සඳහා කොමිෂන් සභාවේ දායකත්වය	4,85,815	8,55,998
නිවාස දුරකථන	27,78,853	26,93,413
නිල ඇඳුම්	4,74,511	4,73,350
කාර්ය මණ්ඩල සුභසාධනය	84,22,002	72,29,695
ක්‍රීඩා ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම	8,87,567	11,93,361
කාර්ය මණ්ඩල වුර්තිය සාමාජික මුදල් දායකත්වය	4,17,935	4,44,977
දේශීය පුහුණු	13,76,700	2,44,750
කොමිෂන් සභා සාමාජිකයින්ගේ දීමනාව	1,75,000	1,11,500
විගණන කමිටු දීමනා	1,50,000	73,500
2/3 නිවාස ණය මුදල ප්‍රතිපුරණය කිරීම	31,37,421	43,21,359
ප්‍රවාහන හා යැපීම් දීමනා	2,46,277	20,577
පාරිතෝෂික	32,60,668	31,94,029
විදුලිය	1,38,79,419	1,28,25,132
ජලය	7,44,517	8,88,964
සනීපාරක්ෂක සේවා	51,41,810	47,67,049
ආරක්ෂක සේවා ගාස්තු	83,99,435	50,03,893
වරිපනම් හා බදු	9,17,093	9,17,093
පුස්තකාල පොත්	1,67,125	1,24,100
මුද්‍රණ හා ලිපි ද්‍රව්‍ය	80,52,509	84,64,273
ඉන්ධන	27,14,740	24,57,155
විදුලි භාණ්ඩ	1,32,950	8,43,153
තැපැල් ගාස්තු	8,79,546	10,52,542
දුරකථන , ෆැක්ස් සහ PABX	72,72,401	67,94,017
රක්ෂණ (දේපල සහ වෛද්‍ය)	4,66,05,122	4,76,19,530
අන්තර්ජාල ගාස්තු	46,12,123	11,28,031
වාහන කුලී ගාස්තු	0	1,80,000
පුවත්පත් හා දැන්වීම්	44,06,543	64,47,935
උපදේශන ගාස්තු	0	1,88,752
සම්මේලන සහ සම්මන්ත්‍රණ	4,12,102	28,595
විගණන ගාස්තු	6,00,000	6,00,000
නීති වියදම්	4,17,504	4,76,228
කල්බදු දේපල සඳහා කුලී	4,42,660	17,14,648
ප්‍රවාහන ගාස්තු	0	67,760
කල්බදු අන්තර්ජාල කුලී	0	35,43,909
ක්ෂයවීම්	10,13,17,032	8,37,06,446

විවිධ පාලන වියදම්		3,76,522	16,78,746
විවිධ මිලදී ගැනීම් සහ සැපයීම		10,69,214	5,52,078
විවිධ මෙහෙයුම් පිරිවැය		8,68,384	1,41,148
කාර්යාල උපකරණ නඩත්තු වියදම්		24,94,583	40,63,125
විදුලි සෝපාන නඩත්තු කටයුතු		5,85,000	0
විදුලි උත්පාදන යන්ත්‍ර නඩත්තු කටයුතු		2,26,008	
වාහන නඩත්තු වියදම්		47,74,022	45,89,946
ගොඩනැගිලි නඩත්තු වියදම්		49,05,172	17,39,715
තාක්ෂණික උපකරණ නඩත්තු වියදම්		15,72,029	14,51,096
මෘදුකාංග නඩත්තු වියදම් සහ සංවර්ධන වියදම්		1,96,24,833	1,33,02,086
වැඩි දියුණු කල LOTUS DOMINION සර්වර්		0	0
වැඩි දියුණු කල පිරික්සුම් පද්ධතිය		0	0
වැඩි දියුණු කල පිරික්සුම් පද්ධතිය		35,75,804	5,67,196
කුළුණු නඩත්තු වියදම්		7,39,294	38,960
		54,83,74,998	52,98,69,832

21. මූල්‍ය හා අනෙකුත් ගාස්තු

බැංකු ගාස්තු		2,72,329	3,12,251
මුද්දර බද්ද		600	1,32,875
පාරිතෝෂික මුදල් වෙන්කිරීම මත පොළිය		28,09,761	24,40,993
		30,82,690	**28,86,118**

22. ඒකාබද්ද අරමුදලට දායකවීම

2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදුලි සංදේශ පනත යටතේ දායකවීම	**22-1**	13,00,00,00,000	10,00,00,00,000
2016.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් පනත යටතේ			
ගෙවන ලද විදුලි සංදේශ බදු		30,34,39,30,211	27,86,12,85,917
විදුලි සංදේශ සංවර්ධන ගාස්තුවෙන් 50%		4,34,52,95,663	2,93,51,18,252
ගෙවන ලද පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු බදු		1,12,76,78,211	1,60,57,15,317
ජංගම දුරකථන බදු (විශේෂ සම්පූර්ණයෙන් මුදල් එකවර ගෙවීමේ බදු)		0	1,25,00,00,000
		48,81,69,04,084	**43,65,21,19,487**

විදුලි සංදේශ පනත යටතේ දායකවීම

	22-2		
2015.12.31 දිනට මුළු විස්තීරණ ආදායම හැර		15,00,00,00,000	0

23. මෙහෙයුම් තුලින් උත්පාදනය වූ මුදල්

බදු වලට පෙර ශුද්ධ ලාභය		**55,34,17,21,121**	**47,59,33,76,236**
ගැලපුම්			
දේපල පිරියත සහ උපකරණ ක්ෂයවීම		10,13,17,032	8,37,06,446
බොල් සහ අඩමාණ ණය ණයගැතියන්		-3,07,42,498	1,77,05,645
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්		32,60,668	31,94,029
ස්ථාවර තැන්පතු හා ප්‍රතිගැනුම් ගිවිසුම මගින් පොළී ආදායම		-2,10,10,15,117	-96,79,97,435
කොටස් වෙළඳපළ ගනුදෙනු වලින් පොළී ආදායම		-16,62,66,227	-12,74,19,331
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් මත පොලී පිරිවැය		28,09,761	24,40,993
විදේශ මුදල් ගනු දෙනු මත ලාභය		-26,72,418	-65,50,542
ස්ථාවර වත්කම් ඉවත්කිරීම මත ලාභය		-3,76,850	-1,28,07,094

කාරක ප්‍රාග්ධනය වෙනස්වීම

ලැබිය යුතු ගිණුම්	**23-1**	-69,87,41,648	-2,28,34,93,981
පූර්ව ගෙවීම් සහ අත්තිකාරම්		49,27,575	-29,50,317
ණය හා වෙනත් ලැබීම්		14,70,87,176	26,97,10,489
ගෙවිය යුතු ගිණුම්	**23-2**	-1,59,76,728	-4,59,56,017
අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ගෙවීම්		-85,14,84,766	2,31,63,52,449
භාණ්ඩාගාරයට ගෙවිය යුතු		-15,88,77,668	0
මෙහෙයුම් තුලින් උත්පාදනය වන මුදල		**51,57,49,69,413**	**46,83,93,11,572**

23-1. ලැබිය යුතු ගිණුම්

ලැබිය යුතු සෙස් ගාස්තු	39,75,38,451	33,92,19,175
ලැබිය යුතු විදුලි සංදේශ සංවර්ධන ගාස්තු	1,20,89,27,093	88,76,21,501
ලැබිය යුතු පිටතට යැවෙන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු	7,28,80,642	11,94,37,954
ලැබිය යුතු විදුලි සංදේශ බදු	1,89,26,59,609	1,91,35,96,295
අය විය යුතු කොකාවිල් කුලුන	9,16,65,480	8,34,77,886
නිග කාර්ය මණ්ඩල ණය අයවීම්	25,47,337	25,52,169
ලැබිය යුතු ගුවන් ටිකට් පත්	0	0.00
ගුවන් විදුලි සංඛයාත ගාස්තු	3,21,29,14,856	2,59,78,16,315
ලැබිය යුතු කොකාවිල් බදු කුලී	1,32,94,668	0
ලැබිය යුතු කෙටි සංකේත අංක	20,433	0
ආධුනික ගුවන්විදුලි බලපත්‍ර ගාස්තු	44,783	30,411
ජංගම ක්‍රියාකරු බදු	0	25,00,00,000
	6,89,24,93,354	**6,19,37,51,706**
	-69,87,41,648	

23-2. ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ප්‍රකාරව	46,33,47,017	22,28,70,612
අඩු කළා: ආදායම්	-37,55,30,411	-11,90,77,278
බදු සඳහා වෙන් කිරීම	**8,78,16,606**	**10,37,93,334**
	-1,59,76,728	

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සිඑමදෙ/ප්/විආර්සී/01/16/20 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 පෙබරවාරි 19 දින

සභාපති

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තිර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22(ඒ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාතෘ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2017 දෙසැම්බර් 06 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්වලින් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අදාළ පවතින්නා පාලනය නිරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ඇස 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණකය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන්, අවදානම තක්සේරුකිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටී සැලසුම් කිරීම පිණිස ආයතනයේ සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණන සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය නත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 නත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1

ප්‍රමිතයේ 99 ඡේදය ප්‍රකාරව ආයතනයක් විසින් එහි වියදම්, වියදම්වල ස්වභාවය අනුව හෝ ආයතනයේ කාර්යයන්ට අදාළවන ආකාරයට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතු වුවත් නියාමන වියදම්වලට පරිබාහිර කාර්යයන් සඳහා වැය කර නිබුණු රු. 101,575,000 ක් සභාවේ කටයුතු නියාමනය කිරීමේ වියදම් (Regulatory Expenses) ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා නිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) කොමිෂන් සභාවට අයත් ලෙස පසුගිය වසර 13 දක්වා අවසන් ගිණුම්වල යටිතනක් මගින් දක්වා නිබූ තවාන ප්‍රතිදේශයේ පිහිටි අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ක ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් තවාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අත්පත් කරගෙන නිබුණි. සමාලෝචිත වර්ෂයේ මෙම පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල කිසිදු වෙනසක් හෝ කර නොතිබුණි.

(ii) පංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 473,547,519 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණ ද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ. ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18

මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර අවුරුදු 10 කට හා අවුරුදු 05 කට වරක් අළුත් කිරීමේදී අයකරන ගාස්තු අළුත් කිරීම සිදුකළ වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගෙන තිබුණි. එසේ වුවත් මේ සඳහා අදාල කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි. ඒ අනුව ඉකුත් වර්ෂයේ රු. 107,708,483 ක් වූ මෙහෙයුම් ක්‍රියාකරු බලපත්ර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂයේදී රු.1,751,344,170 ක් දක්වා විවලනය වී තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23

නෙළුම් කුළුණ ඉදිකිරීමේ කටයුතු සඳහා එ.ජ. ඩොලර් මිලියන 88.66 ක ණය මුදලක් 2012 වර්ෂයේදී ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා එයින් එ.ජ. ඩොලර් මිලියන 43.75 ක් වැය කර තිබුණි. මෙම ණය මුදල වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රු. මිලියන 1,987 ක ණය ගැනුම් පිරිවැයක් දරා තිබුණද ප්‍රමිතිය ප්‍රකාරව ප්‍රාග්ධනීත කරන ලද සුදුසුකම් ලත් ණය ගැනුම් පිරිවැයෙහි ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 38

පරිගණක මෘදුකාංග. අස්පෘශ්‍ය වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වූවිද පිරිවැය රු.8,429,774 ක් වටිනා පරිගණක මෘදුකාංග ලද්පල. පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර වත්කම් ලෙස පරිගණක සාලගත කිරීම සඳහා වැය කරන ලද රු. 761.531 ක් හා පල පොම්ප මිලදී ගැනීම් වෙනුවෙන් වැය කරන ලද රු. 146.750 ක් අළුත්වැඩියා හා නඩත්තු වියදම් යටතේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු එකතුකළ අගය මත බදු මුදල් උපලේඛනය අනුව රු. 60,447.939 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගෙවිය යුතු බදු මුදල ලෙස රු. 32.931.752 ක් දක්වා තිබීම හේතුවෙන් එම ශේෂය රු. 27.516.187 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) පාරිතෝෂික මුදල් ස්ථාවර තැන්පතු සඳහා සමාලෝචිත වර්ෂයේ ලද රු. 3.097.404 ක පොලි මුදල, පාරිතෝෂික ස්ථාවර තැන්පතුවලට එකතු කර පෙන්විය යුතු වුවත් එසේ නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ආයෝජනවලට එකතුකර දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල නොළුම් කුළුණු ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා උපදේශනාත්මක සේවාවන් ලබාගැනීමේ වියදම් ඇතුළුව එකතුව රු. 7.568.582 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඉ) මූල්‍ය ගිණුම්කරණ සටහන් 3.4 ට අනුව උපචිත පදනම් මත හඳුනා නොගත් සෙස්, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (TDC). පිටතට යැවෙන ඇමතුම් ගාස්තු බදු (Levy on OLAC) හා විදුලි සංදේශ බදු (Telecommunicution Levy) සඳහා රු.3.572.005.795 ක් ලැබිය යුතු අයිතම ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු සෙස් ගාස්තු ශේෂය රු. 397.538.451 ක් ලෙස දක්වා තිබුණද උපලේඛනය අනුව එය රු. 395.260.175 ක් වූ අතර රු. 2.278.276 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) වැටුප් පාලන ගිණුම්හි ශේෂය ගුණාව පවතී යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට රු. 134,543 ක ශේෂයක් පැවතිණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනා අනුව සංඛ්‍යාත ආදායම් රු. 7,496,092,897 ක් වුවද මාසික බදුගෙවීම් උපලේඛන අනුව එය රු. 7,028,943,336 ක් වූයෙන් රු.467,149,561 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණු කුලී පදනම් මත භාවිතා කිරීම සඳහා ආයතන 09 ක් වෙත සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලබාදී තිබූ අතර එයින් ආයතන 05 ක් සම්බන්ධයෙන් ගිවිසුම්ගතව නොතිබුණි. මේ අනුව එම ආයතනවලින් අයවිය යුතු කුලී ගාස්තු හා විදුලි ගාස්තු අයකර ගැනීම්.සඳහා ක්‍රමවේදයක් නොතිබුණු අතර මේ සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වනවිට වර්ෂ 03 සිට වර්ෂ 06 දක්වා කාලයක් ගත වී තිබුණි. 2012 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා විදුලි ගාස්තු ලෙස කොමිෂන් සභාව විසින් ගෙවා තිබුණු රු. 91,665,480 ක් මෙම ආයතනවලින් අයවිය යුතුව පැවතුණි.

(ආ) සන්නිවේදන ක්‍රියාකරුවන් වේවෙනකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු තම්හෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) 2011 අංක 21 දරන විදුලි සංවේදී බදු පනත අනුව ක්‍රියාකරුවන් 05 වෙනකුගෙන් නියමිත පරිදි බදු සහ අධිභාර අයකර ගෙන නොතිබුණි.

(ඈ) සංඛ්‍යාත ආදායම් අයකර ගැනීම් සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබීම හේතුවෙන් කොමිෂන් සභාවේ ණයගැතියන් ලෙස සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු. 3,212,959,639 ක ශේෂයෙන් රු. 341,614,949 ක් වර්ෂ 02 කට වැඩි ණයගැතියන් විය. මෙම ණය ශේෂය තුළ වර්ෂ 20 කට වැඩි කාලයක සිට ශේෂව පැවති ණය ශේෂයන්ද ඇතුළත් වී තිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට ලබාදුන් සංඛ්‍යාත සඳහා 1981 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අයකිය යුතුව පැවති රු. 154,438,373 ක ගාස්තු අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ඊ) ඉලෙක්ට්‍රොටෙක් ලිමිටඩ් වෙතින් 2008 මාර්තු 01 දින සිට 2009 පෙබරවාරි 28 දින දක්වා වාර්ෂික බලපත්‍ර ගාස්තුව වශයෙන් රු.172,500,000 ක් අයකිය යුතුව පැවතුණි.

(උ) තහවුරු ලිපි යැවීම සඳහා ණයගැතියන් තෝරාගැනීම පදනමකින් තොරව සිදුකර තිබුණ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 3,212,959,639 ක් වටිනාකමැති ණයගැතියන් 2,619 දෙනෙකු සිටියද තහවුරු ලිපි යවා තිබුණේ ණයගැතියන් 90 දෙනෙකු සඳහා පමණි. එයින් 69 ක් ශූන්‍ය ශේෂ සඳහා වූ අතර ඉතිරි ණයගැතියන් 21 හි අගය රු. 863,061,566 ක් විය.

2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම
(අ) 1971 අංක 38 දරන මූදල් පනතේ 11 වන වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් රු. 5,400,000,000 ක මූදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.
(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	උපයන පිට ගෙවීම් මත බදු අදාල නිලධාරීන්ගේ වැටුප්පත් අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු වුවද, ඊට පටහැනිව කොමිෂන් සභාවේ අරමුදලින් රු.7,231,842 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහය	
	(i) මූදල් රෙගුලාසි 261(3)	දිනපතාම මූදල් පොතෙන් ගණන් හිඳුවා එකතු කොට ශේෂය දැන ගත යුතුය. ප්‍රමාණවත් තරම් මූදල් ඇතොත් මිස නිසියම් ගෙවීමක් මූදල් පොතෙහි සටහන් කිරීම හෝ ගෙවීම සඳහා චෙක්පත් නිකුත් කිරීම හෝ නොකළ යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මහජන බැංකු ගිණුමට අදාළ මූදල් ශේෂය රු. 115,434,747 ක සෘණ අගයක් නිබුණි.
	(ii) මූදල් රෙගුලාසි 757(2)	සමාලෝචිත වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර අදාල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(ආ)	2003 ජූනි 02 දිනැති අංක පිරිඩි/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 වගන්තිය	භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගැනීමකින් තොරව කොමිෂන් සභා අනුමැතිය මත කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයින් බදවා ගැනීම සඳහා බදවා ගැනීම් පරිපාටියක් සකස් කර භාවිතා කර නිබුණි.
(ඉ)	2015 ජූනි 17 දිනැති අංක පිරිඩි 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 2.3 වගන්තිය	නිලධාරියෙකු සිය නිත්‍ය ආයතනයට අමතරව වෙනත් ආයතනයක සේවයේ නියැලෙන අවස්ථාවක දෙවන තනතුර සඳහා හිමි දිමනාවෙන් සියයට 50 ක් ගෙවිය යුතු වුවද, කොමිෂන් සභාවේ සභාපතිවරයාට දෙවන තනතුර සඳහා හිමි දිමනා ලෙස කොමිෂන් සභා නිරණයක් අනුව 2015 වර්ෂයේ ජූලි මාසයේ සිට රු. 100,000 බැගින් වූ සම්පූර්ණ දිමනාවම ගෙවා නිබුණි.
(ඊ)	1990 පෙබරවාරි 19 දිනැති ප්‍රතිපත්ති සැලසුම් සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ දීපිය	රාජ්‍ය සංස්ථා, රජයේ ආයතන, වෙළඳ ව්‍යාපාර සහ මිශ්‍රක සම්ගම්වල සියළු මෙහෙයුම් සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් නීතිගතවිය යුතු සම්බන්ධීකරණ යාන්ත්‍රණය විසින් ඇතුලත් යුතු බවට අමාත්‍යාංශ මට්ටමින්

කිරීමය කර නිබුණද, කොමිෂන් සභාව නීතිමය සේවාවන් ලබාගැනීම වෙනුවෙන් මුදල්ගලයන් වෙන සම්මතලෝචන වර්ෂය තුළදී රු. 1,349,408 ක් ගෙවා නිබුණි.

(උ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර වකුලේඛය

ස්ථාවර වත්කම් ලේඛනයේ අයිතමයන් වෙන වෙනම හඳුනාගන හැකිවන පරිදි විස්තර ඇතුලත් කර නොතිබුණි. එමෙන්ම දේපළ පිරියත හා උපකරණ යටතේ ඉඩම්වල වටිනාකම් රු.148,863,771 ක් ලෙස දක්වා තිබුණද එම ඉඩම් මොනවාද යන්න හා ඉඩම්වල වටිනාකම් වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන නොතිබුණි.

(ඌ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

(i) 2.8.4 වගන්තිය

කාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා අවම වශයෙන් එක් සාමාජිකයෙකු ගර්බීය අමාත්‍යාංශයෙන් හෝ ප්‍රසම්පාදන අස්තිත්වයෙන් බාහිර ප්‍රසම්පාදන විෂය සම්බන්ධයෙන් දැනුමක් ඇති අයකු සිටිය යුතු වුවත් අවස්ථා 06 කදී එකතුව රු.15,674,324 ක මිලදී ගැනීම් සඳහා පත්කර නිබූ කාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයින් නිලදනාම කොමිෂන් සභාවේ නිලධාරීන් විය.

(ii) 4.2.1 වගන්තිය

වසර 3ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මගහි ලැයිස්තු ගත කිරීම සහ ඊළඟ ඵළඹෙන වර්ෂය සඳහා ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතු වුවද කොමිෂන් සභාව එම ආකෘතියට අනුකූලව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම් පිළියෙල කර නොනිබුණි.

2.5 ප්‍රමාණවත් අයිකාර බලයකින් තොරව ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 මැයි 26 දිනැති කළමනාකරණ සේවා වක්‍රලේඛ අංක 39 හි විධිවිධාන අනුගමනය නොකර කොමිෂන් සභා නිර්ණ මත හා අභ්‍යන්තර වක්‍රලේඛවලට අනුගත වෙමින් කාර්යමණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා ගෙවල් කුලී දීමනා ගෙවා තිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා මෙසේ ගෙවා ඇති මුදල රු. 53.329.079 ක් විය.

(ආ) ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ 2007 ජූනි 01 දිනැති හා අංක එන්එස් සිසි/3/ඒබිසි/24 දරන ලිපියෙන් මාණ්ඩලික නොවන කාර්යය මණ්ඩලය සඳහා රු.2000 ක මාසික ප්‍රවාහන දීමනාවක් අනුමත කර තිබුණද, කොමිෂන් සභාව විසින් මාසිකව රු. 6,000 බැගින් වූ ප්‍රවාහන දීමනාවක් ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ගෙවා ඇති මුළු මුදල රු.18.756.408 ක් විය.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 54.613.961.089 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 47.215.344.134 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 7.398.616.955 ක වර්ධනයක් දක්නට ලැබුණි. බලපත්‍ර ගාස්තු ආදායම, වීසූලි සංදේශ බදු ආදායම් සහ වීසූලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම් රු. 9.516.861.172 කින් වැඩිවීම් ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ එකතු කළ අගයෙහි වැඩිවීම රු. 7.754.827.633 ක් වෙන්නුම් කළද සමාලෝචිත වර්ෂයේදී එකතු කර තිබුණු රු. 367.346.939 ක සංඛ්‍යාන පූර්ව ගාස්තුවල් (Frequency upfront) බලපෑම් හා රු. 21.167.983 ක ගනුදෙනුවල් නිල්බදු රාජිතවල් බලපෑම් ඉවත් කළ පසු සමාලෝචිත වර්ෂයේ එකතු කළ අගයෙහි වැඩිවීම රු. 7.366.312.711 ක් විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

කොමිෂන් සභාවේ ආදායම් හා වියදම් ඉකුත් වසර හා සැසඳීමෙදී සැලකිය යුතු වීචලනයන් නිරීක්ෂණය විය.

(අ) 2015 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී අනුපාතයේ සාමාන්‍යය සියයට 6.5 ක් වූ අතර 2016 වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී අනුපාතයේ සාමාන්‍යය සියයට 10 ක් වූයෙන් පසුගිය වසරට සාපේක්ෂව ස්ථාවර තැන්පතු මත පොලී ආදායම් සියයට 438 කින් වැඩි වී තිබුණි.

(ආ) පෞද්ගලික ආයතනයන් වෙතින් සංඛ්‍යාත සූර්ව ගාස්තු රු. 367,364,939 ක් අයකර ගැනීම හේතුවෙන් 2016 වර්ෂයේ සංඛ්‍යාත සූර්ව ගාස්තු සියයට 100 කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) පසුගිය වසරට සාපේක්ෂව ආර්ථික සමාජ වගකීම් වියදම් රු. 88,661,075 කින් වැඩිවීම හේතුවෙන් නියාමන වියදම් සියයට 68 කින් වැඩිවී තිබුණි.

(ඈ) කොකාවිල් ඇන්වනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණු හාවිතා කරන ක්‍රියාකරුවන් නිදහසකුගෙන් 2011 වර්ෂයේ සිට අයවිය යුතු රු.13,274,668 ක්වූ කල්බදු වාරික මුදල් ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ ගිණුම් ගනකිරීම් නිසා එම අගය සියයට 100 කින් ඉහළ ගොස් තිබුණි.

3.3 කොමිෂන් සභාවට එරෙහිව ආරම්භ කර ඇති අනෙකික සිද්ධි

බාහිර ආයතන 02 ක් විසින් සංඛ්‍යාත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හා කොන්ත්‍රාත් ගිවිසුම් කඩවීම මත කොමිෂන් සභාවෙන් එකතුව රු. 47,346,612,000 ක් වන්දි ලෙස ඉල්ලා නඩු පවරා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ණාවලි ආංශය විසින් සිදුකිරීමට සැලසුම් කර තිබූ අත්‍යාවශ්‍ය වැඩසටහන් 03 ක් හා නීති අංශය මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ සමාජීය අවශ්‍යතාවයක් ලෙස හඳුනාගත හැකි අන්තර්ජාල ළමා ආරක්ෂණ (Net Safe Child Protection) වැඩසටහන සඳහා රු. මිලියන 702.5 වෙන්කර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) අධිවේග අන්තර්ජාල ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා දුරකථන ක්‍රියාකාර සමාගම්වලට පහසුකම් සැපයීමේ ප්‍රගතිය සියයට 70 ක් විය. මෙහිදී එයලොග් සමාගම සඳහා පමණක් එය ක්‍රියාත්මක කළ බවත් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමේ SE-ME-WE-S භූගත මධ්‍යස්ථානය ඉදිකිරීම 2016 වර්ෂය තුළදී සම්පූර්ණ කර නොතිබුණ බවත් වාර්තා කර තිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතනවල සහය ලබාගනිමින් සිදුකළ යුතු විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සඳහා 2016 වර්ෂයේදී යෝජනා ලබාගැනීම පමණක් සිදුකර තිබුණි. නිලධාරීන් මාරු කිරීම හේතුවෙන් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීම 2017 වර්ෂයට කල් දමා ඇති බව වාර්තා කර තිබුණි.

(ඈ) බලපත්‍ර අංශය විසින් ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද සවිබල ගැන්වීමේ (E-Nable) තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධන වැඩසටහනේ ප්‍රගතිය සියයට 50 ක් පමණක් විය. නිලධාරීන් මාරු කිරීම හේතුවෙන් ඉතිරි කටයුතු 2017 වර්ෂයට කල් දැමූ බව කොමිෂන් සභාව විසින් දන්වා තිබුණි.

(ඉ) බලපත්‍ර අංශය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ ජාත්‍යන්තර විදුලි සංදේශ සංගමයේ ප්‍රවීනයන්ගේ සහයෝගිතා වැඩසටහන (ITU Expert Assistance Programme) 2015/2016 විදුලි සංදේශ පනතේ සංශෝධනයක් සිදුකිරීමට අවශ්‍යවීම හේතුවෙන් නොලැබුණු බව අධීක්ෂණ පතරාලුවෙයා විසින් දන්වා තිබුණි.

(ඊ) විදුලි සංදේශ කුළුණු ඉදිකිරීම සහ හවුලේ පරිහරණය කිරීමේ මාර්ගෝපදේශ සමාලෝචනය මාසයකට වරක් පැවැත්විය යුතු වුවත් 2016 වර්ෂය තුළදී රැස්වීම් දෙකක් පමණක් පවත්වා තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පත් ආපසු ලබාගැනීමේදී රු. 7.000.000.000 ක් වටිනාකමැති ස්ථාවර තැන්පත් 04 ක් කල්පිරීමට පෙර මහා භාණ්ඩාගාරයට මුදල් යැවීම සඳහා ලබාගෙන තිබුණු අතර එසේ කල්පිරීමට පෙර ලබා ගැනීම නිසා රු. 213.805.480 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22(උ) වගන්තිය යටතේ වූ නියමය පරිදි සහ 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය අනුව විදුලි සංදේශ ක්‍රියාකරුවන්ගෙන් ආයතන 03 ක් සෙස් ගාස්තු ගෙවා නොතිබුණි. මෙයින් එක් ආයතනයක් 2012 වර්ෂය සඳහාද තවත් ආයතනයක් 2015 හා 2016 වර්ෂ සඳහාද අනෙක් ආයතනය 2016 වර්ෂය සඳහාද සෙස් ගාස්තු ගෙවා නොතිබුණි. සෙස් බදු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන් සඳහා දඩ මුදලක් අයකිරීමේ අවශ්‍යතාවය වරින් වර පවත්වා දුන්නද එවැනි ක්‍රමවේදයක් සකස් කිරීම තම දක්වා සිදුකර නොතිබුණි.

4.3 **මෙහෙයුම් ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගුවන් විදුලි හා රූපවාහිනී සංඛ්‍යාත බලපත්‍ර භාවිතය පිරික්සුම් (Monitoring) කිරීම

(i) සංඛ්‍යාත බලපත්‍ර භාවිතය පරීක්ෂා කළ යුතු ආයතන නිරණය කිරීම, එම ආයතන පරීක්ෂා කිරීම, පරීක්ෂා කළ ආයතන සඳහා ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම, පොලිසියේ පැමිණිලි කිරීම, පැමිණිල්ල සඳහා සාක්ෂිකරු ලිඛිතයන් කටයුතු කිරීම් යන කරුණු එකතම නීලධාරියෙකු විසින් සිදු කිරීම නිසා සංඛ්‍යාත බලපත්‍ර පරීක්ෂා කිරීමේකටයුතු ප්‍රමාදවීම් අඩුවක් සිදුව තොතිබුණි.

නිවීම කිසිවකු විසින් සිදු කෙරේ නම් ඒ සඳහා 1996 අංක 27 දරන විදුලි සංදේශන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන විදුලි සංදේශ පනතේ 21 වගන්තිය අනුව කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබාගත යුතුය. අංක 1182/12 හා 2011 මැයි 03 දින දරන අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව යථෝක්ත බලපත්‍රය ලබා ගැනීමේ දී එහි සඳහන් ගාස්තු ගෙවිය යුතු බවට කොමිෂන් සභාව තීරණය කර තිබුණි.

එසේ වුවද බලපත්‍ර ලබා ගැනීමෙන් තොරව විවිධ ආයතන ව්‍යාපාරික කටයුතු වල නිරත වන බව අනාවරණය විය. එවැනි ව්‍යාපාරික කටයුතු වල නිරත වන ආයතන 90 ක නියදියකින් ආයතන 79 ක් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

(ii) 2014 ජනවාරි 01 දින සිට 2016 ඔක්තෝබර් 25 දින දක්වා කාල පරිච්ඡේදය තුල නිකුත් කරන ලද විකුණුම් කරුවන්ගේ බලපත්‍ර පිළිබඳ විස්තරවලට අනුව ආයතන 1,103 ක් සඳහන් වුවද එයින් ආයතන 274 ක බලපත්‍ර 2016 ඔක්තෝබර් 25 දින වන විටත් කල් ඉකුත් වී තිබුණි. බලපත්‍රලාභීන්ට නිසි වේලාවට බලපත්‍ර අළුත්කර ගැනීමට අදාල ලිපි යවා ඇති බව දන්වා තිබුණද බලපත්‍ර අළුත් කර නොගැනීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ව්‍යාජ දුරකථන, වෙළඳපොලට සැපයීම වැලැක්වීමේ අරමුණ ඇතිව විදුලි සංදේශ නියාමන කොමිෂන් මගින් පාලන උපකරණ අනන්‍යතා ලේඛනය (Control Equipment Identity Register) ස්ථාපිත කිරීමට 2013 වර්ෂයේදී තීරණය කර තිබුණද එය මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ ආදායම් බදු වගකීම් රු. 321,765,766 ක් වුවද වර්ෂය තුලදී කාර්තුමය ගෙවීම් කිසිවක් සිදුකර නොතිබුණි. තෙවන සහ සිව්වන කාර්තු සඳහා රු.මිලියන 125 බැගින් 2017 අප්‍රේල් 07 වන දින ප්‍රමාද වී ගෙවීම් සිදුකර තිබුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කාර්ය මණ්ඩල නිලධාරීන් හා ඔවුන්ගේ පවුල් සඳහා සිදුකළ සුභදා හමුව හා චාරිකාව වෙනුවෙන් පෞද්ගලික හෝටලයක නවාතැන් ගැනීම, ආහාර පාන හා වෙනත් වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 4,700,370 ක් කොමිෂන් සභා අරමුදලින් වැයකර තිබුණි.

(ආ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2(අ) විගන්තියට අනුව අවම වශයෙන් ප්‍රසිද්ධ එක් පුවත්පතක දැන්වීම් පලකිරීම ප්‍රමාණවත් වුවද කොමිෂන් සභාව විසින් කාර්යමණ්ඩල පුරප්පාඩු 70 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට අදාලව 2015 වර්ෂයේ ජූනි මාසයේදී රු. 4,213,694 ක් වැයකර පුවත්පත් 06 ක දැන්වීම් පලකර තිබුණි. කෙසේ වුවද මෙම තනතුරු සඳහා බඳවා ගැනීමද සිදුකර නොතිබුණි.

4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කොමිෂන් සභාවේ අරමුණුගත කාර්යයක් නොවන චිත්‍රපටයක් හා ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් පිළිවෙලින් රු. 32,191,906 ක් හා රු. 7,160,400 ක මුදලක් කොමිෂන් සභා අනුමැතිය මත 2015 වර්ෂයේදී වැයකර තිබුණි.

4.6 **ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

නෙළුම් කුළුණ ව්‍යාපෘතියට අදාලව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 මැයි 12 දින වන විට දින 912 කින් නිම කිරීමට නියමිත වූ මෙම ව්‍යාපෘතිය 2017 ඔක්තෝබර් 31 දක්වා නැවතත් දින 903 කින් දීර්ඝ කිරීමට කොමිෂන් සභා තීරණයක් ගෙන තිබුණි. 2017 දෙසැම්බර් 31 දින වනවිටත් ව්‍යාපෘතිය නිමකර නොතිබුණද ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරීම් හෝ ගිවිසුම් ප්‍රකාර ප්‍රමාද ගාස්තු අයකිරීම් සිදුකර නොතිබුණි.

(ආ) උපදේශන සේවා සැපයීම සඳහා වූ 2013 පෙබරවාරි 15 දිනැති මොරටුව විශ්ව විද්‍යාලය සමඟ වූ ගිවිසුම අනුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 1.5 ක්වූ රු.198.691.500 ක ස්ථාවර ගාස්තුවක් කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී තිබුණි. කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් දක්වා දිර්ඝවීම මත ඊට අමතරව මාසයකට රු. මිලියන 3 බැගින් උපරිමය රු. මිලියන 72 ක් දක්වා මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවීමට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව එකඟවී 2017 ජූලි දක්වා රු. මිලියන 66 ක් ගෙවා තිබුණි.

(ඇ) නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ජාතික වැදගත්කමක් සහිත ව්‍යාපෘතියක් ලේ සලකා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කුළුණ ඉදිකිරීමට තෝරාගත් ඉඩම සඳහා දැනට වැයකර ඇති පිරිවැය පමණක් අයකර ගැනීමේ පදනම මත එම ඉඩම එකී අධිකාරිය විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත පවරා දිය යුතු බවට 2011 දෙසැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩලය මඟින් තීරණය කර තිබුණද මේතෙක් එම ඉඩම පවරා ගෙන නොතිබුණි. එසේ වුවද අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව කොමිෂන් සභාව විසින් එම අධිකාරියට ඉඩමේ වටිනාකම වශයෙන් රු. මිලියන 11,612 ක් වසර 34 කින් ගෙවීමට එකඟ වී තිබුණ අතර 2015 දෙසැම්බර් 31 දින වන විට මේ වෙනුවෙන් රු. මිලියන 2,250 ක් ගෙවා තිබුණි.

(ඈ) 2016 ජූනි 23 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද අංක 9 නියෝගය අනුව ආයතනය ණයක් ලබා නොගෙන ආයතනයේ මුදල් වලින් මෙම ඉදිකිරීම සිදු කලේ නම් ලැබෙන ප්‍රතිලාභය යනාදි කරුණු ඇතුලත් වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත එවීමට නියෝග කළද එය ඉදිරිපත් කර නොතිබුණි. 2016 ජූනි 23 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නෙළුම් කුළුණ ඉදි කිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකළ යුතු බව අවධාරණය කළ ද මෙතෙක් එය සිදුකර නොතිබුණි.

(ඉ) ව්‍යාපෘතිය සඳහා වාහන නවතා තැබීමේ පහසුකම් සැලසුම් කිරීම් අත්‍යාවශ්‍ය කරුණක් වුවත් එම යටිතල පහසුකම සකස් කිරීමට පළමු අදියරේදී සැලසුම් කර නොතිබුණි. වාහන නවතා තැබීමේ පහසුකම් පළමු අදියරේදීම ක්‍රියාත්මක නොකිරීම නිසාවෙන් ඉපයිය හැකි ආදායම අහිමි වී යාමෙන් සිදු වනු ඇතැයි නිරීක්ෂණය කෙරේ

4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 292 ක් වුවද තථ්‍ය සංඛ්‍යාව 207 ක් විය. මෙහිදී පුරප්පාඩු සංඛ්‍යාව 89 ක් හා අතිරික්ත සංඛ්‍යාව 04 ක් විය. අනුමත කාර්ය මණ්ඩලයේ සහ අනුමත බඳවා ගැනීම් පරිපාටියේ සංශෝධන සිදුකිරීමේ කටයුතු මෙතෙක් නිමකර නොනිබුණ අතර අත්‍යවශ්‍ය සේවා සඳහා බඳවා ගැනීම් සිදුකර නොනිබුණි.

(ආ) සහකාර ගණකාධිකාරී තනතුර අනුමත තනතුරක් නොවුවිද කොමිෂන් සභා තීරණය මත ස්ථිර පදනම් මත සහකාර ගණකාධිකාරිවරුන් දෙදෙනෙකු 2015 ජනවාරි 01 දින බඳවා ගෙන නිබුණි. ඊට අමතරව කාර්යාල කාර්ය සහායක දෙදෙනෙකුගේ අතිරික්තයක් විය.

(ඇ) අතිරේක/ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 03 ක් ඇතුළුව නිත්‍ය කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු කර නොනිබූ අතර ද්විතියික පදනම් මත නිලධාරීන් 12 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනම් මත නිලධාරීන් 07 දෙනෙකු 2016 දෙසැම්බර් 31 වන විට සේවයේ යොදවා නිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 ගිණුම් ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීපීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ට අනුව මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නිබුණේ 2017 අගෝස්තු 10 දින දිය. කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඒ සමඟ ඉදිරිපත් කර නොනිබුණි.

5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2014 හා 2015 වර්ෂවල වාර්ෂික වාර්තා 2017 සැප්තැම්බර් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොනිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්මට අනුව මිලදී ගැනීමට සැලසුම් කර තිබූ රු.7.375.000 ක් වටිනා භාණ්ඩ අයිතම 13 ක් මිලදිගෙන නොතිබුණි. භාණ්ඩයේ මිල හා සැබෑ අවශ්‍යතාවය නැවත සලකා බලා අත්‍යවශ්‍ය භාණ්ඩ පමණක් මිලදී ගෙන ඇති බව කොමිෂන්සභේ අධ්‍යක්ෂ ජනරාල්වරයා දන්වා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ මූල්‍ය අංශය පරිගණක ගත කිරීම සඳහා රු.10.000.000 ක් හා ප්‍රධාන කාර්යාලයේ නවීකරණ කටයුතු සඳහා රු. 954.000.000 ක් වෙන් කර තිබුණද එම කාර්යයන් සිදු කර නොතිබුණි.

(ඇ) ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් නොවූ රු.10.346.157 ක් වටිනා භාණ්ඩ අයිතම 39 ක් මිලදී ගෙන තිබුණ අතර අවස්ථා 03 කදී වටිනාකම රු. 3.579.867 ක් වූ අයිතම 25 ක් ඇස්තමේන්තු ගත වටිනාකම ඉක්මවා මිලදී ගැනීම් සිදුකර තිබුණි.

5.4 අයවැය ලේඛනමය පාලනය

කොමිෂන් සභාව විසින් 2015 දෙසැම්බර් 29 දින අනුමත කර තිබුණු සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛනයේ අයවැයගත හා කථා අගයන් අතර සියයට 11 සිට සියයට 221 දක්වා ධන විචලනයන් ද සියයට 7 සිට සියයට 356 දක්වා සෘණ විචලනයන් ද නිරීක්ෂණය විය. තවද අවස්ථා 11 කදී වටිනාකම රු. මිලියන 35 ක් අයවැය ලේඛන ප්‍රතිපාදන නොමැතිව වැයකර තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

6. පද්ධති හා පාලනයන්

නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ සභාපති වෙත වාර්තා කළ අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

පද්ධති හා පාලන ක්ෂේත්‍රය	නිරීක්ෂණ
(අ) ණය පාලනය	දීර්ඝ කාලීනව පරිශේෂ්‍ය වූ ණය අයිති පැවරීම් හා ණය අයකර ගැනීම් ත්‍රිවිල්ල කෙන්ත්‍රීයකව පැවරීම්.

(අ)	ආදායම් පාලනය	ආදායම් එකතු කර ගැනීම සඳහා ප්‍රමාණවත් හිඟ ප්‍රතිපාදන අනුමත කරගෙන තිබීම.
(ඇ)	දීමනා ගෙවීම්	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව කොමිෂන් සභා නිරණ මත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා නිවාස කුලී දීමනා ගෙවීම.
(ඇ)	කොන්ත්‍රාත් පාලනය	නෙළුම් කුළුණ ඉදිකිරීම් කටයුතු නියමිත දිනට සිදු නොකිරීම.

එච්.එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

www.trc.gov.lk | dgtsl@trc.gov.lk

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව
276, ඇල්විටිගල මාවත, කොළඹ 08, ශ්‍රී ලංකාව
දූ: +94 11 268 9345 | 2689351 | 2689352 | ෆැ: +94 11 268 9341